FM 104.4,105.7
ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ ගුවන් විදුලි නාලිකාව
"රංගිරි ශ්‍රී ලංකා"
සැබෑ මාධ්‍ය සංස්කෘතියක පෙර ගමන්කරු

# රංගිරි ශ්‍රී ලංකා

## RANGIRI SRI LANKA NEWSPAPER




FM 104.4,105.7
ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ ගුවන් විදුලි නාලිකාව
"රංගිරි ශ්‍රී ලංකා"
සැබෑ මාධ්‍ය සංස්කෘතියක පෙර ගමන්කරු

ශ්‍රී.බු.ව. 2564- ක්‍රි.ව. 2021
අප්‍රේල් (බක්)

මාසික බෞද්ධ සාර සංග්‍රහය - අන්තර්ජාල කලාපය

29









රංගිරි දඹුලු විහාරය

**රංගිරි ශ්‍රී ලංකා රූපවාහිනිය**

UHF CH 60
PEO TV CH 22
Dialog Tv 21
Dish Tv 2532

RSL TELEVISION

**රංගිරි ශ්‍රී ලංකා ගුවන් විදුලිය දේශයේ රන් හඬ**

RSL RADIO

FM 104.4 - 105.7

වෙබ් : www.rangirisrilanka.lk

රංගිරි දඹුල්ල සංවර්ධන පදනමේ ප්‍රකාශනයකි.



# බක් පෝය වර්ණනාව

බක් මාසය උදාවීමත් සමගම ජනතා හදවත් තුළ ඇති වන්නේ සොම්නසකි. ප්‍රීතියකි.එයට හේතුවන්නේ අවට පරිසරයේ ඇති සුන්දරත්වයත් ධාන්‍ය වර්ගයන් තම නිවසට ලඟාකර ගැනීමෙන් ලබන ආමිස සතුටත්ය. ලෝකවාසී බෞද්ධ ජනතාවට බක් පෝය ආගමික වශයෙන් ඉතා වැදගත් තැනක් ගනී. එයට හේතුව ශාසනික වශයෙන් කරුණු කිහිපයක් මෙම පොහෝ දිනයේදී සිදුවීමයි. බුදුරජාණන් වහන්සේගේ දෙවනවර ලංකාගමනය සිදුවන්නේ බක් පොහෝ දිනකය. නාගදීපයේ වාසයකළ චුල්ලෝදර, මහෝදර යන දෙදෙනා අතර ඇති වූ ගැටුමක් සංසිඳවීම මූලික අරමුණ විය. චුලෝදරගේ සීයා කළුරිය කරනවිට තමා සතුව තිබූ වටිනා මැණික් ඔබ්බවා කරවූ පුටුව පුතාට නොදී චුලෝදරගේ මව වන දියණියට පවරාදීම නිසා මෙම අරගලය ඇති විය. මහාමිනිස් ඝාතනයක් සිදුවීමට යන බව දැනගත් බුදුරජාණන් වහන්සේ එම ස්ථානයට වැඩමවා දෙපාර්ශවයම සමගි කරවූ සේක.

එයින් පසු දෙපිරිසම කැමැත්තෙන් මැණික් පුටුව බුදුරජාණන් වහන්සේට පූජා කළහ. මණිඅක්ඛිත නාරජුගේ ආරාධනයෙන් කැළණියට වැඩම කළ සේක. නාගදීපයත්, කැළණි විහාරයත්,සොළොස්මස්ථාන බවට පත්වන්නේද එම ස්ථානවලට බුදුරජාණන් වහන්සේ වැඩම කළ නිසාමය. එම ස්ථානවලට සමාධි සුවයෙන් බුදුරජාණන් වහන්සේ වැඩ සිටිබව ශාසන ඉතිහාසයේ සඳහන් වෙයි. සිදුහත් බෝසතාණෝ උයන් ක්‍රීඩාවට යන පළමු දිනයේදී මහලු රූපයක් දුටුවේද බක් පොහෝ දිනකය.

සුද්ධෝදන පිය රජුගේ ආරාධනාවෙන් කිඹුල්වත්පුරයට වැඩම කරවීම ආරම්භ කරන්නේ මැදින් පොහෝ දිනක වුවත් එම ගමන අවසන් වන්නේ බක් පොහෝදාකය. යොදුන් හැටක් ගෙවීමට (ගමන් කිරීමට) මාස දෙකක් ගතවිය. සතර පෙර නිමිති වලින් පළමුවැන්න වූ මහල්ලෙක් දැකීම සිදු වී ඇත්තේද බක් පොහෝ දිනකය. මෙය ශාසනික ජනතාවට වැදගත් දිනයක් වන්නේය. ලාංකික බෞද්ධ ජනතාව මෙම පොහෝ දිනයේදී විහාරස්ථාන වෙත ගොස් ආමිස මෙන්ම ප්‍රතිපත්ති පූජාවන්හිද යෙදේ.

ඇම්.ඩී.විජයවර්ධන

## පුදබිමක අසිරිය

# මාතලේ අළුවිහාරය

ශ්‍රී ලංකාවේ ඓතිහාසික සිද්ධීන් රාශියකට උරුමකම් කියන මාතලේ ප්‍රදේශයේ අළුවිහාර ග්‍රාමයේ පිහිටි අළුවිහාර රජමහා විහාරය ශාසනික වශයෙන් ඉතා වැදගත් තැනක් ගන්නා පුදබිමකි. දඹුල්ල සිට මහනුවර මහා මාර්ගයට යාබදව මෙම ස්ථානය ගල් තලාවක් මත පිහිටා තිබීම විශේෂත්වයකි. මෙහි ලෙන් කිහිපයක් දක්නට ලැබේ. අළුලෙන, ආලෝක ලෙන යන විශේෂ නාමයන්ගෙන් හැඳින්වේ.



පුරාවිද්‍යාත්මක සාධක අනුව දෙවනපෑතිස් රජ සමයේ බුදුදහම ව්‍යාප්තවීමත් සමග මෙම ලෙන් විහාරස්ථානයක් බවට පත් වූ බවට සාධක තිබේ. ලෙන් සංඝාවාස බවට පත්වීමෙන් පසු මෙම ස්ථානයේ අටුවාචාරීන් වහන්සේලා වාසය කළ බව ඓතිහාසික ග්‍රන්ථවල (ශාසනික කථාව) සඳහන් වෙයි. අටුවාචාරීන් මෙම ලෙන්වල වාසයකළ නිසා ශක්‍රදේවේන්ද්‍රයා මෙම ලෙන්වලට ''ආලෝක ලෙන'' නාමය භාවිත කළ බවට ජනප්‍රවාදයන්හි සඳහන්වේ. කටාරම් කෙටූ ලෙන් වර්තමානයේද දක්නට ලැබේ.මෙරට පාලනයකළ වලගම්බා රජතුමා අභියෝගයන්ට මුහුණ දීමෙන් පසු බුදුදහමේ අභිවෘද්ධියට සේවාවන් රැසක් සිදුකර තිබේ. මෙම කාලයේ ඇති වූ බැමිණිතියාසා සාගත නිසා භික්ෂූන් වහන්සේලා වනගත වූහ.

මෙතෙක් කාලයක් මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන එනලද ත්‍රිපියක් ධර්මය විනාශවීමට ඉඩ නොදී රැකගැනීම පිණිස ධර්මධර භික්ෂූන් වහන්සේලා රැස්කරවා ආලෝක ලෙන තුළ (අළු විහාරය) ත්‍රිපිට ධර්මය ග්‍රන්ථාරූඪ කළ බව ''මහාවංශය, පූජාවලිය, රාජාවලිය, අස්ගිරි තල්පත වැනි ඓතිහාසික ග්‍රන්ථ සාක්ෂි දරයි. පෞරාණිකත්වය එලෙසින්ම ආරක්ෂා කරමින් මෙම අළුවිහාරය වර්තමානය වනවිට විශාල සංවර්ධනයකට යොමු වී තිබීම බෞද්ධ ජනතාවගේ පැසසුමට හේතු වී තිබේ. කුඩාගල් පර්වතයක් මත පිහිටා ඇති මෙම ලෙන් විහාරය දෙස්, විදේස් සංචාරකයන්ගේ සිත් දිනා ගැනීමටද සමත් වී තිබේ. විශේෂයෙන් සඳහන් කිරීමට පුළුවන. මෙවැනි පෞරාණික පුණ්‍ය භූමි ආරක්ෂා කිරීමත් සංවර්ධනය කිරීමත් බෞද්ධ අප සැමගේ යුතුකම මෙන්ම වගකීමද වන්නේය.

විජය තලවත්තේගෙදර



# සිරිලක බොදු සුවඳට

# බක් පොහොය

බක් මාසය මුළු මහත් ලක්වැසියාටම සිත් පිනවන නෙත් සනසන හැගුම්බර මාසයකි. අප්‍රේල් මාසය තුළ එළඹෙන්නේ බක් පොහොයයි. ශ්‍රී ලංකා ද්වීපය දෙවන වරටත් බුදු සිරිපා පහසින් පිවිතුරු බවට පත්වූයේත් එම දම් රදාණන්ගේ සවනක් රැස් කදින් මුළු හෙලදිව ආලෝකවත් වූයේත් දහම් අමා මිහිරෙන් නොයෙක් දනා නිවී සැනහී ගියේත් බක් මාසයේය.

බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර දෙව්රම් වෙහෙර වැඩ වසමින් ලක්දිව චූලෝදර මහෝදර නා රජුන්ගේ මිණිපළඟ නිසා ඇතිවූ යුද්ධය වැළැක්වීමට වෙහෙර දොරටුවේ කිරිපළු රුකෙහි සිටි දෙවියා සමඟ ඍද්ධියෙන් නාගදීපයට වැඩි සේක.

බුද්ධත්වයෙන් පස්වෙනි වර්ෂයේ සිදුවූ මේ සිද්ධිය බෞද්ධ ලක්වැසියාට ඉතා වැදගත් සිහිවටනයකි. එදා ඒ මිණි පළඟ බුදුන්ට පුදනු ලැබීය. මණි අක්ඛිත නාග රාජයා බුදුන් වහන්සේට වඩින ලෙස ආරාධනා කළේත් මේ දිනයෙහිම බව සඳහන් වේ.

මෙම චූලෝදර මහෝදර යන නා රජුන් දෙදෙනා ඥාතීකමින් මාමයි බෑණයි වශයෙනුත් සඳහන් වන්නේ. පාලි භාෂාවෙන් උදර යනුවෙන් සඳහන් වන්නේ බඩටයි. මහා යනු විශාල බවද චූල යනු කුඩා බවද අර්ථවත් වේ. එනම් කුඩා බඩ සහ මහ බඩ යන නම් වලින් අර්ථවත් වූ මෙම නාග ගෝත්‍රිකයින්ගේ පාලන බල ප්‍රදේශය විශාල ප්‍රදේශයක පැතිරී තිබුණු බව සඳහන් වේ.

මහා බලසම්පන්න මහෝදර නාගරාජ තෙමේ මුහුදේ පන්සියයක් යොදුන් නාග භවනයෙහි අධිපති කම් කරමින් සිටියේය. ඔහුගේ සහෝදරී කන්වඩමන් නම් පර්වතයෙහි නා රජු හට පාවා දෙනු ලැබුවාය. ඒ දෙදෙනාට ලැබුණු පුත්‍රයා චූලෝදර නම් විය. ගොඩ වැසි නාගයෝත් මුහුද වැසි නාගයෝත් මෙන් මහා බල සම්පන්නයෝ වූහ. චූලෝදරගේ සීයා කළුරිය කරන කල්හි තමා සතුව තිබුණු ඉතා වටිනා මැණික් පුටුව පුතාට නොදී චූලෝදරගේ මව වන දියණියන් හට දුන්නේය.

මාමා සහ බෑණා එනම් චූලෝදර මහෝදර යන නා රජුන්දෙදෙනා අතර යුද්ධයට හේතු වූයේ මිණි පළඟය. බුදුරජාණන් වහන්සේගේ මේ ගමනට දෙව්රම් දොරටුවේ කිරිපලු රුක අරක් ගෙන සිටි සමිද්ධි සුමන නම් දෙවියාද කැඳවූ සේක. ඒ දෙව් රද තමාගේ භවනය වූ කිරිපලු රුක උදුරා තථාගතයන් වහන්සේට ඡත්‍රයක් මෙන් අල්ලාගෙන තමා පෙර භවයේ විසූ ස්ථානය වන නාගදීපයට පැමිණියේය. සමිද්ධි සුමන දිව්‍යරාජයා දෙව්රම් වෙහෙරේ දොරටුවේ කිරිපලු රුක අධිගෘහිත දේවතා වන්නට පෙර ජාතියේ නාගදීපයේ මනුෂ්‍යයෙකුව ඉපිද සිටියේය. එකල කිරිපලු වෘක්ෂයක් යට වැඩසිටි දන් වළඳන පසේ බුදුවරයන් වහන්සේලා දැක උන්වහන්සේලාට පාත්‍ර පිරිසිදු කරගන්නට කොළ කඩා දුන් පින් බලේ මිනිස් තෙමේ දෙව්රම් වෙහෙරේ කිරිපලු රුකෙහි දෙවියෙකුව උපන්නේය.

මහා වංශයට අනුව අපට ඉහත කතා ප්‍රවෘත්තිය දැක්වීමට පුළුවන. මෙම චූලෝදර මහෝදර යුධ ගැටුම සංසිඳවීම සඳහා බුදුරජාණන් වහන්සේ නාගදීපයට වැඩම කොට අහසෙහි සිට එම යුධබිමට වැද සිට දෙපසෙහි නාගයන් බිය ගන්වනු සඳහා මහත් ගන අඳුරක් මැවූහ.

නාගයන් බියෙන් හැකිලී සිට ආලෝකයක් මවා සොම්නසට හා සැනසීමට පත් නාගයෝ සර්වඥයන් වහන්සේ දැක බුදු සිරිපා කමල් වැන්දාහ.

ලෝක නාථයන් වහන්සේ චූලෝදර මහෝදර නා රජුන් දෙදෙනා ප්‍රමුඛ දෙපක්ෂයේ පිරිස සමඟි කරවීමට සමත් ධර්මයක් ඔවුනට දේශනා කළහ. සසර ආදීනව, මක්ඛ පලාසාදීන්ගේ ආදීනව, කාකොලූක ජාතකය, එන්දක ජාතකය, ලටුකික ජාතකය, වට්ටක ජාතකය, යන මේවායින් වෛර කිරීමෙහි ඇති දෝෂයන් හා සමගි බවේ අනුසස්ද ප්‍රකාශ කරමින් බුදුන් වහන්සේ අවවාද දුන් සේක.

පසුව යුධ වැදි සිටි නාරජුන් දෙදෙනා ධර්ම කතා ශ්‍රවණයෙන් අපමණ ප්‍රීතියට පත්ව යුද්ධයට හේතු වූ මිණි පළඟ තථාගතයන් වහන්සේට පිදූහ. අහසින් බැස එහි වැඩ හුන් සර්වඥයන් වහන්සේ නාගයන් විසින් පිළිගන්වන ලද දිව්‍ය ආහාර පාන වළඳා අවසන අසූ කෝටියක් නාගයන් තිසරණ පන්සිල්හි පිහිටුවා පාරිභෝගික චෛත්‍යයක් වශයෙන් වැඳුම් පිදුම් කරනු පිණිස කිරිපලු රුක හා මිණි පළඟ නාගයන්ට පවරා දී සැවැත් නුවර දෙව්රම් වෙහෙරට පෙරළා වැඩියහ.

තවද බක් පොහෝ දිනය තුළ සිදුවූ විශේෂ සිදුවීමක් ලෙස සිද්ධාර්ථ කුමාරයට සතර පෙර නිමිති පහළ වීමද දැක්විය හැකිය.

විසිනව වසක් සපිරි සිදුහත් මහ බෝසතාණන් වහන්සේ උයන් ක්‍රීඩාව සඳහා පොහෝ දින ගමන් කරද්දී පළමු කොට ජරා (මහලු) රූපය දැක ඇත්තේ බක්මහ පුන් පොහෝ දිනයකය. ඊට අමතරව බුදුරජාණන් වහන්සේගේ කිඹුල්වත් පුරය බලා මැදින් පුන් පොහෝදා ගමන් අරඹා පිළිවෙලින් පියවි සිහියෙන් ගමනින් යොදුන් තිහක් ගමන් මාර්ගය අවසන් කිරීම සිදුවූයේ බක්මහ පුර පසළොස්වක පොහොය දිනයකය.

ඓතිහාසික වශයෙන් ලක්වැසියාට වැදගත් මෙම සිදුවීම් මාලාව තුළින් අවුරුදු දෙදහස් ගණනකට පෙර ලංකාවේ සිදුවූ ඓතිහාසික, පෞරාණික, ශාසනික පුරාවෘත්තයන් අපට සිහිපත් කරවනුඇත. මෙබඳු ඓතිහාසික සිද්ධියකින් ශ්‍රේෂ්ඨත්වයට පත් බක් පොහොය බෞද්ධයින්ට මහත් ප්‍රීතියක් උපදවන දිනයකි. විශේෂයෙන් චූලෝදර මහෝදර නා රජුන් යුද්ධ කොට බෙදා ගැනීමට ගිය මැණික් පුටුව කැළණි චෛත්‍යයේ නිධන් කර ඇති බව වංශකතා ඇසුරින් පැහැදිළි වෙයි.

ඒ අනුව බක් පොහොය තුළ ලක්වැසියාට වන්දනා මාන කිරීමට ඇති පූජනීයම වස්තුවක් ලෙස කැළණි චෛත්‍ය නම් කළ හැකිය. ලක්වැසියාට පමණක් සීමා නොවූ මළු මහත් ලෝක වැසියාගේම මුදුන් මල්කඩක් බඳු කැළණි දාගැබ ධාන්‍යාකාරයෙන් නිර්මිත උත්කෘෂ්ඨ කලා නිර්මාණයකි.

"උපන්දා සිට කරපු පව් නැත වරක් වැන්දොත් කැලණියේ............"

යන පාඨය පවා ව්‍යවහාරයේ පවතින්නේ ඒ තරමටම පින් උපදවන උල්පතක් හැටියට කැළණි දාගැබ තුළින් හමන බුදු දහමේ සඳහම් පණිවුඩය මිනිස් හදවතට සමීප වන බැවිනි. හෙළ කලාකරුවාගේ සුවිශේෂී නිර්මාණයක් හැටියටත් දුර්ලභ ගණයේ ස්තූපයක් හැටියටත් කැළණි දාගැබ සුප්‍රකටය.

ලක්වැසි බැතිමතුන්ගේ මුදුන් මල්කඩක් බදු කැළණි දාගැබ වන්දනා මාන කිරීම පිණිස නොයෙක් බැතිමතුන් දිනපතා පැමිණෙනු ඇත. එයින් හමනා සදහම් සිසිල දුකට පත් සැමගේ සිත් සතන් සුවපත් කරනු ඇත. සිත් සතන් අවුල් වූ ඕනෑම කෙනෙක් කැළණි ස්තූපය ලඟට යන්නේ නම් සිතට කියා නිම කළ නොහැකි සහනයක් දැනෙනවාට කිසිදු සැකයක් නැත.

ඓතිහාසික වශයෙන් වටිනාකමකින් යුත් මෙම සිදුවීම තුළින් අපේ පැරණි ශිෂ්ඨාචාරය, සංස්කෘතිය පිළිබඳ කරුණු අනාවරණය වේ. එවකට සිටි මෙම නාග ගෝත්‍රිකයින් මනුෂ්‍ය කොටසක් වූ අතර ඔවුන් අතර සුළු සුළු අඩුපාඩුකම් තිබුණු බවද සඳහන් වේ. ඔවුන් යුද්ධයකට අවතීර්ණ වූයේද එම හේතුවෙන් බව අපට විශ්වාස කළ හැකිය.

එසේ වුවද ඔවුන් තුළ තිබුණු උසස් ගුණධර්ම ඉස්මතු වීමට බුදුරජාණන් වහන්සේට හැකිවිය.

බුදුරජාණන් වහන්සේගේ ලංකාගමනය තුළින් ධර්මය ස්ථාපිත නොවන්නට ඇත්තේද එවකට ජීවත්වූ ලක්වැසියාගේ නොදියුණුකම හේතුවෙන් බව සිතිය හැකි කරුණකි.

එසේ වුවද මේ උතුම් බක් අව අමාවක් පොහෝ දිනය ලක්වැසියන් වන අප සැමදෙනාටම ඒ ඓතිහාසික සිදුවීම් සිහියට ගෙන ගුණධර්ම අතින් පෝෂිත උසස් මනුෂ්‍ය චර්යාවන්ගෙන් සැදුම් ලත් පිරිසක් වීමට පුළුවන් කමක් ඇත. ඒ උතුම් බක් පොහෝ දිනය තුළ අපි ශ්‍රේෂ්ඨ මිනිසුන් වීමට අධිෂ්ඨාන කර ගනිමු.

අවුලේගම රණවනයාගම/බමුණුගෙදර ශ්‍රී සඳහම් සෙවන බෞද්ධ මධ්‍යස්ථානාධිපති කොබෙයිගනේ පුබ්බිලිය ශ්‍රී සාරානන්ද පිරිවෙන් නියෝජ්‍ය පරිවේනාධිපති පූජ්‍ය ගලගෙදර රතනවංශ හිමි

# අවුරුදු චාරිත්‍රවල විද්‍යමාන වන විද්‍යාත්මක අගයන්



විශ්‍රාමලත් සහකාර සංස්කෘතික අධ්‍යක්ෂක ඩී.එම්.එච්. කරුණාරත්න මහත්මාගේ අභාවයෙන් පසු උපහාර පිණිස පලකෙරේ

සංස්කෘතික ජාතික හා ආගමික වශයෙන් අනන්‍යතාවයක් පිළිබිඹු කරන බක් මහ උළෙල ශ්‍රී ලංකාවේ පැවැත්වෙන ප්‍රමුඛ පෙළේ උත්සව අතරින් ප්‍රධානතම එකකි. සිංහල - හින්දු අලුත් අවුරුද්ද සූර්‍ය මංගල්‍යය, වසන්ත සැණකෙළිය යනුවෙන්ද ජනශ්‍රැතියේ හඳුන්වා දී ඇත.

සූර්‍ය මේෂ රාශියෙන් ආරම්භ කළ අළුත් වර්ෂයක ගමන මීන රාශියෙන් නිමාකර අලුත් වර්ෂයක් මේෂ රාශියෙන් යළිත් ආරම්භ කෙරෙන අවස්ථාව නිමිති කොටගෙන පැවැත්වෙන උත්සවය සූර්‍ය මංගල්‍යය යනුවෙන් අර්ථකතනය කළ හැක. එසේ වුවද අභිනව චන්ද්‍ර වර්ෂය සඳහාත් සූර්‍ය වර්ෂය සඳහාත් "නව සඳ බැලීම" අලුත් අවුරුදු චාරිත්‍ර අතර මුලින්ම සඳහන් වනු හෙයින් චන්ද්‍රයාත්, සූර්‍යත් මුල් කරගනිමින් බක්මහ උළෙල පැවැත්වෙන බව කරුණු විමසා බැලීමේදී පෙනීයයි.

පෘථිවි ජීවින්ගේ පැවැත්මට ආධාර උපකාරී වන්නාවූ හිරු - සඳ තේමා කොටගත් බක් මහ උළෙල හෙළයේ අනාදිමත් කාලයක පටන් ප්‍රසිද්ධියට පත්ව ඇත්තේ "බක්මහ උළෙල" නමිනි. සීගිරි කැටපත් පවුරේ ඇති ගීතිකා අතර නව බක් සඳ බැලීම පිළිබඳව සඳහන් වන ගීයෙන් බක්මහ උළෙලේ එක් වැදගත් චාරිත්‍රයක් පිළිබඳ කියැවෙන හෙයින් බක් මහේ හෙවත් භාග්‍යවන්ත මාසයේ පැවැත්වෙන උළෙලේ නව සඳ දැකීම සුවිශේෂී වූ චාරිත්‍රයක් වූ බව පෙනේ.

මෙහිදී බක්මහ උළෙල හෙවත් සිංහල - හින්දු අලුත් අවුරුද්ද හා අත්‍යයන්තයෙන් බැඳී පවත්නාවූ චාරිත්‍ර විධිවල විද්‍යාමාන වන ආගමික හා ආචාර විද්‍යාත්මක හරයන් පිළිබඳ තුලනාත්මක විග්‍රහයක් කිරීම සුදුසු යැයි හැඟේ.

බක් මාසය යනු අවුරුද්දක සාරවත්ම පාරිසරික නැවුම් බවක් ගන්නා වූ මාසයකි. කොළ හැලී තිබූ ගස්වැල් ආදිය නව දළු දමා අළුත් ඵල බරින් සමන්විත වන වකවානුව මෙයයි. බුදු සිරිත හා සම්බන්ධ වන බෞද්ධ සාහිත්‍යයේ එන කාළුදායී ඇමතිවරයා බුදුරජාණන් වහන්සේට කිඹුල්වත්පුර නුවරට වඩින්නට ආරාධනා කරන ලද්දේ ද මෙම මාසයේ යයි කල්පනා කළ හැක. එහිදි කාළුදායී ඇමතිවරයා "ගස්හු කොළ හලා අගුරුවන් පැහැයෙන් දළු දමා ගෙඩි බලාපොරොත්තුවෙන් සිටිති. එය හරියටම ඔබ වහන්සේ නැමැති ඵලය කිඹුල්වත නැමැති මහා වෘක්ෂය බලා සිටින්නාක් සේය" ආදී වශයෙන් මනරම් පරිසර වර්ණනාවක් කරයි. මේ පිළිබඳ සිය අවධානය යොමු කළ බුදුරජාණන් වහන්සේ කිඹුල්වතට වැඩි සේක.

සිංහල - හින්දු අලුත් අවුරුද්ද යනුවෙන් ව්‍යවහාර කිරීමෙන් පෙනී යන්නේ ඈත ඉතිහාසයක සිට සිංහල හා දෙමළ හෙවත් බෞද්ධ හා හින්දු ආගම් අනෝන්‍ය සුහදශීලී භාවයකින් කටයුතු කර ඇති බවකි.

ඒ අනුව ඔවුන්ගේ ප්‍රධාන සංස්කෘතික මංගල්‍යයක් බවට බක්මහ උළෙල පත්ව තිබුණි. සිංහල දෙමළ යන ජන කොට්ඨාශ දෙකම එක්වී බක්මහේ ජාතික ආගමික සහජීවනය ධ්වනිත කරවන්නාක් බවට මේ අනුව අවුරුදු උළෙල පත්වී ඇත.

සූර්‍ය මංගල්‍යය යනුවෙන් හඳුන්වනු ලබන බක්මහ උළෙලේ අන්තර්ගතය ග්‍රහලෝක පිළිබඳ හා බැඳී පවතී. එනම් සූර්‍යා මීන රාශියෙන් මේෂ රාශියට මාරුවීම මෙහි පදනමයි. තාරකා විද්‍යාවට අයත් මෙය මූලික ඉගැන්වීමකි.

බුදුරජාණන් වහන්සේ ද තාරකා ග්‍රහලෝක පිළිබඳව අනාගත වංශ දේශනාවේදී කරුණු දක්වා ඇත. එහිදී සෞරග්‍රහ මණ්ඩලය හා මන්දාකිණිය පිළිබඳව විස්තර දක්වා ඇති අතර එය "ස්පන්දමාන විශ්ව මතය" ලෙස ඇමරිකානු විද්‍යාඥයෝ හඳුන්වති. බුදුරජාණන් වහන්සේ චූලනිකා ලෝකධාතු, මජ්ඣිමනිකා ලෝකධාතුව හා ලෝක ධාතු ආදී බාහිර ලෝකය පිළිබඳ කර ඇති විග්‍රහයන්ගෙන් ග්‍රහ තාරකා ගැන පළකොට ඇති අදහස් බොහෝය.

බක් මහ උළෙලේ ප්‍රධානතම අංගයක් වන්නේ "පරණ අවුරුදු චාරිත්‍ර"යි. මෙහිදී මෙතෙක් දෛනික ජීවිතයේ සිදුකළ සියලු වැඩ කටයුතු නිමවා නව සඳ බැලීමාදිය කර අතීතය ආවර්ජණය කිරීම තුළින් ජීවිතය දෙස ආපසු හැරී බැලීම සංකේතවත් කරයි.

ස්වකීය අතීතය තුළ සිදුවූ වැරදි අඩුපාඩුකම් මඟහරවා ගැනීමට මේ කරුණ හේතුවේ. මින් සිදුවන වැදගත්ම දෙය වන්නේ පසුගිය වැරදි කාරණා හඳුනා ගෙන ඒවා නිවැරදි කර ඉදිරි කටයුතු කරගෙන යාමයි. අතීතයට නොහඬන ජීවිතය සාර්ථක එකක් බව බෞද්ධාගමික ඉගැන්වීමක් බව "අතීතං නානු සොචනති" යනුවෙන් සඳහන් කර ඇති බැවින් ප්‍රකට වේ. පරණ අවුරුද්දේ වැඩ හැරීම යනු සියලු කටයුතු නිමවා අලුත් ජීවිතයකට සූදානම් වීමයි. බක් මහේ මෙම චාරිත්‍රය පුද්ගලයා නිතැතින්ම ප්‍රගතිය කරා යොමු කරවන්නකි.

අවුරුද්ද වෙනුවෙන් සිදුකරනු ලබන ක්‍රියාදාමය අවුරුදු සඳහා පේවීම යනුවෙන් හඳුන්වයි. මෙහිදී ගෙවල් දොරවල් වලට යන මංපෙත් ශුද්ධ පවිත්‍ර කෙරේ. ගේ දොර තීන්ත හෝ හුණු වලින් ආලේප කොට ගොම මැටි ගා ගෙදරට නැවුම් බවක් ලබාදීමට කටයුතු කෙරේ. ඒ සමඟම ගෙදරට අවශ්‍ය කරන හැළිවලං කැත්ත, පිහිය, හා වෙනත් අත්‍යාවශ්‍ය උපකරණ ආදිය රැස් කෙරේ.

අලුත් අවුරුදුදේ පුණ්‍ය කාලය ලෙස දක්වා ඇත්තේ සංක්‍රාන්තිමය කාලයයි. මෙය කිසිඳු සුභ කටයුත්තකට නුසුදුසු කාලයයි. මේ කාලසීමාව පැය කීපයක් පමණ වන අතර එහිදී තම තමන්ගේ ආගමික ඉගැන්වීම් වලට අනුගත වෙමින් ආගමානුකූල ජීවිතයකට හුරුවීමට ප්‍රයත්න දරයි. අපේ ඕනෑම සුභ කාර්යයක් ආරම්භ කිරීමේදී ආගමික අංශයට මුල්තැන දීම බෞද්ධයන්ගේ චිරාගත සම්ප්‍රධායකි.

ඊළඟට එළඹෙන නැකැත් කාලයේ දී විශේෂ ස්ථානයක් හිමිවන්නේ ආහාරපානාදිය සම්පාදනයට හා අනුභවය සම්බන්ධයෙනි. මනුෂ්‍ය ජීවින්ගේ ප්‍රධන තම අවශ්‍යතා වන්නේ වස්ත්‍ර ආහාර, නිවාස හා බෙහෙත්ය. ලෝකයේ සත්ව ජීවිතයේ හැම අංශයක්ම රඳා පවතිනුයේ ආහාරය මුල් කරගෙනය. ආයු, වර්ණ, සැපය, බලය, ප්‍රඥාව, සතුට, පුෂ්ටිමත් බව, ආදිය ලබාගැනීමට මුල්වනුයේ ආහාරයයි. මේ නිසාවෙන් බුදු රජාණන් වහන්සේ ද සත්වයාට ඇති ප්‍රධානතම අවශ්‍යතාව වන්නේ ආහාරය බව දේශනා කොට ඇත. (සබ්බේ සත්තා ආහාරට්ඨිතිකා) ආහාරය යනු සමාජ අවශ්‍යතාවයක් වුවද එහි සමහර විද්‍යාත්මක හරයන්ද ඇත.

එනිසා ආහාර සම්පාදනයට හා අනුභවයට විශේෂ ස්ථානයක් අවුරුදු චාරිත්‍ර වලදී හිමිවේ.

පරණ අවුරුද්දේ මුළුතැන්ගෙය පිරිසිදු කර (කුස්සිය) ලිප ගිණි මෙලවීමට කටයුතු සකස් කරයි. නැකත් අනුව එම වර්ෂයට නියමිත එකම ආකාරයේ වස්ත්‍රාභරණයෙන් ගෘහණිය සැරසී එකම දිසාවක් බලාගෙන එකම වේලාවක එකම මිශ්‍රණයකින් යුතු ආහාර පිසීම සිදුකරනු ලැබේ. එසේ සකස් කරගත් ආහාරය ගෙදර ගෘහමූලිකයා දූ දරු ආදී ලොකු කුඩා සියලුම දෙනා එකට වාඩිවී එකම වේලාවක අනුභව කරති. මෙය ඉතාමත් දුර්ලභ කරුණකි.

ආහාර අනුභවය හා සම්බන්ධ තවත් විශේෂ චාරිත්‍රයක් නම් "අලේ" කිරීමයි. ගණුදෙණු කිරීම ලෙස මෙය හඳුන්වති. එනම් නිවසට ප්‍රදේශයේ ගම් දනව්වේ ප්‍රබුද්ධ අමුත්තකු ගෙන්වා ආහාර අනුභවයට ආරාධනා කරයි. එසේම ගණුදෙනු කරනුයේ ඔහු සමඟයි. මෙය පුද්ගලයින් දෙපිරිසක් අතරට පමණක් සීමා නොකළ ගැමියා තමාට වසර පුරා ජලය සැපයූ සශ්‍රීකත්වය ඇතිකළ ළිඳ සමඟද ගනුදෙනු කරයි. බුදුන් වහන්සේ ලොවට හඳුන්වාදුන් "කළගුණ සැලකීමේ " උතුම් ගුණය ගැමි හදවත් තුළද මුල්බැස ගෙන තිබීම මෙයින් ධ්වනිත කරයි.

පැරණි අවුරුද්දේ ණය නැති නිදහස් පුද්ගලයකු ලෙස කටයුතු කිරීමට ආරම්භ කිරීම පොදුජන විඥාණයේ පවතින විශ්වාසයයි. එය බුදුදහමින් අනුදැන වදාළ "අණන සුඛ" නම් ආගමික ආදර්ශය හා බැඳී පවතී. වර්ෂය පුරා අතමිට සරුවී සෞභාග්‍යමත් ජීවිතයක් ගතකිරීමට අවස්ථාව උදාවේවායි යන සිතුවිල්ල මෙයින් අර්ථ ගැන්වේ.

අවුරුදු චාරිත්‍රවල එන "වැඩ ඇල්ලීම" ද විශේෂ කාර්යයකි. මෙයින් අනලස්බව ප්‍රකට කරයි. බුදු දහමේ උගන්වන නිවැරදි ආධ්‍යාත්මික මෙන්ම බාහිර දියුණුව උදෙසා නිවැරදි කර්මාන්ත කිරීම (සම්මා කම්මන්ත) අවශ්‍ය වේ. තම තමන්ගේ දෛනික ජීවිතයේදී නියැලී සිටින ජීවනෝපායට සම්බන්ධ කාර්ය ආරම්භය සංකේතවත් කිරීම වැඩ ඇල්ලීමේ චාරිත්‍රයෙන් ගම්‍යමාන වේ.

මූලික කටයුතු වලින් අනතුරුව දෙගුරුන් නැමදීමේ ගුණය අවුරුද්දේ තවත් සුවිශේෂී වූ අංගයකි. දෙමාපියන් වැඩිහිටියන් පමණක් නොව පිදිය යුත්තන් පිදීම බුදු දහමේ උසස් ක්‍රියාවක් බව පෙන්වා දි ඇත.. (පූජාච පූජනීයානං) සමහර අන්තර් සබඳතා ඇතිවීමටද මෙය ප්‍රමුඛ පෙළේ සාධකයක් වන්නේය. මෙහිදී දෙමාපිය වැඩිහිටියන් පමණක් නොව ගුරුභවතුන් වෙද මහතා යකැදුරු මහතා සමඟ පමණක් නොව රෙදිසෝදන්නා (රෙදි නැන්දා, රෙදි මාමා) සමඟද ගණුදෙණු කිරීම හෙවත් ඇයි හොඳයි කම් පෑම සිංහල චාරිත්‍රයකි. නූතන සමාජ සම්බන්ධතා බිඳ වැටීමට ප්‍රධාන හේතුවක් වී ඇත්තේ එකිනෙකාට ගරු කිරීමෙන් ඈත්වීමයි. සමාජයේ බොහෝ අය ගරු බුහුමන් අපේක්ෂා කරනවා විනා තම යුතුකම් ඉටුකිරීමට උත්සුක නොවීම හා අන්‍යමත ඉවසීමට සූදානම් නොවීම නිසා පැන නැග ඇති ගැටළු සමාජ අන්තර් සබඳතා බිඳ වැටීමට හේතුවි ඇත. එනිසා අලුත් අවුරුදු චාරිත්‍ර වලදි වැඩිහිටියන් දෙගුරුන් නැමදීම අතිශය වැදගත් වූවකි. පසුගිය කාලයේ තමා අතින් කිසියම්

15 පිටුවට...

# බෞද්ධයාගේ ඥාන මාර්ගය

ධාර්මික ජීවිතයක් හිතට එකඟව ජීවත් වීමයි. පාපකර්ම ලෙස හඳුන්වා ඇති ක්‍රියාවන් එකක්වත් හිතට එකඟව කරන්නට බැහැ. මනස සියල්ලටම ප්‍රධාන වන බැවින් කුමන හෝ කරුණක් කෙරෙහි සිත යොමුකරන විටම ඒ සඳහා ගැළපෙන ආකාරයට මනස සකස්වීම ස්වාභාවිකව සිදුවෙනවා.

"චේතයිත්වා කම්මං කරෝති කායේන වාචාය මනසා" යන ධර්ම පාඨයට අනුව කර්මය යනු චේතනාව මුල්කර ගෙන සිදුවන්නක් බව පැහැදිලියි. කය, වචන, මනස යන තිදොර සංවරව පවත්වා ගතයුතු බවට සම්මතයක් බුදු දහමේ පවතින්නේ ඒ නිසාය. ඉහත කී තුන්දොර සත්වයා භාවිතා කරන්නේ තමා මුහුණ දෙන අත්දැකීම් මගින් ලබාගත් අවබෝධයන්ට අනුව සිය ප්‍රතිචාරය දැක්වීමටයි. කාය කර්ම, වාචීකරම, මනෝ කර්ම ලෙස දක්වා ඇති මෙම ක්‍රියා පද්ධතිය පුද්ගලයාගේ ගුණාගුණ පිළිබඳ මිණුම්දඬු නිර්මාණය කරනවා.

අපට මෙහිදී වැදගත් වන්නේ ගුණාත්මක බවින් පිරිපුන් යහපත් පෞරුෂයකින් යුක්ත මානවයෙකු නිර්මාණය කිරීමට බුදුදහම තුළින් ලැබෙන අවස්ථාවක් විමසා බැලීමටයි. මිනිසා අකුසල් නොකළ යුත්තේ ඒවා මිනිස්කමට නුසුදුසු නිසාම නොව ප්‍රති විපාක කටුක වන බැවිනි. කුසල් කල යුත්තේ මානව ධර්ම ආරක්ෂා කර ගනිමින් අනාගතය සුවදායක වනු පිණිසයි.

**"යථාපි පුපථ රාසිම්හා**
**කයිරා මාලා ගුණේ බහූ**
**ඒවං ජාතේන මච්චේන**
**කත්තබ්බං කුසලං බහු"**

ධම්මපදයට අනුව "උපන් මිනිසාගේ වගකීම" මෙසේ දැක්විය හැකිය. යම් සේ විවිධ මල්වර්ග එක්රැස්කොට මාලාකරුවා විසින් මල් මාලා ගොතන්නේද, එසේම උපන්නාවූ සත්වයා විසින් බොහෝ කුසල් කළ යුතුය යනුවෙන් බුදුරජාණන් වහන්සේ ඉතා මැනවින් පැහැදිලි කර වදාළේ මානව චර්යාවන්හි පැවැතිය යුතු ශ්‍රේෂ්ඨත්වය සිහිපත් කර දෙමිනි. පසිඳුරන් මගින් සිතට ගලා එන විවිධ කාමී සංකල්ප වලට හිස නවා හදවතින් වැළඳගෙන ඒවාට අවනතව ලබාගන්නා තෘප්තිමත් බව, පෙරළා ආපසු ලබාදෙන කටුක දුක් වේදනා වලින් නිමාවක් දකින්නේ නැත.

කාම තුලාවන්හි ඇලී ගැලී විඳින තාවකාලික සුබ වේදනා පසුව දුක්ඛ වේදනා බවට පත්වන බැවින් එවන් අසරණ තත්වයකට ඇද වැටුණ අවස්ථාවක පිහිටවීමට සරණ වීමට ඇති එකම බලවේගය කළ කුසල් පමණි. එහිදී පුද්ගලයා කුසල හීනයෙකු නම් අපා දුක් හැර තවර පිහිටක්ද?



මුලින් දැක්වූ මාලාකරුවා බුදුන් දවස විසූ දක්ෂ නිර්මාණ කරුවෙකි. ඔහු ගස්වල අතු අග පිපි සුවඳවත් මල් බොහෝ ප්‍රවේශමෙන් නෙලා ගනී. කටු අකුල්වල සුපිපි පිවිතුරු පුෂ්පයන් ඔහු නෙළා ගනී. ගඟට, වැවට හෝ විලට බැස දිවි පරදුවට තබා උපක්‍රමශීලීව දිය මත සුපිපි විකසිත පද්මයෝ නෙළා ගනී. මේ සියල්ල විවිධ වර්ණයෙනන් හා විවිධ සුගන්ධයෙන් පිරිපුන්ය. පාට අනුව, හැඩය හා ප්‍රමාණය අනුව තැනට සුදුසු ලෙස මල් තබා ඔහු ගොතන මල්දාමය රජවරුන් කුමර කුමරියන් සිටු වරුන් සිටු දේවි වරුන් මිළට ගෙන පැළඳගෙන විරාජමානව සතුටු වෙති. මේ නිර්මාණශීලී කලාකරුවා ආදර්ශයට ගත්විට උපන් සක්වයා හෙවත් මිනිසා සිය වගකීමක් ලෙස සලකා කුසල් දාමයන් ගෙතිය යුතු බව පැහැදිලිය.

අකුසලයන්ගෙන් අත් මිදී කුසලයන්හි යෙදී වාසය කිරීම මේ අනුව ධාර්මික ජීවිතයක් ගත කිරීම ලෙස අර්ථවත් වේ. ධාර්මික මිනිසා මොලොවත් පරලොවත් සංරක්ෂිත සත්වයෙකි. නිවන් මඟට බැස සසර දුකින් අත මිදෙන තුරු (යාව නිබ්බාන පත්තියා) දුගතිගාමී නොවී සිටිමට මග බලා ගත යුතුය. මේ බව බුදු දහම සංක්ෂිප්ත කළ මේ ගාථා ධර්මයෙන් මැනවින් පැහැදිලි කරයි.

"සබ්බ පාපස්ස අකරණං
කුසලස්ස උප සම්පදා
සචිත්ත පරියෝ දපනං
ඒතං බුද්ධානු සාසනං"

මුල් දෙපදයෙන් කියැවෙන්නේ පාපයන් නොකොට කුසල් රැස්කර යුතු බවයි. තුන්වෙනි පදයද ගැඹුරු අරුතක් ළිහිල් කොට දක්වයි. "සචිත්ත" යනුවෙන් අවධාරණය වන්නේ ස්වකීය චින්තනයයි. තමන්ගේ සිත, සිය මනස, ආදී අරුත එහි ගැබ් වී තිබේ. පරියෝදපනය යනු මනාව හික්මවා ගැනීමයි. සිත නිසා උපන් අපි සිත නිසා ජීවත්වන අපි සිතට යටත්ව විසීම සාධාරණ යැයි ඇතැම්විට සිතෙන්නට පිළිවන. එහෙත් සිතට වහල්වීම හෝ යටත්වීම යනු පසිඳුරන්ගේ ඉල්ලීම් ඉටුකිරීමට වහළෙකු සේ වැඩ කිරීමයි. බුද්ධි වර්ධනයට හෝ ප්‍රඥාවේ දියුණුවකට ඉන් ඉඩක් නොමැත. සිත උපදින්නේ පසිඳුරන් අරමුණු හා ගැටීමේ ප්‍රතිඵලයක් ලෙසින් බව අපි දනිමු. ඒ සිත් වැල යදම් වැලක් සේ අපව වෙලාගෙන යටත් කරගෙන අපේ ආත්මීය නිදහසට බාධා කරන නිසයි. එය දමනය කරගත යුතු බව දහමින් කියන්නේ, දමනය කරගත් සිත සැප ගෙන දෙන බව (චිත්තං දන්තං සුඛාවහං) මේ අනුව පැහැදිලි වේ.

ජීවිතයකට අගය හා අභිමානය සදාතනිකව ආරක්‍ෂා කර ගැනීමට මේ දැහැමි මඟ වගකීමෙන් යුතුව ගමන් කිරීම උපන්නාවූ සත්වයාගේ යුතුකමකි. එසේම එය මිනිසාගේ උරුමයයි.

"පබසසරමිදං භික්ඛවේ චිත්තං" යන ඉගැන්වීම මගින් සනාථ කරන්නේ අපේ සිත උපතින්නේ ප්‍රභාශ්වර වූ පිරිසිදු වූ වස්තුවක් බවයි. ආගන්තුකව පැමිණෙන ක්ලේෂ ධර්ම මගින් එය අපිරිසිදු වන අතර එමගින් සත්වයා දුකට පමුණුවන බවයි. උත්තම මිනිසුන් ප්‍රඥාවෙන් සත්‍යය දැක කාමභෝගී දිවි මඟ අත්හැර අපිස් දිවියකට අවතීර්ණ වන්නේ නම් මේ අහිමි වී ගිය ප්‍රභාශ්වර උරුමය යළි උදා කර ගැනීමටයි. ඒ සඳහා ද මූලික පියවර වන්නේ පස් පව් දස අකුසල් ආදියෙන් අත් මිදී සිල්වත් වීමයි. ඒ සීලය නිසා පහළ වන සමාධිය සිතට එකඟ බවක් උදාකරයි. එය චිත්තේකාග්‍රතාවය ලෙස දහමින් කියයි. සීලය නිසා සමාධියත් සමාධිය නිසා ප්‍රඥාවත් මිනිස් සිතට උරුම කර ගන්නට හැකියාව තිබේ. මේ ත්‍රිවිධ ශික්ෂණය බෞද්ධයා නිවැරදි මඟට ගෙන යන සනාතනික මාවතයි.

ශාස්ත්‍රපති සාමවිනිසුරු වික්‍රමසිංහ අතපත්තු

## බක් මාසය මංගල සම්මතයන්ට මුල්තැන දෙමින් සිතට ගතයුතු ඔවදන් පෙළක්...

වසරක් ගෙවී නව බැඳීමකින් ජීවත්වීම ගුනා වසරකට පා තැබීම වැදගත්ය. වැඩිහිටියන්ට සම්මත වශයෙන් බක් ගරුකරන සමාජයක් ඇති මාසයේදී සිදුවේ. එම කිරීමේ මූලික අවස්ථාව කාලය තුළ අපගේ වන්නේ නිවසය. ජීවිතවලට ලඟාකරගත "ගෙය ගින්දර පිටට යුතු මෙන්ම ඇත් කලයුතු නොදිමටත් පිට ගින්දර දේ ගැන අවධානය යොමු ගෙදරට නොගැනීමත්" කිරීම මෙම ලිපියේ ය න අරමුණයි. මෙම කාල සීමාව ඔවදන් මෙම අවස්ථාවේදී තුළ සතුටින් ජීවත්වීමට සිහිපත් කළ යුතුය. නිවසින් නම් මනා සිහියක් පිටවී තම වාහනයෙන් ගමන් අධිෂ්ඨානයත්, අත්‍යාවශ්‍යය. කරන විටත් සිහනුවණින් එය නිවසෙන් පටන් ගත සිදුකළ යුතු වන්නේය. මතට යුතුය. අඹු දරුවන් සමග බොල් වූ පිරිසගේ ජීවිත සතුටින් සිටීමට නම් මනා අවදානම් ලෙස සැලකිය අවබෝධයක් තිබිය යුතුය. යුතු වන්නේ සිහිය විකල් වූ ඔවුනොවුන් සමග මනා අය බවට පත්වීම සතුටින් ජීවත්විය යුතු කාලපරිච්ඡේදයක

හෙතුකොටගෙනය. දකින් ජීවත්වීමට පසුබිම වචනය සංවරකර ගැනීමය. දැනට සොයාගෙන ඇති තදාගන්නේ ඇයි? යන යහපත් වචන භාවිතය මෙයට සම්බන්ධ වාතීවන්ට ප්‍රශ්නයට පිළිතුරු සුදුසු පිළිවෙල වේ. පරණ අනුව මහා මාසයේදී සැපයුතු හැකිවන්නේ නොකඩවා බොහෝ ගමන් කරන තමාගේ ක්‍රියා කලාපය (අමනාපකම්) අමතක අනිද්‍රිය ගැන නොතකීමත් නිවැරදිව පවත්වාගෙන කර යහපත් පැවැත්මකට නති ගැන නොතකීමත් යැම නොවන්නේද? පත්වීම මෙහිලා ගුනා මෙම මාසවලදී සිදුවන නිවෙස්වල සිදුවන සුළු වැදගත්වේ. "බක්" මාසය විනාශයන්ට හේතුවන දේවල් ඉතාපරිමාණ දක්වා අවුරුදු මාසය ලෙස සැලකෙන බවය. දිනකට විනාශවන වර්ධනය කරගන්නේ නම බැවින් ගුනාත සඳහන් කරුණු ජීවිතවලි වටිනාකම තමන්ය. ගැන අවධානය යොමුකර මැනිය හැකිද? යළි එම අසල්වාසී ජීවත්වීමට අධිෂ්ඨාන කරගත ජීවිතවලට පණදිය හැකිද? න් සමග සුවෙන් යුතුවේ. එසේ කිරීමෙන් නාමය මේවා ගැන සිතීමට කාලය ඇතිකරගන්නා බහින් සතුට පිරි බක් මැසයක් හෙවත් එළඹ තිබේ. මෙවැනි බස්වීම වර්ධනය වී මහා අවුරුදු කාලයක් උදාකර ගැනීමට තත්වයන් වළක්වා ගැනීමට විනාශයක් කරා ගමන් හැකිවේ. එයය අපගේද අත්‍යාවශ්‍ය වන්නේ තම කිරීමට සිදුවෙයි. වචනය ප්‍රතිඵලය වන්නේ නාමය සතුට බුද්ධියත් මනා සිහියත් නිවැරදිව භාවිත කිරීමට පිරි නවයුගයක් උදාවේවා.... ඇතිකර ගැනීමය. අවබෝධයක් නැතිකමින් මෙවැනි අවාසනාවන්ත තත්වයක් ඇතිවේ. මෙහිදී වැදගත් වන්නේ

-විජය-

# සිංහල ජන කවියෙන් හෙළිවන පැරණි සිංහල සමාජය

සිංහල ජන කවිය යනු ගැමි ජනතාවගේ සිනහවේත් කඳුලේත් උපන් කාව්‍ය සංකලනයකි. සිංහල ජන සමාජය තුළ ජන කවියේ ආරම්භයට නිශ්චිත කාල සීමාවක් ඇතැයි නිගමනය කළ නොහැකිය.

ජනශ්‍රැතිය හැඳින්වෙන්නේ ඒ කාලවල ජීවත්වූ ජනතාවගේ ජන ජීවිතය පිළිබිඹු කරන කැඩපතක් ලෙසටය. ඒ හේතුව නිසා විචාරකයින් පෙන්වා දෙන්නේ ජන කවිය එදා මිනිසුන්ගේ ජීවන රිද්මය පමණක් නොව ඔවුන් ජීවත්වූ සමාජයද හෙළි කරන විශිෂ්ඨතම නිර්මාණ සමුදායක් ලෙසටය.

එලෙස බලන කල අතීත සිංහල ගැමියා තමන්ගේ ජීවිතයම ප්‍රති නිර්මාණය කොට ගැයුණු ජන ගී සමුදාය ඵා සමාජයේ තතු අපූර්ව ලෙස හෙළි කරන වග පෙනේ. පුරාතන සිංහල සමාජය පීතෘ මූලික සමාජයක් වේ. ඒ නිසා පවුල් ඒකකය තුළදීත් ප්‍රධාන ස්ථානය ගන්නේ නිවසේ ස්වාමි නැතහොත් පිරිමියාය. පහත කවිය එදා සමාජයේ පැවති පුරුෂ මූලික ලක්‍ෂණ පමණක් නොව පවුල් ඒකකයේ පැවති ඒකමතියද පෙන්වන්නකි.

**"අප්පච්චී අපෙ ගේ දොර කිතුල වගේ**
**අම්මා අපේ ඒ කිතුලේ පැණි වාගේ**
**අක්කා අපේ ඒ කිතුලේ මල වාගේ**
**පර අම්මා මාවුස්සා කොල වාගේ"**

පුරුෂ මූලික සමාජයක් වීම නිසා බහුතරයක් බලාපොරොත්තු වූයේ නිවසේ හැකිතරම් පිරිමින් සිටින සංඛ්‍යාව වැඩි කරගන්නටය. ඒ නිසාවෙන් එදා සිංහලයෝ දරු ප්‍රසූතිවලදී වැඩිපුරම පිරිමින් ප්‍රාර්ථනා කළහ. මේ සඳහා එකල පැවති සමාජ සංස්කෘතික පසුබිම හේතු කාරක වී තිබේ. ගොවිතැනේදී පිරිමියා මූලික වීම මේ සඳහා නිදර්ශකයන් සේ ගත හැකිය. සිංහලයා ආදරයෙන් සැලකූ ශ්‍රී මහා බෝධින් වහන්සේගෙන් පවා ඔවුන් ඒ අයාචනය සිදුකර ඇත.

**"උඩ මළුවේ බෝ මළුවේ පිරිමි පුතෙක් දෙන්නයි"**

**"සිරිමා බෝ සාමිනි මට පිරිමි පුතෙක් දෙන්නයි"**

නන් දෙසින් පැමිණෙන අහිංසක ජනයාට එදා සිංහල සමාජයේ පිරිමි දරුවකු පතාගෙනකෙතරම් දුෂ්කරතා තිබුණද ගමන් කළ ගමන එතරම් අපහසුතාවයක් නොවුණි.

**කතරගමට හතරක් පඬුරු**
**දෙඤ්ඤඤං**
**නවගමුවට නවයක් පඬුරු**
**දෙඤ්ඤඤං**
**දොඩංගලට දොලසක් පඬුරු**
**දෙඤ්ඤඤං**
**පුතකු දෙතොත් එන පෙරහැරට**
**එඤ්ඤඤං**

මේ කවියේ මව පිරිමි දරුවෙකු වෙනුවෙන් වඩාත් කැප වීම් කිරිමට කැපවී සිටි. එදා පිරිමියාට සිංහල සමාජය තුළ පැවතුනු වටිනාකම එයින් පැහැදිලි වේ. පහත කවිය පෙන්වන්නේ එසේ බහුතරයක් පිරිමි දරුවන් ඒ සමාජ විසින් ප්‍රාර්ථනා කලේ ඇයිද යන්නය. වැසි නැතිව ගංගා වලට බොරදිය එක් නොවේ.

කොල නැති ගස් යට සෙවණක් ද නැත. ඒ වාගේම පුතකුනැතිනම් තමාට කිසිඳු ශක්තියක් ද නොමැති බව සිංහල ජන කවිවල කියැවේ. හෙළ මාතාවට පිරිමි දරුවා ඉතා ශක්තියකි. එයම අරමුණු කොට ගෙන සිංහල මවකගේ පද රාවය හෙළ ජන කවියෙන් මනාව චිත්‍රනය කරයි.

නමුත් සිංහල සමාජය පිරිමියාම ශ්‍රේෂ්ඨ කොට ගැහැණිය අවතක්සේරුවට ලක් කලේ නැත. පිරිමින් කෙතරම් සිටියත් ගැහැණිය නොමැතිව සමාජයේ සමතුලිත බව නොරැඳෙන බවද ඔවුහු දැන සිටියහ. එනිසා ඔවුන් ජන කවියෙන් හඬගා කීවේ පිරිමියා සේම ගැහැණියද වටිනා බවයි.

**නැතහොත් වෙරළ සයුරේ නැත බැබලීම**
**නැතහොත් තරිඳු අහසේ නැත බැබලීම**
**නැතහොත් බමරු මල් කැන් නැත හැඩවීම**
**නැතහොත් ගැහැණු පිරිමින් නැත බැබලීම**

ලාංකේය සමාජයක් අත්දුටු සත්‍යයක් වූයේ ලොව ඉතාම සුන්දර වන්නට නම් ගැහැණියට පිරිමියාත් පිරිමියාට ගැහැණියත් සංයෝගවිය යුතු බවත් ඒ අර්ථය මතුකරනවාට වඩා ජනකවියා යොදා ගත් සංකල්ප රූපද අතිශයවිශිෂ්ඨ බව කිව යුතුය.

අපූර්ව මානව සබඳතාවයනුත් ජනකවි ඇසුරෙන් හඳුනාගත හැකිය. එකල පැවති අපූර්වතම සම්බන්ධතාවයක් වූයේ දෙමාපිය දූදරු සම්බන්ධතාවයි. ඉනුත් වඩාත් බැඳුනේ මව සහ දරුවන්ය. එකල සමාජයේ දරුවන් පිය සෙනෙහස පිළිබඳව සිතුවේ එක්කෝ තමන්ට පියා අහිමි වීමෙන් පසුවයි. නැතහොත් ඇත් වූ පසුවයි. පියාගේ වියෝවද ගැමි දරුවන්ට දරා ගැනීමට අපහසු එකක්ය.

**පාලුගෙයක මූතු අමුණා තියෙන්නා**
**පෙතන් ගහක මල් පිපිලා වැනනෙන්නා**
**පුර අහසේ තරු පායා තියෙන්නා**
**අප්පච්චී දුර එනවා පෙනෙන්නා**

සංස්කෘතික වශයෙන් පීතෘ භූමිකාව එක්තරා ස්වරූපයකට ගොඩනැගී තිබෙයි.

එනම් දරු සෙනෙහස මව්වරුන්ගේ බරට නොදැනීම, දරුවන් ඉදිරියේ සංවේදී නොවීම ඔහුන් ඉදිරියේ පිරිමි භූමිකාව රඟ දැක්වීම ආදියයි. ඒත් මතුපිටින් පියවරුන් මේ සංස්කෘතික ෂත්වයා වුවත් හද අභ්‍යන්තරයෙන් කෙතරම් ස්නේහයක් ඇති ගෞරවනීය පුද්ගලයෙකුදැයි දරුවන්ට සිහි වන්නේ ඔවුන්ට පියවරුන් අහිමි වූ දිනකය.

නමුත් සිංහල මාතාව යනු උපන් මොහොතේ සිට තමන් ෂතු ආදරණීය බව හැඟුම්බර බව දරුවන්ට පෙන්වන අඟවන ගැහැණියයි. ඒ නිසා දරුවන්ට සිතෙන්නේ ලොව අසමසම ස්නේහය මව් සෙනෙහස බවයි. ඒ නිසා හෙළ දරුවෝ පියාට වඩා මවට දැඩි සේ ආදරය කළහ. ඇය ඔවුන්ගේ සොඳුරුතම පරමාදර්ශය විය. දෙවෙනි බුදුන් වශයෙන් පවා ඇ ගෞරවයට පාත්‍ර වූයේ ඇගේ මේ සංවේදි හැසිරීම් රටා ව නිසාවෙනි.

සිංහල සමාජයේ පවතින මේ ගැඹුරු මව් සෙනෙහස අහම්බයෙන් මතු නොවුනක් පෙනෙන්නේ සැබැවින්ම හෙළ මාතාවගේ ආධ්‍යාත්මික නාදයට ඇහුම්කන් දෙන විටය. බාහිර ක්‍රියාවලින් පමණක් නොවේ. හද අභ්‍යන්තරයෙනුත් මව්වරුන් තම දරුවන්ට ජීවිතය දෙවෙනි කොට ආදරය දක්වති. මේ එබඳු සැබෑ මව් ගුණය මතුවන අවස්ථාවකි.

**ආදර වඩන පුත නුඹ සිහිවන කලට**
**දනවා මගේ කුෂ ගිනි මැලයක් ලෙසට**
**ඉවසා ගන්න බැරි දෙවියනි මෙමා හට**
**වරෙන් පුතා මවගේ හිත සනසන්ට**

සිංහල ගැමි මාතාව ආදරය කලේ තමන්ගේ දරුවාට පමණක් නොවේ. එම ආදරය ඔවුහු ඕනෑම දරුවෙකුට ප්‍රදානය කලහ. එය සිංහල ජනකවියෙන් මොන වට පැහැදිලි වෙයි.

"පුංචි රිලව් කෙළ ඇවිදිය ගාල පිට බඩ බැන්දි දීලා පල
පුතා මට
සිංහල මව කෙතරම්
සුන්දර වුවත් කුඩම්මා
සංකල්පය තුලදී සමහර
මව්වරු තම සැමියාගේ
ප්‍රථම විවාහයේ දරුවන්ට
කුරිරුකම් පෙන්වා
අත්හැරියේය. කුඩම්මා
නම් සංකල්පය සිංහල
සමාජයේම යථාර්ථයක්
නොව සමහරක් කුරිරු
ගැහැණුන් නිසා ඇතිවූවක්
බව පැහැදිලි වේ. මේ
එබඳු කුඩම්මා කෙනෙකු
ගැන ලියවුනකි.

**කයි මදුරුවෝ වැල වැලමඳුල්**
**මමත් ගෙදර උන්නානම් කාවි මදුල්**
**වැදූ මවක් නම් දීලා කාවි මදුල්**
**පර අම්මේ මේ බලපන් එන කඳුල්**

එහෙත් සියලු කුඩම්මාවරුන් නැන්දම්මා වරුන් වියරු ගැහැණුන් නොවන බවට සමහර කවි නිදර්ශන සපයයි.
සිංහල ගැමි සමාජය මානව සබැඳියාවන් අතින් සමකාලීන අන්‍යය සමාජ වලට වඩා යහපත් සමාජයක් වෙයි. ගුරු සිසු සබැඳියාවද එලෙසය. පැරණි අධ්‍යාපන ක්‍රමය තුල ගුරුවරයා රළු පරළු ගති ඇත්තෙක් සේ පෙනුනත් එදා ශිෂ්‍ය පරම්පරාව ඔවුන්ව කොතරම් ගැඹුරින් තේරුම් ගත්තේද යන්න පහත කවියෙන් පැහැදිලි වෙයි.

**අත්තක දොඩම් මට තනියම කන්න බැරී**
**ඒදණ්ඩේ මට තනියම යන්න බැරී**
**පුංචි ගොයම් පැල මට උදුරන්ට බැරී**
**මගෙ ගුරුතුමා සිහිවන වට ඉන්න බැරී**

මේ අනුව අපට පැහැදිලි වන්නේ සිංහල ජන කවිය සමාජයේ උතුම් මානව සමාජයන් මොනවට පැහැදිලි කරන කැඩපතක් බවයි. උසස් මානව සබැදියාන්ගෙන් යුතුපැරණි සිංහල ජන සමාජය සිංහල ජන කවිය තුලින් කොතරම් සොඳුරුද, කොතරම් මිහිරිද යන්න මින් හඳුනා ගත හැකිය.

**එස්. දිල්රුක්ෂි අබේකෝන්**

## භාවිතයට

**"යථාපි භමරෝ පුපඵං - වණ්ණ ගන්ධං අහෙඨයං**
**ඵලෙති රස මාදය - එවං ගාමෙ මුනි චරෙ"**
**(පුපප වගගය)**

බඹරා මලෙහි පැහැයත්, සුවඳත් විනාශ නොකර පැණි පමණක් ගෙන යන්නාක් මෙන් මහණ තෙමෙ අන්‍යයන්ට හිරිහැර නොවන පරිදි ගමෙහි හැසිරෙති.

**"කාය කමමං සුචී තෙසං**
**වාචා කමමං අනාවිලං**
**මනො කමමං සුචි සදධං**
**තා දිසා සමණා මම "**
**(ධමමපදට්ඨකථා)**

මගේ ශ්‍රමණයන් වහන්සේලා කයෙන් පිරිසිදුය.වචනයෙන් පිරිසිදුය. නොකැලැල්ය.මනස පිරිසිදුය.මාගේ ශ්‍රමණයන් වහන්සේලා එවැනි අයවෙති.

**"දූරගමං එකචරං - අසරීරං ගුහාසයං**
**යෙ චිත්තං සඤ්ඤමෙසසන්ති - මොක්ඛන්ති මාර බන්ධනා"**
**(චිත්ත වගග)**

දූර ගමන් යන්නාවූ, තනිව හැසිරෙන්නාවූ සිත යම් කෙනෙක් සංවරකර ගනිද්ද ඔවුහු මාරබන්ධයෙන් මිදෙත්.

විජයවර්ධන

# ධර්මදේශනා හා ධර්මශ්‍රවණය

'බණ කීම' හා 'බණ ඇසීම' යනුවෙන්ද පොදු බෞද්ධ සමාජයේ ව්‍යවහාරිත ආගමික පිළිවෙත ක්‍රි.පූ. 6 වෙනි සියවසට හෙවත් බුද්ධකාලය දක්වා වූ දිගු ඉතිහාසයක් කරා දිවෙන උතුම් දහම් පිළිවෙතකි. බෞද්ධ ශාසන ඉතිහාසයේ ප්‍රථම ධර්ම දේශකයාණන් වහන්සේ තථාගත බුදුරජාණන් වහන්සේ වන අතර ධර්ම ශ්‍රවණලාභීන් වී ඇත්තේ පස්වග මහණුන් වහන්සේලා වෙති. ඒ වූකලී දඹදිව ඉසිපතනයේදී පවත්වන ලද ප්‍රථම ධර්ම දේශනාව හෙවත් දම්සක් පැවතුම් සූත්‍ර දේශනාවය.දේශනාව අවසානයේ පස්වග මහණුන් වහන්සේලා චතුරාර්ය සත්‍යාවබෝධයෙන් රහත්භාවයට පත් වූහ.



තදනන්තරව ප්‍රථම රහත් සැට නමටත් සිය ශ්‍රාවකයන්ටත් ශ්‍රාවිකාවන්ටත් ගම් නියම් ගම් කරා ගොස් ධර්මශ්‍රවණ ලාභීන්ට උතුම් සද්ධර්මය දේශනාකිරීමේ වගකීම පවරා බුදුරජාණන් වහන්සේද එකී අනුත්තර ධර්මදේශනා සේවාවේ පන්සාලිස් වසක්ම යෙදුනාහ. මේ නයින් ධර්මදේශනා කිරීම හෙවත් ධර්ම සංනිවේදනයත්,ධර්මය ශ්‍රවණය කිරීමත් වර්තමානය දක්වාම එනම් වසර 2600 ක් ඉක්මවා උතුම් පිළිවෙතක් ලෙස සජීවී බෞද්ධ ලෝකයේ භාවිතයේ පවතී.

බුදුදහමේ ඉගැන්වෙන පරිදි ධර්මදේශනා කිරීම දානයකි. ආමිස දානය, ධර්ම දානය, අභය දානය. යන ත්‍රිවිධ දානයන් අතර අග්‍ර දානය ලෙස දේශනාකර ඇත්තේ 'ධර්මදානයයි'. (සබ්බදානං ධම්මදානං ජිනාති) මෙහි ධර්මදානය ලෙස ප්‍රධාන වශයෙන් පෙන්වා දී ඇත්තේ ධර්ම දේශනා කිරීම හා ධර්ම දේශනා කරවීමය.අතිරේක වශයෙන් බණපොත් ලිවීම හා ලියවීම. දහම් පොත් මුද්‍රණය කර නොමිලයේ බෙදාදීම ආදියද ධර්ම දානයටම අයත් වෙති.

ධර්මදේශනා න්‍යායෙන් ධර්ම ශ්‍රවණ ලාභීන්ටත් ධර්මපුස්තක මගින් ධර්මාභිලාශී පාඨකයන්ටත් නිශ්ශරණාධ්‍යාශයෙන් බෙදා දෙන එකී ධර්ම නැමැති දානය සියලු රසයන් අතරද අග්‍ර රසයකි. (සබ්බරසං ධම්මරසො ජිනාති)

ධර්මදේශකයා ත්‍රිපිටකයේ සූත්‍ර දේශනාවල හඳුන්වා දී ඇත්තේ 'ධම්මකථික' යන නාමයෙනි. භික්ෂු,භික්ෂුණී,උපාසක,උපාසිකා යන සිව්වනක් පිරිසම ධර්ම දේශනා කළ යුතු බවත් එය සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතියට උපස්තම්භක වන බවත් මහාපරිනිර්වාණ සූත්‍රයේ දේශනා කොට ඇත. එතකුදු වුවත් සෑම පුද්ගලයෙකුට ධර්මදේශකයෙකු හෙවත් ධර්ම කථිකයෙකු විය නොහැකිය. ඒ සඳහා සුදුසුකම් හා කුසලතාවයද තිබිය යුතුය.

එහිලා ප්‍රථම සුදුසුකම ලෙස පෙන්වාදී ඇත්තේ ධර්මදේශකයා බුදුරදුන් දේශනා කළ ධර්මය මැනවින් අවබෝධකර ගත් අයෙකු වීමය. ප්‍රථම ධර්ම දූත පිරිස වූ රහත් සැට නමට ධර්ම දේශනා කිරීමට ගම් නියම්ගම් කරා වඩින ලෙසට බුදුරදුන් නියම කරන්නේ එකී සැට නම දහම් අවබෝධ කරගත් පිරිසක් වූ බැවිනි. බුදුදහමේ මුල-මැද-අග යහපත්වූ අර්ථ සහිත වූ සර්වප්‍රකාරයෙන් සම්පූර්ණ වූ ධර්මදේශනාවක් කළ හැක්කේ එවිටය.

'ධම්මකථික' සූත්‍රයේ දී ධර්මකථිකයන් සිව් දෙනෙක් ගැන විස්තර බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කොට ඇත. එයින් ප්‍රධාන වශයෙන් පෙන්වා දී ඇත්තේ ධර්මශ්‍රවණලාභියා ධර්මාවබෝධයෙන් සමත් කරනු පිණිස ධර්මදේශකයා ධර්ම කරුණු ඉදිරිපත් කිරීමේ කුසලතාවයෙන් යුක්ත විය යුතු බවයි.

සම්බුද්ධ ශාසනයේ දියුණුව උදෙසා රුවන්වැලි මහා සෑය ඇතුලු දහස් ගණනින් වෙහෙර විහාර කරවූ, සංඝරත්නය විෂයෙහි මහ දන් දුන්,නිරන්තරයෙන් ධර්ම ශ්‍රවණය කළ දුටුගැමුණු මහ රජුටද වරක් තමන්ද ධර්මදානයක් වශයෙන් ධර්මදේශනාවක් කිරීමට සිත් වී ලෝවාමහාපායේ ධර්මාසනයක් පනවා දහම් දෙසනු පිණිස එහි වාඩි වූ බවත් එහෙත් වචනයක් වත් කීමට නොහැකිව තැතිගෙන දහඩිය දමා ධර්මාසනයෙන් බැස ධර්මදේනා කිරීමේ දුෂ්කරතාවය පසක් කර ගත් බවත්, පසුව 'ධර්මදේශනා කරවීමත්' ධර්මදානයක් බව සංඝයාගෙන් අසා රාජධානිය මුලුල්ලේ ගම් නියම්ගම් වලට මහා සංඝරත්නය වැඩමකරවා සිව්පසය ඇතුලු සියලු පහසුකම් සළසා ධර්මදේශනා පැවැත්වූ බව ශාසන ඉතිහාසයේ සඳහන් වෙයි.

ධර්මශ්‍රවණය පුණ්‍ය කර්මයක් ලෙස පමණක් නොව නිවන් මගට දොරටුවක් ලෙසත් පෙන්වා දී තිබේ. දහම් ඇසීමෙන් කුසල් අකුසල් හඳුනාගැනීමටත්,මෙලොව පරලොව හඳුනා ගැනීමටත්, සත්පුරුෂ-අසත්පුරුෂයන් හඳුනාගැනීමට හැකිවීමත්,ත්‍රිවිධ රත්නය පිළිබඳ ශ්‍රද්ධාවත්, චිත්ත ප්‍රසාදයත් ඇති වන බැවින් පිං සිදුවන අතර ධර්ම කරුණු අසා ලබාගත් අවබෝධය තුළින් තමන් එතෙක් නොලද විශ්මිත ඤාණයක් ලබා ගැනීම තුළින් නිවන් මග පසක් කර ගත හැකි වෙයි.

ධර්මශ්‍රවණය නිර්වාණ අවබෝධයට අත්‍යවශ්‍යම කරුණක් ලෙස පෙන්වා දී ඇත.මක්නිසාද යත්, ත්‍රිපික ධර්මය අනාදිමත් කාලයක් එම ධර්මය දැනගෙන සිටියේ භානක තෙරවරුන් හා උන්වහන්සේලාගේ සද්ධිවිහාරිකයන් විසින් පමණක් වන බැවිනි. උන්වහන්සේලා කටපාඩමින් දැන සිටි ධර්මය, ධර්මශ්‍රවණ ලාභියාට සංනිවේදනය කිරීමට තිබූ එකම මාධ්‍ය වූයේ දේශනා මාධ්‍ය පමණි. එහෙත් ක්‍රි.ව පළමුවන සිය වසේදී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ වීමෙන් අනතුරුව වර්තමානය වන විට ත්‍රිපිටකය ඇතුලු එයටම අනුබද්ධ අටුවා ටීකා ආදී ධර්ම කරුණු පාලි භාෂාවෙන් පමණක් නොව සිංහල,ඉංග්‍රීසි ඇතුලු විවිධ භාෂා වලින් මුද්‍රණද්වාරයෙන් බිහිවී ප්‍රචලිතව පවතී. එබැවින් වර්තමානයේ 'බණ පොත් කියවීමෙන්ද' බුද්ධිමතුන්ට ධර්මාවබෝධය ලබා ගැනීමට අවස්ථාව උදාවී තිබේ.

තථාගතයන් වහන්සේ විසින් දේශනා කර ඇත්තේ බුදුදහම බුද්ධිමතුන් සඳහා වූ දහමක් විනා මන්දබුද්ධිකයන් සඳහා නොවන බවය.

(පඤ්ඤාවංතස්සායං ධම්මෝ නායං ධම්මො දුප්පඤ්ඤස්ස) පුද්ගලයින් තුළ පවතින 'උගත්කම' හා 'බුද්ධිමත්කම' යනු දෙයාකාර වූවකි. උගතා යනුවෙන් සමාජයේ පිළිගැනෙන්නේ කිසියම් විෂයමාලාවක් හෝ පාඨමාලාවක් සාර්ථක ලෙස අවසන් කළ බවට සහතික ලත් යම් තැනැත්තෙකි.බුද්ධිමතා යනු සෑම දෙයක්ම විමර්ෂණාත්මකව සිතන, බලන පුද්ගලයාය. මේ නයින් ඇතැම්විට උගතා බුද්ධිමතෙකු නොවිය හැකිය,එසේම බුද්ධමතා උගතෙකු ද නොවිය හැකිය. උගතෙකු බුද්ධිමතෙකුද,බුද්ධිමතෙකු උගතෙකුද වන්නේනම් හෙතෙම වටිනා මානව සම්පතකි .බුද්ධියට බුදුදහමේ දී ඇත්තේ අතිශය වැදගත් උසස් තැනකි. කාලාම සූත්‍රයේ බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළහ:-

"ඇසූ පමණින් යම් කිසිවක් විශ්වාස නොකරන්න.
පරපුරෙන් පරපුරට පැවතෙන හෙයින් සම්ප්‍රදාය මෙය යැයි සිතා යම් කිසිවක් විශ්වාස නොකරන්න.
බොහෝ දෙනා විසින් පවසන නිසා හෝ ආරංචියෙන් දත් නිසා හෝ යම් කිසිවක් විශ්වාස නොකරන්න.
ඔබ අදහන ආගමට අයත් පොත්පත්වල ලියා තිබෙන නිසාම හෝ යමක් විශ්වාස නොකරන්න.
ඔබගේ ගුරුවරුන්ගේ හෝ වැඩිහිටියන්ගේ වචනය නිසා පමණක් විශ්වාස නොකරන්න.
එහෙත්,

නිරීක්ෂණයෙන් හා විශ්ලේෂණයෙන් පසුව යම් කිසිවක් තර්කයට,න්‍යායට ගැලපෙන්නේ යැයි අවබෝධ වූ විට, එමෙන්ම එය සෑම දෙනාගේම යහපතට හා සුවසෙතට තුඩු දෙන්නේ යැයි ඔබට අවබෝධ වූ විටෙක පමණක් යම් කිසිවක් පිළිගෙන එයට අනුව හැසිරෙන්න."
(කාලාම සූත්‍රය - අඞගුත්තර නිකාය-තික නිපාතය 3.2.2.5- 326 පිට)

අප විසින් මෙතෙක් සඳහන් කළ කරුණු පිළිබඳව විමර්ශනය කිරීමේදී වර්තමානයේ ඇතැම් ජනප්‍රිය යයි සම්මත ධර්මදේශකයන් විසින් වුවද සිදුකරන ධර්මදේශනා කොතරම් දුරට බුද්ධි ගෝචරද ? ධර්මදේශනාවක තිබිය යුතු ප්‍රමිතිය එහි පවතීද? යන්න පිළිබඳව ප්‍රශ්න ගත තත්වයක් ඇත. ඉහතින් දැක්වූ පරිදි ධර්මදේශනාවක අන්තර්ගතය තුළ සම්පූර්ණයෙන්ද තිබිය යුත්තේ බුදුන් වදාළ නෛර්යානිකදේශනාව පමණකි. දේශකයාගේ පෞද්ගලික මතවාද, පුද්ගල වර්ණනා, ලාමක හාස්‍ය රසය උපදවන කථාංග හා ව්‍යංගයෙන් පවසන ආත්ම වර්ණනා, හා අපහාස ආදී බාහිර කරුණු ධර්මදේශනාවල තිබිය නොහැකිය.එවැනි දේශනා ජනප්‍රියවීමට හෝ වෙනත් අරමුණකින් කෙරෙන දේශනා විනා ධර්මදේශනා ගණයට නම් අයත් නොවේ. ධර්මදේශනවලින් අපේක්ෂිත ඒකායන අභිමථාර්තය විය යුත්තේ ධර්මශ්‍රවණ ලාභීන් නිවන් මගට යොමුකිරීම කිරීම පමණි. එසේම ධර්මදේශනා කළ යුත්තේද කිසිදු ප්‍රත්‍ය ලාභයකින් තොරව ඉහත සඳහන් කර ඇති පරිදි නිශ්ශරණාධ්‍යාශයෙනි. එතකුදු වුවත් වර්තමානයේ දේශකයන් ඒ සඳහා තම තමන්ගේ ජනප්‍රියත්වයට අනුව සිය දේශනා වලට මිලක්ද නියම කර ඇති බව ප්‍රසිද්ධ රහසකි.

ධර්මශ්‍රවණය කිරීම නිවන් මඟට පිවිසීමේ අභිලාෂයෙන් කෙරෙන උසස් පිළිවෙතක් වුවත් වර්තමානයේ ධර්මශ්‍රවණය හෙවත් බණ ඇසීම ඇතමෙකු නිවන් මගට පිවිසීම වෙනුවට පිං සිදුකර ගැනීමටත්, දිව්‍ය මනුස්ස ලෞකික සැපය ප්‍රාර්ථනාවත් ප්‍රමුඛ කොට පවතින්නකි.ප්‍රසිද්ධ ජනප්‍රිය විහාරස්ථානවල පැවැත්වෙන ධර්මදේශනා ඇසීමට යාම ඇතැමෙකුට තවත් විලාසිතාවකි.ඇතැමෙකු ඇතැම් හාසෝප්පාදක දේශකයන් කරා වාහන කුලියට ගෙන වියදම් දරා දුර බැහැර ප්‍රදේශ කරා යන්නේ ඇතිතරම් සිනාසීමටය. ලාමක වින්දනයක් ලැබූ එම දේශනා ඇසූ ඇතැම් මැදිවියේ කාන්තාවන් එම දේශනා අගයකරන්නේ ' හරි ශෝක් බණ පොඩ්ඩ'යනුවෙනි.

මේ අයුරින් බණ කීමත් බණ ඇසීමත් යන උතුම් පිළිවෙත ආරම්භක සංදර්භයෙන් ශෝචනීය ලෙස විපරිනාමයට පත්ව ඇති බව පිළිගත යුතුව ඇත.

ආචාර්‍ය,පණ්ඩිත, ඉනාමළුවේ
ශ්‍රී සුමංගල මහානායක ස්ථවිර.
සභාපති/අධ්‍යක්ෂ ජනරාල්
රංගිරි ශ්‍රී ලංකා මාධ්‍ය ජාලය,
දඹුල්ල.

# කැළණි දාගැබෙන් නැගෙනා බක් අමාවක් හඬ





බක් මාසය මුළු මහත් ලක්වැසියාටම සිත් පිනවන නෙත් සනසන හැඟුම්බර මාසයකි. අප්‍රේල් මාසය තුළ එළඹෙන්නේ බක් පොහොයයි. මේ ශ්‍රී ලංකා ද්වීපය දෙවනවරටත් බුදු සිරිපා පහසින් පිවිතුරු බවට පත්වූයේත් එම දම් රදාණන්ගේ සවනක් රැස් කදින් මුළු හෙළදිව ආලෝකවත් වූයේත් දහම් අමා මම්රෙන් නොයෙක් දනා නිවී සැනහී ගියේත් බක් මාසයේය. බුදුරජාණන් වහන්සේ දිනපතා උදේ සවස ලක්‍ෂ විසිහත් කෝටි වාරයක් අසීමිත මහා කරුණාව පතුරුවමින් සැවැත්නුවර දෙව්රම් වෙහෙර වැඩ වසමින් ලක්දිව චූලෝදර මහෝදර නා රජුන්ගේ මිණිපළග නිසා ඇතිවූ යුද්ධය වැළැක්වීමට වෙහෙර දොරටුවේ කිරිපළු රුකෙහිසෘද්ධියෙන් නාගදීපයට වැඩි සේක. බුද්ධත්වයෙන් පස්වෙනි වර්ෂයේ සිදුවූ මේ සිද්ධිය බෞද්ධ ලක්වැසියාට ඉතා වැදගත් සිහිවටනයකි. එදා ඒ මිණි පළඟ බුදුන්ට පුදනු ලැබීය. මණි අක්ඛිත නාග රාජයා බුදුන් වහන්සේට වඩින ලෙස ආරාධනා කළේත් මේ දිනයෙහිම බව සඳහන් වේ.

මෙම චූලෝදර මහෝදර යන නා රජුන් දෙදෙනා ඥාතිකමින් මාමයි බෑණයි වශයෙනුයි සඳහන් වන්නේ. පාලි භාෂාවෙන් උදර යනුවෙන් සඳහන් වන්නේ බඩටයි. මහා යනු විසාල බවද චූල යනු කුඩා බවද අර්ථවත් වේ. එනම් කුඩා බඩ සහ මහ බඩ යන නම් වලින් අර්ථවත් වූ මෙම නාග ගෝත්‍රිකයින්ගේ පාලන බල ප්‍රදේශය විශාල ප්‍රදේශයක පැතිරී තිබුණු බව සඳහන් වේ. මහා බල සම්පන්න මහෝදර නාගරාජ තෙමේ මූහුදේ පන්සියයක් යොදුන් නාග භවනයෙහි අධිපති කම් කරමින් සිටියේය. ඔහුගේ සහෝදරී කන්වඩමන් නම් පර්වතයෙහි නා රජු හට පාවා දෙනු ලැබුවාය. ඒ දෙදෙනාට ලැබුණු පුත්‍රයා චූලෝදර නම් විය. ගොඩ වැසි නාගයෝත් මුහුද වැසි නාගයෝත් මෙන් මහා බල සම්පන්නයෝ වූහ. චූලෝදරගේ සීයා කළුරිය කරන කල්හි තමා සතුව තිබුණු ඉතාවටිනා මැණික් පුටුව පුතාට නොදී චූලෝදරගේ මව වන දියණියන් හට දුන්නේය.

මාමා සහ බෑණා එනම් චූලෝදර මහෝදර යන නා රජුන් දෙදෙනා අතර යුද්ධයට හේතු වූයේ මේ මිණි පළඟය. බුදුරජාණන් වහන්සේගේ මේ ගමනට දෙව්රම් දොරටුවේ කිරිපලු රුක අරක් ගෙන සිටි සමිද්ධි සුමන නම් දෙවියාද කැඳවූ සේක. ඒ දෙව් රද තමාගේ භවනය වූ කිරිපලු රුක උදුරා තථාගතයන් වහන්සේට ඡත්‍රයක් මෙන් අල්ලාගෙන තමා පෙර ජාතියේ විසූ ස්ථානය වන නාගදීපයට පැමිණියේය. සමිද්ධි සුමන දිව්‍යරාජයා දෙව්රම් වෙහෙරෙ දොරටුවේ කිරිපලු රුක අධිගෘහිත දේවතා වන්නට පෙර ජාතියේ නාගදීපයේ මනුෂ්‍යයෙකුව ඉපිද සිටියේය. එකල කිරිපලු වෘක්ෂයක් යට වැඩසිටි දන් වළඳන පසේ බුදුවරයන් වහන්සේලා දැක උන්වහන්සේලාට පාත්‍ර පිරිසිදු කරගන්නට කොළ කඩා දුන් පින් බලේ මිනිස් තෙමේ දෙව්රම් වෙහෙරේ කිරිපලු රුකෙහි දෙවියෙකුව උපන්නේය. මහා වංශයට අනුව අපට ඉහත කතා ප්‍රවෘත්තිය දැක්වීමට පුළුවන.

මෙම චූලෝදර මහෝදර යුධ ගැටුම සංසිඳවීම සඳහා බුදුරජාණන් වහන්සේ නාගදීපයට වැඩම කොට අහසෙහි සිට එම යුධබිමට වැද සිට දෙපසෙහි නාගයන් බිය ගන්වනු සඳහා මහත් ගන අඳුරක් මැවූහ. නාගයන් බියෙන් හැකිලී සිට ආලෝකයක් මවා සොම්නසට හා සැනසීමට පත් නාගයෝ සර්වඥයන් වහන්සේ දැක බුදු සිරිපා කමල් වැන්දාහ. ලෝක නාථයන් වහන්සේ චූලෝදර මහෝදර නා රජුන් දෙදෙනා ප්‍රමුඛ දෙපක්‍ෂයේ පිරිස සමඟි කරවීමට සමත් ධර්මයක් ඔවුනට දේශනා කළහ. සසර ආදීනව, මක්ඛ පලාසාදීන්ගේ ආදීනව, කාකොලූක ජාතකය, එන්දක ජාතකය, ලටුකික ජාතකය, .වට්ටක ජාතකය, යන තමේවායින් වෛර කිරීමෙහි ඇති දෝෂයන් හා සමගිකමේ අනුසස්ද ප්‍රකාශ කරමින් බුදුහු අවවාද දුන්හ. පසුව යුධ වැදි සිටි නාරජුන් දෙදෙනා ධර්ම කතා ශ්‍රවණයෙන් අපමණ ප්‍රීතියට පත්ව යුද්ධයට හේතු වූ මිණි පළඟ තථාගතයන් වහන්සේට පිදුහ. අහසින් බැස එහි වැඩ හුන් සර්වඥයන් වහන්සේ නාගයන් විසින් පිළිගන්වන ලද දිව්‍ය ආහාර පාන වළඳා අවසන අසූ කෝටියක් නාගයන් තිසරණ පන්සිල්හි පිහිටුවා පාරිභෝගික චෛත්‍යයක් වශයෙන් වැඳුම් පිදුම් කරනු පිණිස කිරිපලු රුක හා මිණි පළඟ නාගයන්ට පවරා දී සැවැත් නුවර දෙව්රම් වෙහෙරට පෙරළා වැඩියහ.

තවද බක් පොහෝ දිනය තුළ සිදුවූ විශේෂ සිදුවීමක් ලෙස සිද්ධාර්ථ, කුමාරයට සතර පෙර නිමිති පහළ වීමද දැක්විය හැකිය. විසිනව වසක් සපිරි සිදුහත් මහබෝසතාණන් වහන්සේ උයන් ක්‍රීඩාව සඳහා පොහෝ දින ගමන් කරද්දී පළමු කොට ජරා (මහලු) රූපය දැක ඇත්තේ බක්මහ පුන් පොහෝ දිනයකය. ඊට අමතරව බුදුරජාණන් වහන්සේගේ කිඹුල්වත බලා මැදින් පුන් පෙහෝදා ගමන් අරඹා පිළිවෙලින් පියවි සිහියෙන් ගමනින් යොදුන් තිහක් ගමන් මාර්ගය අවසන් කිරීම සිදුවූයේ බක්මහ පුර පසළොස්වක පොහොය දිනයකය.

ඓතිහාසික වශයෙන් ලක්වැසියාට වැදගත් මෙම සිදුවීම් මාලාව තුළින් අවුරුදු දෙදහස් ගණනකට පෙර ලංකාවේ සිදුවූ ඓතිහාසික, පෞරාණික, ශාසනික පුරාවෘත්තයන් අපට සිහිපත් කරවනු ඇත. මෙබඳු ඓතිහාසික සිද්ධියකින් ශ්‍රේෂ්ඨත්වයට පත් බක් පොහොය බෞද්ධයින්ට මහත් ප්‍රීතියක් උපදවන දිනයකි.

විශේෂයෙන් චූලෝදර මහෝදර නාරජුන් යුද්ධ කොට බෙදා ගැනීමට ගිය මැණික් පුටුව කැළණි චෛත්‍යයේ නිධන් කර ඇති බවවංශකතා ඇසුරින් පැහැදිලි වෙයි. ඒ අනුව බක් පොහොය තුළ ලක්වැසියාට වන්දනා මාන කිරීමට ඇති පූජනීයම වස්තුවකක් ලෙස කැළණි චෛත්‍ය නම් කළ හැකිය. ලක්වැසියාට පමණක් සීමා නොවූ මුලු මහත් ලෝක වැසියාගේම මුදුන් මල්කඩක් බඳු කැළණි දාගැබ ධාන්‍යාකාරයෙන් නිර්මිත උත්කෘෂ්ඨ කලා කෞෂ්‍යයකි.

''උපන්දා සිට කරපු පව් නැත වරක් වැන්දොත් කැළණියේ''

යන පාඨය පවා ව්‍යවහාරයේ පවතින්නේ ඒ තරමටම පින් උපදවන උල්පතක් හැටියට කැළණි දාගැබ තුළින් හමන බුදු දහමේ සඳහම් පණිවුඩය මිනිස් හදවතට සම්පවන බැවිනි. හෙළ කලා කරුවාගේ සුවිශේෂී නිර්මාණයක් හැටියටත් දුර්ලභ ගණයේ ස්ථූපයක් හැටියටත් කැළණි දාගැබ සුප්‍රකටය. ලක්වැසි බැතිමතුන්ගේ මුදුන් මල්කඩත් බදු කැළණි දාගැබ වන්දනා මාන කිරීම පිණිස නොයෙක් බැතිමතුන් දිනපතා පැමිණෙනු ඇත. එයින් හමනා සදහම් සිසිල දුකට පත් සැමගේ සිත් සතන් සුවපත් කරනු ඇත. සිත් සතන් අවුල් වූ ඕනෑම කෙනෙක් කැළණි ස්ථූපය ලඟට යන්නේ නම් සිතට කියා නිම කළ නොහැකි සහනයක් දැනෙනවාට කිසිදු සැකයක් නැත.

ඓතිහාසික වශයෙන් වටිනාකමකින් යුත් මෙම සිදුවීම තුළින් අපේ පැරණි ශිෂ්ඨාචාරය, සංස්කෘතිය පිළිබඳ කරුණු අනාවරණය වේ. එවකට සිටි මෙම නාග ගෝත්‍රිකයින් මනුෂ්‍ය කොටසක් වූ අතර ඔවුන් අතර සුළු සුළු අඩුපාඩුකම් තිබුණු බවද සඳහන් වේ. ඔවුන් යුද්ධයකට අවතීර්ණ වූයේද එම හේතුවෙන් බව අපට විශ්වාස කළ හැකිය. එසේ වුවද ඔවුන් තුළ තිබුණු උසස් ගුණ ධර්ම ඉස්මතු කරදීමට බුදුරජාණන් වහන්සේට හැකිවිය. බුදුරජාණන් වහන්සේගේ ලංකාගමනය තුළින් ධර්මය ස්ථාපිත නොවන්නට ඇත්තේද එවකට ජීවත්වූ ලක්වැසියාගේ නොදියුණුකම හේතුවෙන් බව සිතිය හැකි කරුණකි. එසේ වුවද මේ උතුම් බක් අව අමාවක් පොහෝ දිනය ලක්වැසියන් වන අප සැමදෙනාටම ඒ ඓතිහාසික සිදුවීම් සිහියට ගෙන ගුණධර්ම අතින් පෝෂිත උසස් මනුෂ්‍ය චර්යාවන්ගෙන් සැදුම් ලත් පිරිසක් වීමට පුළුවන් කමක් ඇත. ඒ උතුම් බක් පොහෝ දිනය තුළ අපි ශ්‍රේෂ්ඨ මිනිසුන් වීමට අධිෂ්ඨාන කර ගනිමු.

ශ්‍රී ඉන්ද්‍රසුමන මහ පිරිවෙන්හි
ප්‍රවීණාචාර්ය, ප්‍රවචන කීර්ති ශ්‍රී ලේඛණ ශාස්ත්‍රී
ගෞරවාර්හ ගලගෙදර රතනවංශ ස්ථවිර

රංගිරි ශ්‍රී ලංකා RSL NEWSPAPER

රංගිරි - ශ්‍රී ලංකා මාධ්‍ය ජාලය
රංගිරි දඹුල්ල සංවර්ධන පදනම,
අංක 130, දඹුල්ල.

දුරකථනය: 066-2283606 (දිගුව 161) හෝ 071 5361328
ෆැක්ස්: 066-2284603
ඊමේල්: rangirinewspapers@gmail.com
වෙබ් අඩවිය: www.rangirisrilanka.lk

## "සමගියම යහපති"

මානව සමාජය තුළ තිබිය යුතු උසස්ම ගුණය සමගියයි. කුඩාම සමාජ ඒකකය වන පවුලේ සිට අන්තර් ජාතික සබඳතා දක්වා සමගිය බලයක් ලෙස කැපී පෙනෙයි. සමගියට සාමය එක්වූ කල්හි සහජීවනය නම් වඩාත් උතුම් සමාජ ගුණ ධර්මය ඇතිවෙයි. "සමවායො එව සාධු" ලෙසින් සමඟියම යහපති යැයි බුදුරජාණන් වහන්සේ වදාළේ ඉන් මිනිස්කමේ උදාරත්වය ප්‍රකට කරන හෙයිණි.

ඉතා සුළු දෙයින් පවා කිපෙන මිනිසා සමාජයට මහත් විපත් සලසයි. වෛරය, ක්‍රෝධය, ඉතා පහත් ගති ලක්ෂණ ලෙස බුදුරජාණන් වහන්සේ විසින් බොහෝ විට උගන්වනු ලැබ ඇත. අවිශ්වාසය, වාද විවාද ඇතිවීම, ගැටුම යනාදියද සහජීවනය බිඳ දමන කාරණා වෙති.

වර්තමාන සමාජ ක්‍රමය, ආර්ථික මෙන්ම දේශපාන ක්‍රමයද සැකසී ඇත්තේ සාමය, සමගිය මෙන්ම සහජීවනයද බිඳ දමන සංකල්පනා මුල් කොටගෙනය. ඒ තුළ හොදහැටි වෛරය තිබේ. ඒ තුල හොද හැටි ඊර්ශ්‍යාව තිබේ. එවන් සමාජයක් නිරතුරුව ගැටුම් වලින් බහුලය.

දැහැමි සමාජයක පදනම පන්සිල් සුරැකීමය. අන්‍යන්ට ගරු කිරීම, අන්‍යන්ගේ දේපල, වස්තුව ආරක්‍ෂා කිරීම කාමයෙන්, මුසාවෙන් ඈත්වීම මෙන්ම මත්ද්‍රව්‍ය භාවිතයෙන් මිදීම තුළින් සහජීවනය ගොඩනැංවෙයි. අහිංසාවාදී සමාජයක් බිහිවන්නේ එලෙසිණි. බුදුරජාණන් වහන්සේ "අත්තූපනායික ධර්ම පර්යාය" තුළින් පෙන්වාදෙන්නේ ද තමන් උපමා කොට අන් අයට හිංසා පීඩා කිරීමෙන් වැළකී සිටීය යන්නය. මෙය සෑම පුද්ගලයෙකුගේම ආදර්ශ පාඨය විය යුත්තකි. සෑම පුද්ගලයෙකුගේම දැක්ම විය යුත්තකි.

සහජීවනය සඳහා හේතුවන තවත් උසස් ගුණයක් වන්නේ ඉවසීමය. ඉවසීමෙන් ලැබෙනුයේ සැනසීම පමණක් නොවේ. ආත්ම විමුක්තිය ලැබීමේ මාර්ගය විවෘත වන්නේද ඉවසීම තුළිණි. බෝසත් කතා පුවතම ඉවසීම පිළිබඳව අපට බොහෝ පාඩම් කියාදෙයි.

වර්තමාන සමාජ ක්‍රමය තුළ අන් කිසිවෙකුගෙන් වත් සාමය, සමඟිය, සහජීවනය හෝ ඉවසීම පිළිබඳව අවවාද හෝ ආදර්ශ ලැබිය නොහැකිය. සිහිකළ හැකි එකම මාර්ගෝපදේශකයා බුදුරජාණන් වහන්සේ පමණය. එබැවින් බුදුන් වදාළ මාර්ගය අනුගමනය කොට ජීවිතය යහපත් කරගැනීම තම තමන් විසින්ම කරගත යුතුය.

සමස්ත සමාජ දේශයම අපට පෙන්වා දෙන්නේ අයහපතය. දුසිරිතය ගැටුම්කාරිත්වය සහ ප්‍රචණ්ඩකාරිත්වයයි.

එයින් මිදීමත් දැහැමි දිවි පෙවෙතකට යොමුවීමත් අප සතුය. ජීවන විමුක්තිය සලසා ගැනීම මෙන්ම ලෞකික සන්තෘෂ්ඨිය සලසාගැනීමද අප විසින්ම උපයාගත යුතුය.

අද දහම් පත පොත බහුලය. සියලුම විද්‍යුත් සහ නව මාධ්‍යන් තුළින්ද බුදු දහම අධ්‍යයනය කළ හැකිය.

අපට මඟපෙන්වීමට අපව යහමඟ කියාදෙන්නට සර්ව බලධාරී දෙවියෙකු නොමැති බව බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත. මේ ගෙවී යන අවුරුද්දේ මෙන්ම උදාවන අලුත් අවුරුද්දේ ද මේ කෙටි පණිවිඩය වඩාත් සිහියට ගන්නේ නම් මැනවි.



## තමා කළ නොකල දේ ගැන සොයමු



. වසරක් ගෙවිලා නව වසරක් උදාවෙනවා. හෙළයේ මහා මංගල්‍යයක් ලෙස හඳුන්වන තවත් මංගල්‍යයක් මේ බක් මාසෙදි අපි සමරනවා. හැමදාම හැමදේම අලුත් වෙන මේ කාලයේ අපිත් අලුත් අවුරුද්දට අලුත් වෙනවා. ඒ ගෙවල් දොරවල් වටපිටාවන් අලුත් කරගෙන අලුත් ඇඳුම් පැලඳුම් සොයාගෙන. ඒත් අපි සිරිත් විරිත් වලින් මෙන්ම සිතුවිලි වලිනුත් අලුත් විය යුතුයි කියලා මට සිතෙනවා. කොයිතරම් බාහිරින් අලුත් වුවත් සිතුවිලි වලින් අලුත් වෙනවා නම් එක තමයි අලුත් අවුරුද්දේ හොඳම අලුත්වීම. දැන් අපිට අලුත් අවුරුදු ආව කියලා දැනෙන්නෙ ජන මාධ්‍යයෙන් වෙන්න ඇති කියලත් හිතෙනවා. අද වෙනකොට අපේ සමාජයේ බොහෝ දෙනෙකුට පරිසරයේ තියෙන අලුත් බව පේන්නෙ නෑ. ඒ තරමටම මිනිසුන්ට විවේකය, නිදහස කියන දේ නවීකරණය වුණ සමාජය විසින් ගිලගෙන.

එදා පාර දෙපැත්තේ රතුපාටට පිපිලා තිබුණ එරබදු මල් වෙනුවට දැන් තියෙන්නෙ උසම උස විදුලි කම්බි ඇදපු කණු. දැන් කොහාටත් අවුරුදු ආවා කියලා අමතක වෙලාද කියලත් හිතෙනවා. දැන් කොහා අඩන්නෙත් ගුවන් විදුලියෙයි රූපවාහිනියේ විතරයි කියලා තමාටම හිතෙන්නේ. ගම්මානයේ නම් තාමත් කොහා අඩනවා ඇති. ඒ වුණත් දැන් ඒ අවුරුදු සිරිය ටිකෙන් ටික අඩු වෙනවා වගේ දැනෙනකොට මොකද්දෝ දුකක් හිතට දැනෙනවා. අපේ ගැමියො අවුරුද්දට කීවේ දොළොස් මහක් ගෙවෙන දවස කියලා. ඉතින් මේ දවස්වලට අවුරුද්දක් පුරාවට නෑදෑ හිත මිතුරන්ගෙ තිබුණ සිත් අමනාපකම් නැති කරගන්නත් තියෙන නෑදෑ හිතවත්කම් තවත් වැඩි දියුණු කරගන්නත් මේ සිංහල අලුත් අවුරුද්දෙ අපිට හැකියාව ලැබෙනවා. බුලත් අතක් දීලා දෙමාපියන් වැඩිහිටියන් නමදින්නට තියෙන්නෙ මේ අවුරුද්ද සිනාවකට, වචනයකට කරන්න බැරි මහා ආශ්චර්යක් බුලත් අතකට කරන්න පුලුවන්. කෙනෙකුගෙ සිතක් මෘදු කරන්නට බුලත් අතක් දීලා දෙපා නැමදීම තරම් තවත් දෙයක් නැති තරම්.

ඒ වගේම තමයි මිනිසුන් අතර එකමුතුකම සමගිය ඇති කරන්නත් මේ බක් මාසේ ප්‍රයෝජනවත් වෙනවා කීවොත් නිවැරදියි. දැන් දැන් ඉක්මහ උළෙල කියලා විශාල උත්සවයක් පවත්වලා සමගි සම්පන්නව ජය පැරදුම බෙදා ගන්න ක්‍රමයකුත් තියෙනවා. ඉතින් මේ වාගේ තැන්වලදි තමයි අපිට රබන් පද, ඔන්චිලි වාරම්, ඔලිඳ කෙළිය, එලුවන් කැම වගේ සිංහල ක්‍රීඩා දකින්නට ලැබෙන්නෙත්. එයිනුත් අපේ සිංහලයාගේ සමගි සම්පන්නකම පෙන්නුම් කරනවා වගේම අද ටිකෙන් ටික වැළලී යන මේ ක්‍රීඩා දැන ගන්නට රැකගන්නටත් මනා පිටිවහලක් වෙනවා.

මම කලින් කිව්වා වගේ දොළොස් මහක් යන දවසේ මේ ටිකත් කිව්වොත් හොඳයි කියලා මට සිතුණා. අපි හැමෝම සිංහල බෞද්ධ පිරිසක්.
ඒ නිසාම අපි දන්නවා අපි අහලා තියෙනවා බෞද්ධයාගේ අත්පොත කියන්නෙ ධම්මපදය කියන පොතට කියලා. ඒ පොතේ තිබිලා මට ලැබුණා මෙන්න මේ මගේ ලස්සන ගාථාවක්.

**නපරේසං විලොමානි**
**නපරේසං කතාකතං**
**අත්තනාව අවෙන්බෙය්‍ය**
**කතානි අකතානිච**
(ධම්මපදය පුප්ඵ වග්ගය - 7 ගාථාව)

ඉතින් ඒ ගාථාවෙන් කියවෙන විදියට අනුන්ගේ රළු පරලු කතා හා කළ නොකළ දේ ගැන නොසෙවිය යුතුය. තමාම කළ නොකළ දේ ගැන සෙවිය යුතුය.

කියා තමා පැවසෙන්නේ. ඉතින් මේ අවුරුද්දෙ අපි කියන කරන සෑමදෙයකටම හොඳින් හිතා මතා ක්‍රියා කළොත් යහපත් යැයි සිතෙනවා. අද සමාජය විවිධයි. විෂමයි. ඉතින් ඒ සමාජයේ විවිධාකාරවූ මිනිස්සු ජීවත් වෙනවා. ඒ නිසාම අපි ඒ මිනිසුන් අතරම ජීවත් වෙලා ඒ පිරිසත් එක්කම වැඩ කටයුතු කරන්න සිදුවෙනවා. ඒ නිසාමෙ අපිටත් නොයෙක් පුද්ගලයන් ඇසුරු කිරිමටත් ලැබෙනවා. අපේ බුදුහාමුදුරුවොත් දේශනා කරලා තියෙනවනේ පරලොව මෙන්ම මෙලොව දියුණුවටත් හේතු වෙන කරුණු විශාල ප්‍රමාණයක්. ඒ වගේ සමාජයේ අපිට ජීවත් වෙනකොට ඉතින් තමන්ගේ කතා ගැන තමන් ගැන සොයා ගැනීම තමා වැදගත් වෙන්නෙ.

අනුන්ගේ කථා, ගුණ අගුණ සෙවීමට ගිහින් ගොඩක් ගැටලු ඇති කරගන්නවාට වඩා මේ බුදු වදනින් කියවෙන අන්දමට අනුන්ගේ රළු පරළු කතා කළ නොකළ දේවල් ගැන සෙවීමට වඩා තමන්ගේ දේ ගැන සොයාගෙන මේ සිංහල අවුරුද්ද සෞභාග්‍යමත් අවුරුද්දක් කරගැනීමට ඉටා ගනිමු.

එස්. දිල්රුක්ෂි අබේකෝන්

# සඳ සිසිල

සංස්කාරක
"සඳ සිසිල"
රංගිරි ශ්‍රී ලංකා පුවත්පත
අංක 130,
නුවර පාර,
දඹුල්ල.

## කිඹුල්වත් පුර ගමන

කිඹුල්වතින් එන සුලගේ සිසිල් බවයි
ඥාතීන් වෙතට බුදු හිමියන් වැඩිය දිනයි
දෙසුවේ දහම් රසයෙන් සැම දෙන පිනවයි
සසර දුක් නිවාලන මඟ හෙළි කෙරුවයි

වයසින් වැඩි අයත් දරුවන් ලවා වැඳ
මානෙන් උදම් වී සිටි සතියක් මැදට වැද
යමාමහ පෙළහරක් පෑවේ අහසෙ ඉඳ
රැස්ව සිටි සැවොම වැන්දේ සාදු නඳ

දහස් ගණන් ජනයා රැස්වී එතන
වදිමින් සරණ ගියෙ බුදුහිමි සිටින තැන
ශාක්‍යයන්ගේ මානය නැතිවී නිතින
කිඹුල්වත් පුරය බැබලුනි බුදුහිමි රැසින

**විජය තලවත්තේ ගෙදර**

## දහමට අනුව සිතන්න.

බුදු බව ලබා ලොව සතහට දෙසූ බණ
පසක් කරවු බව දැනෙනා කෙළෙහි ගුණ
බුදුබව ලබන්නට පිහිටවූ බෝ සෙවණ
කළගුණ සැලකුවේ දහමට අනුව යන

කල්ගත වන විටදි කළ සේවය අමතක වේ
සත් පුරුෂයන් හට එය එලෙසින් නොම වේ
කළ සේවයට නිති ඇගැයීමක් කළ යුතුවේ
එවිට දහම සැමදා අප අතරම වේ

සත් පුරුෂයන් අප අතරද සිටිනු පෙනේ
එය අප සැනසීමටද එක් හේතුවක් ගෙනේ
දුර්ජන සිත් සතන් දුරුකර සිතට දිනේ
උතුම් දහම් ගුණයට නිති සිහි කරනු මැනේ

වෛරය ක්‍රෝධයෙන් සත සිත වනසන්නේ
මෙත් බව උතුම් යැයි දහමෙහි දැක්වෙන්නේ
කිසිදු පලක් නැති වචනය ඉවතට ලන්නේ
පුහුදුන් ලොවේ ජය ගැනුමට එය ඉවහලක් වන්නේ

**අජන්තා ශිරෝමණී දිසානායක**

## මා දුටු සමාජ කතර

අඳුරු කතරේ හමුවේ....
නොයෙක් මුහුණු හමුවේ
නොයෙක් දසුන්,
එක් කරයි නොයෙක් සිතුවිලි,
සිතෙහි කැලඹෙයි මෙලෙස
කොපමණ උත්සහ දැරුවත්,
සිතා ගැන්මට නොහැකිය....
කුරිරු සමාජය....
විටෙක විෂ සහිතය,
විටෙක විෂ රහිතය,
පෙරාගත නොහැකි චිත්ත රූපයක්....
කැළඹෙයි ගත සිත පුරා....
උඩුදුවයි මෙලෙස හද සිසාරා....
සමාජ කතර,මා නොසිතු නොවිරූ
අමුතු ලොවක් බදුය,
ගැටළු සහිතයි,
ගැටළු රහිතයි,
නමුත් ජිවිත අත්දැකිම් බොහොමයි,
ජිවිත මඟ සරු කරගැන්මට,
ඒ දණ්ඩක් බදුය,
විටෙක මා සිත පවසයි....
මෙලෙස හොඳ නරක වෙන් කර
ගැනීම,
තමා මත රදා පවතියි,
මා දුටු සමාජ කතර එයයි....

**සෙනාලි මධුෂිකා අඹගස්පිටිය**

## මව් තුරුලෙ සැනසෙන්න ආයෙ එන්නෙ කවදාද?



වෙල් එළියෙ දුව පැන්න
වැලි කෙළිය සිත යැව්ව
මව් තුරුලෙ සුව වින්ද
මතකයිද ඒ සමය

සිතින් සන්සුන් වෙලා
ගතින් සංවර වෙලා
මව් තුරුලෙ සැනසෙන්න
ආයෙ එන්නෙ කවදාද

බෝ මලුවෙ සිසිලසට
බුදු හිමිගෙ දයාවට
කහ සිවුරෙ බැදීමට
නිවී ඇත ඔබේ සිත

උදලු කෙටියක් අරන්
අප්පච්චිගෙ තනියට
එදා වගෙ ආයෙ යන්න
බෑ නේද පොඩි සමිඳු

අනේ මගෙ මල්ලියේ
කියන්න ආසයි
ඒත් අද ඔබේ සිත
සන්සුන්ය, සුපසන්ය

සතර වග දුකින් මුදවා
බණ පදයක් සනසන්න
බුදුහිමිගෙ පා මුලේ
සැනසෙමුද සැමකල්මසතර වග

දුකින් මුදවා
බණ පදයක් සනසන්න
බුදුහිමිගෙ පා මුලේ
සැනසෙමුද සැමකල්ම

දුක් නිවා සැනසෙන්න
මතු භවයෙ එක්වෙන්න

**දිල්රුක්ෂි අබේකෝන්**

## වස්සාන ගීතය...

වස්සාන ගිතයක හඩ ඇසි
බැලුවෙමි
සිරි සිරිය හරි මෑදුව හදවතට
සුව දැනුණි
මේඝ ගර්ජනාවෙන් කම්පිතව
සලිත වෙමි
වස්සාන ගිතයේ සප්ත ස්වර
නිහඬවුණි

පිපුණු මල් සියුම් පෙති තටු
අගින් හිළිහුණා
ළදළුපත් නෙතු දුකින් හිස නවා
වැළපුණා
මහ පොළොව මහා හඩින් මහ
ඝොවින් වැළපුණා
වස්සාන ගිතයේ සප්ත ස්වර
ගොළුවුණා

හෙමි හෙමින් සිසිලසින් සනසවා
පිවිතේ
නිල තණ පළස මත සතපවා
පිවිතේ
පොද වැස්ස හාදවී සමග සැඩ
මාරුතේ
අනේ අප හැඬෙව්වා නොවෙද
ඔබ හාමතේ

එම්. සිරිධම්මචාරි
මෙහෙණින් වහන්සේ




## දඹුලු ලෙන් විහාරය

ගලෙන් නිම වූ ලෙන් වෙහෙරය මෙයයි අපේ
ඈත එපිට මිනිසුන් මෙහි ඇදෙයි මේ කපේ
වැව සිරියා මෙන්ම මේ පුද බිම ලැබෙයි ඔපේ
සිරිබර වෙයි රංගිරි දඹුලු ලෙන් වෙහෙර අපේ

වැව මත රැලි මැදින් සුළඟයි මේ එන්නේ
බෝ මළුවේ මල් සුවදයි විහිදෙන්නේ
බුදු හිමියන්ගේ කරුණාවයි පැති රෙන්නේ
දඹුලු විහාරය දින දින ලෝ බැබලෙන්නේ

දසතම පිපි මල් සුවඳින් පිබිදෙන්නේ
පොහොය දිනට සුවදයි පැතිරෙන්නේ
බෝ සෙවණේ අප නිරතුරු රැඳෙමින්නේ
සඟ මොක් සුවය ලැබ ගැනුමට වෙහෙසෙන්නේ

**එම්. එන්. දිල්රුක්ෂි පෙරේරා - කණ්ඩලම**

# බුදු පිළිමයෙන් පිළිබිඹු වන මුද්‍රා



අප මහ බුදුරජාණන් වහන්සේ **මෙත්තා,කරුණා ,මුදිතා, උපේක්‍ෂා** යන ගුණාංග නිරූපණය කරලීමට උන්වහන්සේ කායික ලක්‍ෂණයන් උපයෝගී විය.

සාමාන්‍යයෙන් අප කිසියම් නිර්මාණයන් දෙස සුපරීක්‍ෂාකාරීව බලා සිටියදී ඒ තුලින් අප සිතට කිසියම් හැඟීමක් ජනිත වේ නම් එය සාර්ථක නිර්මාණයක් වන්නේය. බුද්ධ ප්‍රතිමාව එවැන්නකි. අද්විතීය බුද්ධ ප්‍රතිමාවක දක්නට ලැබෙන මුද්‍රාවන් පිළිබඳව තවදුරටත් විමසා බලමු.

ශීල, සමාධි, ප්‍රඥා වැඩීම තුලින් සිත එකඟකර ගැනීම බුදු දහමේ ඉගැන්වෙන මූලික කරුණු බව අප දනිමු. බුද්ධ ප්‍රතිමාවෙන් ඒ හැඟීම් දනාණය වීම නිරූපණය විම සිදුවී ඇත. එය චිත්‍රකලා ශිල්පීන්ගේ දක්‍ෂතාවය වුවද ඒ අය බෞද්ධ ප්‍රතිමා චිත්‍ර නිර්මාණයේදී නියමිත සංඥා (මුද්‍රා) උපයෝගී කොට ගෙන ඇත. අප ඒ පිළිබඳව තවදුරටත් විමසිලිමත් වෙමු.

### I.**ධ්‍යාන මුද්‍රාව**

සමාධි ධ්‍යාන මුද්‍රාව නමින්ද හඳුන්වනු ලබන සමාධි මුද්‍රාව යන්න සමාධිය චිත්ත ඒකාග්‍රතාවයයි. එනම් ශීල,ප්‍රඥා යන දෙකෙහි ප්‍රතිමූර්තියකි. අප රටේ පවතින පිළිමවල වැඩි වශයෙන් දක්නට ලැබෙන්නේ ධ්‍යාන මුද්‍රාවයි. අනුරාධපුර මහමෙව්නා උයනේ නෙලා ඇති සමාධි පිළිමය ඒ සඳහා වන හොඳම සාධකයකි.

### II. **අභය මුද්‍රාව**

අභය මුද්‍රාවද ඉතාම ජනප්‍රිය මුද්‍රාවක් වශයෙන් විද්වතුන් පිළිගනිති. මේ තුලින් ඔප් නැංවෙන්නේ නිර්භයවය හා දානය බව පැවසේ. බුදුරජාණන් වහන්සේ සසරභය දුරුකර නිර්භයබයට පත්ව ඇති බව විද්වතුන්ගේ මතය වී ඇත. උන් වහන්සේ නිර්භයබය පෙන්වීමට බෞද්ධ සාහිත්‍යයේ ජාතක කථා තුලින් ඕනෑතරම් උදාහරණයක් ඇත.

අභය මුද්‍රාවේ දකුණත ඇඟිලි දිගහැර ඉදිරියට ඉදිරියට පා සිටින අතර වමත වැලමිට ලඟින් ඔසවා පසුපසට හරවා තබාගෙන ඇත. උදාහරණයක් ලෙස බුදුරුවගල හිටි පිළිමය වෙහෙරගල හිටි පිලිමය ආදී පිළිමතුලින් ඒ ලක්ෂණයන් නිරූපිතවී ඇති බව පැහැදිලිය.

### III. **වරද මුද්‍රාව**

වරද මුද්‍රාව තවත් ලක්‍ෂණයකි. බෞද්ධ ග්‍රන්ථයන් තුළින් මෙම මුද්‍රාව විග්‍රහ වන්නේ වරදාන හා දාන නමින්ය. දකුණත් පහත්කොට ඇඟිලි දිගහැර අත්ල උඩු අතට හරවා තිබීමත් වන අතර වමත මැදින් උඩට නමා ඇඟිලි විහිදුවා සිටින ආකාරයක් මෙයින් පෙනේ.

බුදුන් වහන්සේ වෙත පැමිණෙන්නාවූ තැනැත්තන්ට වරදීමට උන්වහන්සේ තුල පැවති ආශ්චර්යමත් බව මින් අදහස් කරන බව විද්වතුන්ගේ මතය වී ඇත. වරද මුද්‍රාවේ උන්වහන්සේගේ මහා කරුණා ගුණය නිරූපණය වන බව අප දකින්නෙමු. ගඩලාදෙණියේ ඇති ලෝකඩ ප්‍රතිමාවෙන් මෙම මුද්‍රාව දර්ශනය වුවත් බුරුමය ඉන්දුනීසියාව වැනි රටවල පවතින ඇතැම් බුද්ධ ප්‍රතිමා වහන්සේලා තුලින් මෙම මුද්‍රාව ප්‍රතිරූපණය වන බව බෞද්ධ පොත්පත් වලින් පැහැදිලි වෙයි.

### IV.**ධර්මචක්‍ර මුද්‍රාව**

ධර්ම චක්‍ර මුද්‍රාවෙහි දකුණු අත්ල පිටතට හරවා පපුව මට්ටමෙහි තබාගෙන මාපට ඇඟිල්ලේ කුඩා කවයක් සෑදෙන පරිදි එකට තබා ඇතුලට හැරුණු වම් අතේ ඇඟිල්ලක් ස්පර්ශ කරන ආකාරයයි. මෙම මුද්‍රාව තුලින් පෙන්වා දෙන්නේ බරණැස මිගදාය නුවර ඉසිපතනාරාමයේදී පවත්වන ලද 'ධම්මචක්කපවත්තන සූත්‍රය' දේශනා කල අවස්ථාවේ බව කියැවේ.

බුදුරජාණනන් වහන්සේ තමන් වහන්සේ අවබෝධ කරගත් 'ධර්ම ආඥා චක්‍රය' කෝටියක් සක්වල පවත්වන ආකාරය මෙයින් පෙන්නුම් කරන බව විද්වතුන්ගේ මතය වී තිබේ. එමෙන්ම මෙම මුද්‍රාව බෝධි සබ ප්‍රතිමාවල දැක්වෙන බවද කියැවේ. භූමි ස්පර්ශ මුද්‍රාව වෙතට ඊළඟට යමු.

### V.**භූමි ස්පර්ශ මුද්‍රාව**

බෞද්ධ සාහිත්‍යයෙහි එන මාර පරාජය මේ මුද්‍රාව තුලින් කියැවෙන බව අදහස් කරයි. උන් වහන්සේ බුදුවීමට පෙරාතුව දානාදී පාරමිතා සම්පූර්ණ කිරීම මහපොළොව සාක්ෂියක් බවට දක්‍ෂිණ හස්තය පොලොවට දිගු කිරීම මේ තුළින් ප්‍රකාශිත වන බවත් උගතුන්ගේ මතය වී ඇත. දකුණු ඉන්දියාව, ඉන්දුනීසියාව, තායිලන්ත සහ ලාඕස් යන රටවල බුදු පිළිම නිර්මාණයේදී භූමි ස්පර්ශ මුද්‍රාව යොදා ගන්නා බව බෞද්ධ ග්‍රන්ථයන්හි සඳහන් වේ.

### vi.**විතර්ක මුද්‍රාව**

මෙයද ප්‍රතිමා නිර්මාණයේදී එක්තරා ලක්‍ෂණයකි. දකුණු අත මාපට ඇඟිල්ල හා දබර ඇඟිල්ල එකතු කොටගෙන ගැටළු විසදාලීමේ ස්වරූපයක් මෙයින් පිළිබිඹු වන බව සඳහන් වේ. ඉතිරි ඇඟිලි තුන දිගහැර තබා ගනිමින් අත්ල ඉදිරියට විවෘතව තබා ගැනීමත් දක්නට ලැබේ.

මෙම සලකුණු සහිත බුද්ධ ප්‍රතිමා ආසියාතික රටවල පවතින බවත් විශ්ව ශක්තිය හා ප්‍රඥාව එයින් වඩාත් පිළිඹිබු වන බවත් විද්වත්හු පවසති.

### vii.**පරදුක්ඛ දුඃඛිත මුද්‍රාව**

පරදුක්ඛ දුඃඛිත මුද්‍රාව නමින් හැඳින්වෙන මුද්‍රාව පිළිබඳ තොරතුරු සොයා බලමු. මෙය නෙලුම් මලක් මක පා තබා නිමවා ඇති බුද්ධ ප්‍රතිමාවක ආකාරයකි.

බුද්ධ ප්‍රතිමාවෙහි අනිමිස ලෝචන පූජාවේ නිරතවුණු අවස්ථාවක් ලෙස මෙය අදහස් කරයි.

මෙම මුද්‍රාවේ වැලමිටෙන් නවාගත් දෙඅත එකක් අනෙතට සිටින ලෙස ලය මත තබාගෙන සිටින අයුරු දක්වා ඇත.

පොලොන්නරුවේ ගල් විහාරයෙහි හිටි පිළිමයෙහි මුද්‍රාව උදාහරණයක් ලෙස පෙන්වාදිය හැකි බව විද්වතුන්ගේ මතය වී ඇත. මෙම මුද්‍රාව පිළිබඳ විවිධ මත එලදරන බවක්ද සඳහන් වේ.

### viii.**ප්‍රතිග්‍රාහක මුද්‍රාව**

ප්‍රතිග්‍රාහක මුද්‍රාව එකකි. පූජාවත්, දානයත්, පූජා භාණ්ඩයත් පිලිගන්වද්දී එය පිළිගන්නා ආකාරය අවස්ථාවට ගැලපෙන පරිදි දෑත් ඉදිරියට දිගුකරන විලාශය දක්වන මුද්‍රාව ප්‍රතිග්‍රාහක මුද්‍රාව ලෙෂ සැලකේ. හිඳගල පිහිටි බෞද්ධ සිතුවම්වල තපස්සුභල්ලුක වෙළඳ සහෝදරයන්ගේ පූජාව දක්වන (බාර ගැනීම) සිතුවම උදාහරණයක් ලෙෂ පිලිගත හැකි අතර මෙවැනි පිලිගැන්වීම් දැක්වෙන අවස්ථා ඉන්දියාවෙන්ද දැකගත හැකි බව විද්වතුන් සඳහන් කරති. කෙසේ වුවද වඩාත් සුපරීක්ෂාකාරීව බුද්ධ ප්‍රතිමා මෙන්ම චිත්‍රවලින්ද ඉහතින දැක්වූ මුද්‍රා ප්‍රතිරූපණය වන පරිදි සකස් කර ඇති නිර්මාණ අප දැක ඇති බව ඔබේ මතකයටද නැගෙනවා නිරනුමානය.

(පොතපත ඇසුරිණි)
පද්මා එන්. කොඩිකාර



# පන්සල හා එහි කාර්යභාරය

පන්සල යැයි කී පමණින් අප හදවත් තුළට නැගෙන්නේ ප්‍රසන්න හැඟීමකැයි ප්‍රකාශ කිරීම අතිශයෝක්තියක් නොවේ. පන්සල තරම් සිංහල බෞද්ධ ජනයාගේ ජන ජීවිතයට බලපෑම් ඇති කළ වෙනත් සමාජ සංස්ථාවක් නැත. 'පවුල් පන්සල් වීම' පිළිබඳව සිංහල භාෂා ව්‍යවහාරය තුළ නිබඳව සඳහන් වෙයි.

පවුල් සංස්ථාව හා පන්සල අතර ඇති අවියෝජනීය සබැඳියාව මින් අර්ථවත් වනවා සේම විවාහ දිවියට ප්‍රවිශ්ට වන පුද්ගලයා තම දිවි පෙවෙත සදාචාරසම්පන්නව ගෙන යා යුතු බව මින් අවධාරණය කෙරේ. මහින්දාගමනයෙන් පසුව සිංහල බෞද්ධ ග්‍රාමය සංවිධානය වූයේ වැවයි . දාගැබයි . ගමයි , පන්සලයි යන චතුර්විධ සංකල්ප කේන්ද්‍රකර ගනිමින් ය.

බුදුන් වහන්සේ බුද්ධත්වයට පත්වුයේ ඇසතු බෝ රුකක් මුලයි. සිය ප්‍රථම ධර්ම දේශනය පැවැත්වූයේ ද ගසක් මුල එලිමහන් ස්ථානයකයි. මුවන් සමූහයා බොහෝ සෙයින් ගැවසෙන මෙම ප්‍රදේශය ''ඉසිපතන මිගදාය'' ලෙස හැඳින්විණි.

බුද්ධ ශාසනයේ ප්‍රථම රහතන් වහන්සේලා හැටනම බොහෝ ජනයාගේ හිතසුව පිණිස, යහපත පිණිස ශ්‍රී සද්ධර්මය දේශනා කරමින් නොයෙකුත් ප්‍රදේශවල සැරිසරන්නට වූ අතර,

1. අරඤ්ඤ ගතෝවා
2. රුක්ඛ මූල ගතෝවා
3. සුඤ්ඤාගාර ගතෝවා

යනාදි ලෙස වන ලැහැබ, ගස් සෙවන, ජන ශූන්‍ය ස්ථාන, සිය වාසස්ථානය කරගත්හ.

කෙසේ නමුත් කාලයාගේ ඇවෑමෙන් භික්ෂූ සංස්ථාව ප්‍රමාණාත්මක ලෙස වර්ධනය විමේ දී ධර්ම ප්‍රචාරක කටයුතු මෙහෙයවනු වස් නිශ්චිත වාස භූමියක අවශ්‍යතාවය ඇති විය. නොයෙක් ප්‍රදේශවල ධර්ම දේශනා පිණිස වැඩම කිරිම කරණකොටගෙන භික්ෂූන් වහන්සේලාට වා,පිත්,සෙම් ආදිය පදනම් කරගත් රෝගාබාධ මෙන්ම ඍතු විපර්යාස නිසා ඇතිවන රෝගාබාධයන්ට ද මුහුණපෑමට සිදුවිය. ස්වභාවික උවදුරුද දුර්ලභ නොවූ අතර වර්ෂා කාලවලදී නොයෙක් ප්‍රදේශවල සැරිසැරීම අන්‍ය ආගමිකයන්ගේ දෝෂාරෝපණයට හේතු විය. මේ නිසා වස්කාලය නිශ්චිත ස්ථානයක ගත කිරීමේ අවශ්‍යතාවය උද්ගත විය. මෙම කාලීන ශාසනික අවශ්‍යතාවය සපුරාලනු වස් රජවරු, මැතිඇමතිවරු, සිටුවරු හා සැදැහැවත් ගිහියෝ වහා පියවර ගත්හ. බිම්බිසාර රජතුමා වේළුවනාරාමය ඉදිකොට බුදුන්වහන්සේට පූජා කළේ ය. අනේපිඬු සිටතුමා ජේත කුමරුගේ ආරාමය මිලයට ගෙන එය ජේතවනාරාමය ලෙස ප්‍රතිසංස්කරණය කොට සසුනට පූජා කළේ ය. විශාඛාවෝ පූර්වාරාමය පූජා කළ හ. මෙම ආරාම භික්ෂූන් වහන්සේලාගේ සුඛ විහරණයට යෝග්‍ය වූ නොයෙක් අංගෝපාංගයන්ගෙන් සමන්විත වූ අතර ඒවා සාමුහික පරිභෝජනයෙන් යුක්ත විය. කෙසේ වෙතත් බෞද්ධ ශාසනය විකාශනයේ දී පසු කලෙක පන්සල් භූමි බවට පත් වන්නේ මෙම ආරාමයි.

අනුබුදු මිහිදු මහරහතන් වහන්සේ ලංකාවට වැඩම කිරිමෙන් අනතුරුව ඉතා කෙටිකලක් තුළදී එවකට පැවති වෙනත් ආගම් විශ්වාස හා පුද චාරිත්‍ර අභිබවනය කරමින් බුදු දහම ව්‍යාප්ත වනු දැකගත හැකි විය. එතෙක් පැවැති සිංහල සංස්කෘතිය සම්පූර්ණ බෞද්ධ සංස්කෘතියක් බවට පත් විය. මේ සඳහා මිහිදු හිමියන්ට බොහෝ උපක්‍රම අනුගමනය කිරිමට සිදු විය. පසු කලෙක පන්සල නිර්මාණය වන්නේත් මෙවන් බෞද්ධ සංස්කෘතියක් තුළ යි.

මහින්දාගමනයෙන් පසුව මිහිඳු හිමියන් ඇතුළු පිරිසට වාසස්ථානය පිළිබඳ ගැටලුවට මුහුණ දීමට සිදු විය. දේවානම්පියතිස්ස රජතුමා මේ අවස්ථාවේ තාවකාලික කුටියක් නිර්මාණය කරදෙන අතර ඒ සඳහා භාවිත කරනු ලැබූ අමු මැටි ගිනිදමා පුළුස්සාගත් බැවින් එම කුටිය 'කාල ප්‍රාසාදය' ලෙස ප්‍රසිද්ධ වූ බවට තොරතුරු මහා වංශයෙන් හෙළිවෙයි. බුදු සමය උදෙසා කරනු ලැබූ මුල්ම ගෘහ නිර්මාණය 'කාල ප්‍රාසාදය' වන අතර ධර්ම ශාලාව හා ලැගුම් ගෙය බවට පත් වූයේ මෙම ගොඩනැගිල්ලයි. දේවානම්පියතිස්ස රජුගේ බෑනා කෙනෙකු වූ අරිට්ඨ කුල කුමරු ඇතුළු පිරිස සසුන් ගත වි ධර්ම දේශනා කිරීමෙන් අනතුරුව බුදු සසුන මෙරට ස්ථාපිත විය. භික්ෂු සංස්ථාව ක්‍රමයෙන් ප්‍රසාරණය වත්ම උන්වහන්සේලාට වාසය කිරීම පිණිස යෝග්‍ය ගල්ලෙන් පිළිසකර කරදෙන්නට සැදැහැවත්හු උත්සුක වූහ. රාජ රාජ මහාමාත්‍යාදීන්, රජ බිසවුන්, ප්‍රභූවරුන් ගම්මුන් ආදීන් මෙම ලෙන් පරිත්‍යාග කළේ භික්ෂූන් වහන්සේලාට දුෂ්කරතාවලින් තොරව ශ්‍රී සද්ධර්මය ව්‍යාප්ත කිරීමේ කාර්යය වඩාත් සාර්ථක කරගැනීම සඳහා ය. කෙසේ වෙතත් මෙම සියලු ලෙන් චතුර්විධ දිශාවන්ගෙන් පැමිණි නොපැමිණි භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් බව බොහෝ සෙල්ලිපිවල සඳහන් ව ඇත.

''තලදර නගහ පුත දෙවහ ලෙණ අගත අනගත චතුදිස සගස''

(වෙස්සගිරිය සෙල් ලිපිය)

සංඝ සංස්ථාව තවදුරටත් ප්‍රවර්ධන වීමත් සමඟම ලෙන් පරිහරණය ප්‍රමාණවත් නොවූ අතර විශේෂයෙන් භාවනුයෝගී භික්ෂූන් වහන්සේලාට මේවා බෙහෙවින් ප්‍රයෝජනවත් විය. අකුසලෙහි වෙළුණු ජනයා ඉන් මුදවාගෙන කුසලයෙහි යොදවනු වස් ගම් නියම්ගම් සිසාරා ජනතාව මුණගැසිමට ඒ සඳහා කාලය වැය කිරීමට අවශ්‍ය විය. පන්සල බිහි වන්නේ මෙවන් පසුබිමක් තුළයි. කෙසේ වෙතත් මෙය නවතම නිර්මාණයක් නොව පැරණි ආරාම භාවිතයේ ම විකාශනයක් බව ප්‍රකාශ කළ යුතුය.

මිහිදු හිමියන් දේවානම් පියතිස්ස රජු සමඟ මහ මෙවුනා උයන මැනවින් නිරීක්ෂණය කොට සිමා මාලකාදී ගොඩනැගිලි ඉදිකිරීමට යෝග්‍ය ස්ථාන ලකුණු කළ අතර මෙම මහාවිහාර භූමිය භික්ෂූන් වහන්සේලාගේ සුඛ විහරණයට අවශ්‍ය බොහෝ අංගෝපාංගයන්ගෙන් සමන්විත විය. ශ්‍රී ලංකාද්වීපය පෙරදිග ථේරවාදී බෞද්ධ මධ්‍යස්ථානයක් බවට පත්වීමේ දී මහා විහාරය මගින් සිද්ධ වු දැවැන්ත කාර්යභාරය පැසසුම් සහගත ය. මෙහි සියලු සම්පත් පරිභෝජනය කරනු ලැබුවේ භික්ෂූන් වහන්සේලා විසින් සාමූහිකව ය.

වළගම්බා රජු දවස එතුමා මුල්වර රජකම අහිමිව පලා යන අවස්ථාවේ 'මහා කලු සිංහලයා පැනයයි' කියමින් රජතුමාට සරදම් කළ ගිරි නම් නිඝණ්ඨයා විසූ අසපුව කඩා බිඳ දමා එහි බෞද්ධ ආරාමයක් ඉදිකොට අභයගිරිය ලෙස නම් කිරීමට වළගම්බා රජතුමා කටයුතු කළේ දෙවන වර බලයට පැමිණීමෙන් පසුව ය. මෙහිදී රජතුමාට වනගතව සිට යුද්ධය මෙහෙය වීමට උපකාර කළ මහා තිස්ස හිමියන්ට කළගුණ සැළකීමක් වශයෙන් එම ආරාමය පෞද්ගලිකව පූජා කිරීමට කටයුතු කළ අතර තිස්ස හිමියෝ ද එය පෞද්ගලිකව පිළිගෙන පරිශීලනය කළහ. මෙයට මහා විහාරික භික්ෂූහු එරෙහි වූහ. කෙසේ වෙතත් මෙවන් පූර්වාදර්ශයන්, මුල් කාලීනව ආරම පොදුවේ පරිභෝජනය කළත් පසු කලෙක ඒවා පෞද්ගලිකව මෙහෙයවීමට අවශ්‍ය පසුබිම සකස් කරන්නට විය. ශ්‍රී ලංකාද්විපය පුරා ගම් නියම්ගම් තුළ පන්සල් ඉදිවන අතර ඒවායෙහි දක්නට ලැබුණේ පොදු සම්පත් පරිභෝජනය තරමක් දුරට වෙනස් වු ස්වරූපයකි.

භික්ෂූ සංස්ථාවේ අසීමිත වර්ධනයත් සමඟ ගම් නියම්ගම්වල ඉදිවූ මෙම සංඝාවාස මුල්කාලයේ නිර්මාණය කරගනු ලැබුවේ කොළ අතු සෙවිලි කිරීමෙනි. මේ නිසා මෙම ගොඩනැගිලි 'පර්ණශාලා' ලෙස හඳුන්වන්නට වූ අතර එය කාලයාගේ ඇවෑමෙන් 'පන්සල' ලෙස සුබෝච්චාරණයට පැමිණ ඇත. මහින්දාගමනයෙන් පසුව ශ්‍රී ලාංකීය ජනතාව ප්‍රධාන කොටස් හතරක් වශයෙන් වර්ග වූහ. එනම්,

1. භික්ෂු
2. භික්ෂුණී
3. උපාසක
4. උපාසිකා

යනුවෙනි.

පෙර කී ආකාරයට මහා විහාරය කේන්ද්‍රකර ගනිමින් දිවයිනේ විවිධ ප්‍රදේශවල ආරාම බිහිවූ අතර ඒවා පන්සල් ලෙස හඳුන්වන්නට විය. පන්සල ඇසුරු කරගෙන ගම විකාශනය විය. ගැමි ජනතාවගේ සෑම අවශ්‍යතාවයකටම පන්සල සම්බන්ධ විය.

අදෘශ්‍යමාන බලවේගයක් මත එල්බ සිටි ශ්‍රී ලාංකික ජනතාව ඒ වෙනුවට රත්නත්‍රයේ ආශිර්වාදය ලබා ගත්හ. ඔවුහු පන්සලේ ඇසුර ලබමින් තෙරුවන් සරණ ගිය බෞද්ධයින් බවට පත් වූහ. පංච ශීලය නිත්‍ය ශීලය ලෙස දිවි දෙවැනි කොට රැකගැනීමට උත්සුක වූහ.

වැවයි දා ගැබයි - ගමයි පන්සලයි නිල්ගොයමයි - කහ සිවුරයි සිංහල ජන සමාජයේ මූලික සංකල්ප බවට පත් විය. ගමේ පන්සල සහ ගැමියන් අතර අවියෝජනීය සබැඳියාවක් ඇති විය.

පන්සල ඉදිකර ගැනීමේ දී භික්ෂූන් වහන්සේලාගේ මූලිකත්වයෙන් ගමේ ජනතාවගේ සාමූහිකත්වයෙන් එය සිදු විය. පොදු

13 පිටුවට.....

ශාස්ත්‍රපති රුවන් ජයවීර

# සල්ලිකාරයන් අතර සැබෑ ධනවතෙක්වන්න



ආහාරපාන වස්ත්‍රාභරණ යාන වාහන ගෙවල් දොරවල් ආදි මිනිසාට අවශ්‍ය මූලික අවශ්‍යතාවයන් සපුරා ගැනීමට මුදල් අත්‍යාවශ්‍යවේ.

සල්ලි ඇති කෙනා පොහොසතෙකි. සල්ලි නැතිකෙනා දුප්පතෙකි. සල්ලි වලට කළ නොහැක්කක් නැත යන කියමන් සමාජයේ අසන්න ලැබෙන ප්‍රකාශයන්ය. එහි සත්‍යයක් ඇත. මන්ද අද මිනිසුන් සියල්ල කරන්න උත්සහ කරන්නේ මුදලට තක්සේරු කරමින් නිසා එම සල්ලි තියෙන කෙනා වැදගතෙක් ලෙස සලකන්න සමාජය හුරු වී ඇත.

යමෙකුට ගෙවල් කීපයක් හෝ රටේ තැනින් තැන ඉඩම් කීපයක් හෝ පවති නම් ඔහුව සල්ලිකාරයෙක්ය කියන්න මිනිසුන් හුරු වී ඇති අතර සමාජයේ වැදගතෙක් යැයි සම්මතයක්ද පවති.

වැදගතෙක්ද යන බව තීරණය කළයුතු වන්නේ සල්ලි තියන නිසා නොව සල්ලි වලින් කරන දේ අනුවයි. යමෙක් සල්ලි වලින් වැදගත් දේ කරන්නේ නම් ඔහු වැදගතෙකි. වර්තමානයේ බොහෝ සල්ලිකාරයන් ඇත. ඒ අය අතර බොහෝ දෙනා කරනු ලබන ක්‍රියා දෙස බලන විට කළ වැදගත්කම් නම් නොමැත.

සමාජයේ නිරන්තරයෙන් අසන්න ලැබෙන පවුල ආරවුල්, ඉඩම් නඩු, මත්පැන් මත්කුඩු ජාවාරම්, කොල්ලකෑම්, ස්ත්‍රී දූෂණ, පුරාණ සිද්ධස්ථාන කඩා බිඳ නිදන් හෑරීම, අයතා ලෙස මුදල් සහ දේපල පරිහරණය ආදි සමාජ විරෝධී වැඩ කරන පුද්ගලයන් අතර සල්ලි වලින් වැදගත්කම් මවාගෙන සිටි රටේ වැදගතුන් යැයි පිලිගත්තවුන් සිටින බව පැහැදිලි කරුණකි.

කෙදිනක හෝ නීතියේ රැහැනට හසුවූ විට මේ වැදගතුන් කෙසේ හෝ බේරි නැවතද එම නීති විරෝධී අකටයුතුකම් කරති. මේ සල්ලි සමහර බහුතර සල්ලිකාරයන්ගේ ස්වභාවයයි. මෙවන් සල්ලි කාරයන් සමාජයට පිළිලයකි.

එම නිසා එවන් සල්ලි කාරයෙකු නොවී රටට සමාජයට ප්‍රයොජනවත් ධනවතෙක් වන විදිහ ලොවුතුරා බුදුරජාණන් වහන්සේ පෙන්වා දී ඇත.

එනම්

"සද්ධා ධනං සීලධනං -
හිරිඔත්තප්පියං ධනං -
සුථධනංච චාගෝච -
පඤ්ඤාමේ සත්තමං ධනං"

යන දේශනාව පරිදි සද්ධාව, ශීලය, ලැජ්ජාව, භය, ධර්මය ඇසීම, පරිත්‍යගය, ප්‍රඥාව, යැයි දේශිත ශප්ත ආර්ය ධනයයි. මෙම ධන හත අධ්‍යාත්මික ධන හතකි.

සල්ලි නිසා යටපත් ව යන උතුරැ මිනිස් දම් යටවන්න නොදි සමාජගත කිරීමට අත්‍යාවශ්‍යම කාලයකි. අද ඒ සඳහා මෙම සප්ත ආර්ය ධනය උපයෝගි කරගත හැක.

මින් පළමුවැන්න වන්නේ ශ්‍රද්ධා දනයයි. ශ්‍රද්ධාව නම් තථාගතයන් වහන්සේගේ බුද්ධත්වය පිළිගැනීම හා නව අරහාදි බුදුගුණ සකාරව දැනගෙන එම ගුණවලින් බුදුරදුන් යුක්ත බව දැන බුදුන් සරණ යාමයි. ඒවාගේ ධර්ම රත්නය, සංඝ රත්නය විශ්වාස කරමින් දහම් සහ සගුන් සරණ යාමයි.

බුදුරදුන් විශ්වාස කරන කෙනා බුදුමඟ යන්නෙක් විය යුතුය. බුද්ධ චරිතයේ අසීමිත ආදර්ශ ජීවිතයට ගෙන ජීවිත හැඩ ගස්වා ගැනීමට යමෙක් උත්සහ කරන්නේනම් ඔහුට හොඳ සමාජ සේවකයෙක් විය හැක.

ශීල ධනය නම් සිල්වත්කමයි. කාය වාග් මන යන තිදොරෙහි සංවරය සීලයයි. රට පුරා සිදුවන සිදුවීම් බැලූ විට පෙනෙන ලක්ෂණයකි දුසිල්වත්කම, හොරකම, මනුස්ස ඝාතන, සුරාව, කාමය වරදවා හැසීරීම, අසත්‍ය වචන මේවා පංච දුෂ්චරිතයන්ය. පන්සිල් නොරකින මිනිසුන් වාසය කරන පෙදෙස් වාසයට නුසුදුසු ප්‍රදේශ ලෙස පතිරූප දේසවා සොච යන දේශනයෙන්ද දක්වා ඇත. සමාජයේ දුෂ්චරිත අවම කිරීමට මෙම ශීලය නම් වූ ධනයෙන් සෑම පුද්ගලයෙක්ම ධනවත් විය යුතුය. තම තමාගේ තිදොරින් සිදුවන ක්‍රියාවන් පිළිබඳ තමාම හොද සිහියෙන් හෙවත්

යෝනිසෝ මනසිකාරයෙන් සිටීනම් සිදුවන වැරදි අවම කරගත හැක. එම නිසා සීලය සල්ලි වලින් මිළ කළ නොහැකි ධනයකි.

සෑම කෙනෙක් ලඟම වර්ධනය කර ගතයුතු තවත් වැදගත් ධන දෙකකි. හිරි, ඔතප් හෙවත් ලජ්ජා භය දෙක වරදක් කිරිමට සිතක් පහලවූ සැනින් වරදෙහි ආදීනව කලින්ම සිහියට පැමිණිය යුතුය. එනම් වරදෙහි විපාකය පිළිබඳ සිතා අපාගත වී විදින්න සිදුවන බියද වරදක් කළවිට සමාජයෙන් එල්ල වන අපහාසවලට ලැජ්ජාවද වරද කිරීමට පෙර සිහියට පැමිණිය යුතුය. එවිට නිරායාසයෙන්ම මිනිසුන් වැරදි වලින් ඈත්වීම සිදුවේ.

සුත නම් ඇසීමයි. අසනවානම් ඇසිය යුත්තේ යහපත් දෙවල්ය. ලොව ඇසිය යුතු යහපත්ම දේ නම් බුද්ධ දේශනයයි. ලොවුතුරු බුදු දහම ඇසීමෙන් පුද්ගලයාට නිවැරදි දේ නිවැරදිව තෝරා ගැනීමේ හැකියාවක් වර්ධනය වන බැවින් ඒ තුළින් නිවැරදි දේම කරන්න පෙළඹෙන විට සමාජයෙන් හැමවිටම යහපතම දැකගත හැකි වන්නේය.

සප්ත ආර්ය ධනයෙහි හය වැන්න වන්නේ චාග හෙවත් පරිත්‍යාගයයි. භික්ෂූන්ට දන්දීම නැති බැරි අයට දීම තුළින් චාග ධනය සම්පූර්ණ කරගත හැක.

නැති බැරි අයට ඇති හැකි අය දීම උතුම් මනුස්ස ධර්මයකි. කන්න බොන්න නැති, අදින්න වස්ත්‍රයක් නැති, ඉන්න හිටින්න නිවසක් නැති මිනිසුන් අප රටේ මෙන්ම ලෝකයේ තවත් බොහෝ රටවල් වල ඇත.

එවන් මිනිසුන් වෙනුවෙන් ඇති හැකි අය මෙන්ම රජයෙන්ද ඔවුන් සඳහා සම්පත් නිසි ලෙස බෙදා දෙන්නේනම් උතුම් පිංකමකි. ඒ වාගේම රටක සිදුවන උද්ඝෝෂණ උපවාස ගැටුම් පවා නතර කරගැනීමටද හැකියාව ඇත. මන්ද යත් මිනිසුන් බොහො පිරිස් උද්ඝෝෂණ වැනි දේ කරමින් රට පුරා කල බල ඇති කරන්නේ තමන්ට නැති අඩුපාඩු ඉල්ලා ගැනීමටය.

මේ අනුව මිනිසුන් අතර අඩ දබර ගැටුම් හොර මැරකම් අවි ආයුධ භාවිත කරනු ලබන්නේ ජීවිතවලට අගහිඟකම් පැමිණෙන විට බව බුදුරජාණන් වහන්සේ දේශනාකර ඇත. මේ බව තේරුම් ගන්නේ නම් සමාජ ගැටුම් බොහොමයක් අවම කරගත හැක.

මිනිසුන් තුළ තිබිය යුතු තවත් වැදගත්ම ධනයකි ප්‍රඥාව. බුදුදහමට අනුව ප්‍රඥාව නම් මිනිසා හා ලෝකය පිළිබද සියලුම සංස්කාරයන්හි ඇතිවීම හා නැතිවීම පිළිබඳ නිවැරදි අවබෝධය ඇති කර ගැනිමයි. එමගින් නිර්වාණගාමී ආර්ය මාර්ගයට අවතීර්ණවිම සඳහා අවශ්‍ය නුවණ සාධනය කර ගත හැකිය.

මෙම නුවණ ඇති කරගන්නේ නම් ඇතිවන නැතිවන ස්වභාවයෙන් යුත් මගේ ශරීරය හා ලෝකය වෙනුවෙන් අයිතිවාසිකම් කියමින් ගැටුම් ඇති කරගැනීම හා ගැටුම් තුළින් ලබාගන්නා ජයග්‍රහණද අනිත්‍ය බව තේරුම් ගතහැක.

එවිට ඒ වෙනුවෙන් කරනු ලබන බොහෝ කාර්යයන් නිෂ්ඵල බවද තම තමන්ටම වැටහෙනවා ඇත. සල්ලි නිසා තණ්හාවද තණ්හාව නිසා බයද ඇති වෙයි. සල්ලි හොරුන්ගෙන් හෝ ගින්නෙන් හෝ ජලයෙන්ද එසේ නොවේ නම් රාජ සන්තක විමෙන්ද විනාශ වේ. එසේත් නොවේ නම් මරණයෙන් පසු අත හැර දමා පරලොව යාමට සිදුවේ.

නමුත් මෙම ගුප්ත ආර්ය ධනය නම් වූ මෙම උතුම් ධන හතෙන් යමෙක් පොහොසත් වන්නේනම් මෙලොව වශයෙන් තමාට යහපතත් අනුන් ට යහපතත් කරමින් සංසාරික වශයෙන් නිවන් දකිනා තුරු පූර්ණය කරන්න යෙදුන් කුසල් වශයෙන් භවයෙන් භවයට අරන් යා හැකිය.

ශාස්ත්‍රවේදි පූජ්‍ය
කෝන්ගහවෙල සුමන හිමි

12 පිටුවෙන්..

## පන්සල හා එහි කාර්යභාරය

සාමූහිකත්වයෙන් එය සිදු විය. පොදු ශ්‍රමදාන ක්‍රමයක් දක්නට ලැබුණි. අගල් කැපීම, පදනම දැමීම, ගල් කැඩීම, ගඩොල් කැපීම ආදිය ගැමියන් විසින් සිය ශ්‍රම දායකත්වයෙන් කරගත් අතර මේ සඳහා කිසිදු මුදලක් අය නොකරන ලදී. ගමේ පොහොසතාගේ සිට අන්ත දුප්පතා දක්වා සියලු දෙනා ඉතා ශ්‍රද්ධාවෙන් ගෞරවයෙන් මේ සඳහා දායක වූහ. විශාල වශයෙන් මුදල් වැයවන කාර්යයන් සඳහා ගමේ මිටි හාල්, පිං හාල් ආදිය එකතුකොට ඒවා විකුණා මුදල් ලබා ගන්නට විය. ඇතැම්හු කුඩා කණ්ඩායම් ලෙස එක් වී දුරබැහැර ගම් නියම්ගම් කරා ගොස් වී , හාල් , මුදල් ආදිය එක්රැස් කළහ. මෙම ක්‍රියාදාමය 'සම්මාදමේ යාම' ලෙස අතීතයේ සිට ආරම්භ වී වර්තමානයේ දී ඉතා සුළුවෙන් නමුත් දක්නට ලැබේ. මෙසේ ඉදිවූ ගමේ පන්සල ආගමික මධ්‍යස්ථානයක් වුවත් එය වඩා අලංකාරවත් චිත්තාකර්ෂණීය ව නිර්මාණය කිරීමට බෞද්ධ ගෘහ නිර්මාණ ශිල්පියා උත්සුක වූහ. ගැමියන්ගේ වන්දනාමාන කටයුතුවලට අවශ්‍ය

1. ශාරීරික
2. පාරිභෝගික
3. උද්දේසික

යන ත්‍රිවිධ චෛත්‍ය අංගයන්ගෙන් පන්සල අංගසම්පූර්ණ විය. එපමණක් නොව පටිමා, පටිමාඝර , බෝධිය , බෝධිඝර , චේතියඝර, මහ සෑ මළු, සපපතල මළු, මුරගල් , කොරවක්ගල්, පියගැට පෙළ, සඳකඩ පහණ, ආදී අනේකවිධ වූ කලාකෘතීන්ගෙන් විහාරස්ථානය අලංකාරවත් විය.

සාම්ප්‍රදායික ගමෙහි සාමය නිර්මාණය කිරීමේ කේන්ද්‍රස්ථානය ලෙස ද පන්සල ක්‍රියාත්මක විය. එහි අවසානය වශයෙන් තීරණ ගනු ලැබුවේ නායක හිමිපාණන් විසිනි. පන්සලේ ඉඩම් හා කුඹුරු සීමාවන් තුළ පක්ෂියෙකු හෝ දඩුවම් කිරීම තහනම් විය. ගමේ සොරුන් හා වෙනත් අපරාධ කරන්නන් පිළිබඳ නඩු විසඳන ලද්දේ විහාරාධිපති හිමියන් විසිනි. මොවුන් රජ වාසලට, පසු කාලයේ දී පොලිසියට ගෙන යාමට පෙර පන්සල වෙත රැගෙන යන්නට විය. බොහෝ විට මෙවැනි නඩු, ගමෙහි ආරවුල් පන්සල තුළදී ම නිරාකරණය කරගැනීමට හැකිවිය. ගමෙහි සදාචාරය එක්තැන් කළ ස්ථානය පන්සල විය. වර්තමානයේ දී මෙන් විවිධ රෝගාබාධ සඳහා ඖෂධ ලබා ගැනීම සඳහා අතීතයේ දී රෝහල් නොතිබුණ අතර සියලු රෝගීන් යොමු කරනු ලැබුවේ ගමේ වෙදැදුරා වෙත හෝ පන්සලෙහි නායක හිමිපාණන් වෙත ය. උන්වහන්සේ සිංහල වෛද්‍ය ශාස්ත්‍රය පිළිබඳ මනා

15 පිටුවට...


ථේරී ගාථා ඇසුරෙන්
භද්‍රා කුණ්ඩලකේශී
7
සංකල්පය සහ
චිත්‍ර.. පාලිත
..සන්තුක.. කෙරෙහි.. සිත් ඇතිවූ.. භද්‍රා.. ඔහුව නොලද හොත්.. මිය යමියි.. සිතා... සිය.. සයනයේ වැතිරුණේය...
කුමාරී.. කුමාරී.. ඔබ බය වුනාද.. ඈහ.. ඇයි.. මේ.. අඬන්නේ.. ඔබට කිසියම් අසනීපයක් වත්ද..
ඉහ්.. ඉහි.. හී..
සත්තුකව මරන්ට ගෙනියනව දැකල ඔබ බය වුනාද... ..කුමාරී..
..ඉන්න.. මම... සිටු දේවියට කැඳවාගෙන එන්නම්


භද්‍රා.. ඇයි දියණිය.. මොකද.. මේ.. ඔබට.. ව්‍යාධියක්වත්ද? කියන්න... මොකද වුනේ
ඉහි..හ් මෑණියනි
මෑණියනි.. තමන් ආශා කරන යමක් ලබාගැනීමට නොහැකි වුවහොත්... නොලැබුන හොත් ඒක සිතට... මොන තරම්.. ශෝක උපදවන්නක්ද..?
ඔව්.. ..ඔව්.. ඉතිං..
මෑණියනි.. දැන් අර මරන්ඩ ගෙනගිය.. සත්තුක පුරෝහිත තුමාගෙ පුතා...
ඔහුව.. මට විවාහ කර දෙන්ට.. මෑණියනි.. ඔහුව ලද හොත්.. මා ජීවත් වෙමි.. යම්.. හෙයකින් මට.. ඔහු නොලද හොත් මා ද... මෙහිම.. මියයමි... මෑණියනි..
හරි.. හරි.. ඉතිං මොකද්ද ඔබට ලබා ගැනීමට නොහැකි දේ.. ඔය තරමට ...ශෝක වෙන්නට

සුරස අතිරේකය

සුභාවිත ගීයක

# ලොව කියා දුන්න ගුරු පාද පියුම් සුවඳයි

"ගුරු" යනු අඳුර දුරු කරන්නා ය. ශිෂ්‍යයන්ගේ ජීවිත අඳුරෙන් ආලෝකයට ගෙන යන්නා ගුරුවරයා ය. අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ ද "තිලෝගුරු " නමින් හඳුන්වන්නේ තුන් ලොවෙහිම අඳුර දුරු කරන්නා, දුකින් මිදීමේ මග කියා දෙන්නා යන අරුතිනි.

අප බෙහෙවින් ගරු කරන්නේ මව් පියන්ටය. අප බිහි කර, පෝෂණය කර මේ සමාජයේ නොවැටී සිට ගන්නට මහත් වූ ස්නේහයෙන් අපට මග පෙන් වූවන් ය. මව්පියන්ට පසු අප ගරු බුහුමන් දක්වන්නේ ගුරුවරුන්ට ය. ශිල්ප ඥානය ලබාදී යහපත අයහපත වෙන් කරගන්නා නුවණැස පාදා ගන්නට මඟ පෙන්වූයේ ඔවුන් ය. දෙමව්පියන් හා සමානව පුද්ගලයෙකුගේ සමාජානුයෝජනයට , ඔහුගේ චර්යාවන්ට ආර්ථික සාමාජීය පැවැත්මට ගුරුවරයාගෙන් ලැබෙන දායකත්වය මෙලොව කිසිවකට සම කළ නොහේ. ගුරුවරයාගේ මඟ පෙන්වීම මිනිසුන් වූ අපට අත්‍යවශ්‍ය ය අප සතු හැකියාවන් ඉස්මතු කර ගැනීමට , දැනුම දියුණු කර ගැනීමට ගුරුවරයෙකු අවශ්‍යය වේ. බුදු රජාණන් වහන්සේ සිය ඥානය තමා විසින්ම දියුණු කර ගෙන බුද්ධත්වයට පත් වුවද ධර්මය සිය ගුරු තනතුරෙහි තබා ගත්තේ ගුරුවරයා කෙරෙහි උන්වහන්සේ තුළ තිබූ ගෞරවයත් සිය නිහතමානී ගුණයත් නිසා ය.

අතීතයේ ශිෂ්‍යන්ට ගුරුවරයාගේ නිවසට ගොස් ඉගෙන ගැනීමට සිදුව තිබුණි. ගුරුවරයාගේ නිවසේ සියලුම කටයුතු සිදු කරමින් ඉගෙන ගැනීමට සිදුව තිබුණි. පසු කාලීනව ඉගෙන ගැනීමට වෙනම ආයතන බිහි විය. පිරිවෙන් හා වෙනත් ආගමික, අධ්‍යාපන ආයතන මුල් කරගෙන ගොඩ නැගුණු අධ්‍යාපනය පාසල් සහ විශ්ව විද්‍යාල බවට පත් විය. පාසැල හා ගුරුවරයා පිළිබඳව සාකච්ඡාවට බඳුන් වන හැම මොහොතකම අපට සිහියට නැගෙන්නේ චිංගීස් ආයිත්මාතෝව්ගේ ගුරු ගීතය යි. ඔහු අශ්ව ගාලක් පාසලක් බවට පත් කරමින් අකුරු නූගත් මිනිසුන්ගේ දරුවන් සඳහා මහත් පරිශ්‍රමයෙන් ඉගැන්වීම් කළේ ය.

ඇතැම් දිනෙක අධික ශීතල පවා නොතකමින් දණක් ජලයේ බැස දරුවන් එතෙර කරමින් පාසල වෙත කැඳවා ගෙන යන්නට දුයිෂෙන්ට සිදු විය. අඩු වයසින් විවාපත් වී මුළු ජීවිතයම නූගත් ගැහැණියක සේ විනාශ වන්නට තිබූ අල්තීනායි මහාචාර්යවරියක දක්වා රැගෙන යන්නේ දුයිෂෙන්ගේ කැපවීම හා මග පෙන්වීම නිසා ය. සිය ප්‍රේමය නිසා අල්තීනායිට අධ්‍යාපන කටයුතු නිසි පරමාදර්ශී ගුරුවරයා බිහි කළ පාසල අල්තීනායි මෙන් බොහෝ උගතුන් බිහි කිරීමේ තොතැන්නක් බවට පත් විය. එහෙත් වසර ගණනකට පසු පාසැලේ පැවති සංවත්සරයට ඔහුට ආරාධනාවක් පවා නොලැබිණ. ඔහු ලියුම් බෙදන්නෙකුව සියලු ලෙස කරගෙන යන්නට නොහැකි වේ යැයි සිතමින් තම සිතැඟිද නොපෙන්වා කාරුණිකව මෙම ආදරණීය ශිෂ්‍යයාට මග පෙන්වන්නට ඔහු උත්සුක විය. මෙම කෙණෙහිලිකම් ඉවසමින් එම රාජකාරියද අකුරට ඉටු කළේය.

ගුරු තරුව සෙමෙන් බැස යයි
ගැලූ එළිය නොයා නවතියි
නුබ කොපුල් තලා වැහි බිඳු තවරා
ගුරු තරුව සෙමෙන් බැස යයි


පරපුරක සිහින යාත්‍රා
තොටුපලට යවා හරවා
පිතු සෙනේහයෙන්
ලොව කියා දුන්නු
ගුරු පාද පියුම් සුවඳයි

එක මලක නම් නොවේමැයි
මල් යායක සිරස නැමෙයි
පිතු සෙනේහයෙන්
ලොව කියා දුන්නු
ගුරු පාද පියුම් සුවඳයි

ගේය පද - රත්න ශ්‍රී විජේසිංහ
සංගීතය හා ගායනය -
ආචාර්ය පණ්ඩිත් අමරදේව



රත්න ශ්‍රී විජේසිංහ මහතා



පණ්ඩිත් අමරදේව මහතා

සිය යුතුකම් මැනවින් ඉටු කොට සතුටු කඳුළු වගුරු වන ගුරු වරුන් රැසක් අපේ රටේ ද සිටියි. මහින්ද චන්ද්‍ර සේකරයන් "පැන මඩ කඩිති වැව් තාවුළු වැහි කාලේ" ගීතයෙන් කියවෙන්නේ ද සිය කාලය ශ්‍රමය කැප කොට ශිල්ප ඉගැන් වූ ගුරුවරුන් පිළිබඳවය.

ගුරු වෘත්තිය සිය දිවියටද වඩා උතුම් කොට සලකමින් දරුවන්ගේ නැණැස පෑදූ ගුරුවරුන් බොහොමයක් අතීතයේ විසූ හ. අදද වෙසෙති. එනමුත් වර්තමානයේ එවන් ගුරුවරුන් දුලභ ය. විවෘත ආර්ථිකයේ ගොදුරු බවට පත්ව සිය ජීවිතය ගැට ගසා ගැනිමට රැකියාවන නිරත වන ගුරුවරුන් අතර මහත්මා ගති ගුණ ඇති පරමාදර්ශී ගුරුවරුන් දුලභ ය. ඇතැමුන් පාසල් කාල වේලාවෙන් පසු ටියුෂන් පන්ති පවත් වති. පාසලේ දී නිවැරදිව දරුවනට ශිල්ප ඥානය ලබා නොදී ටියුෂන් පන්තියට පැමිණෙන දරුවන්ට මුදලට ශිල්ප විකුණති. දරුවන් ට හොඳ නරක කියා දෙන්නට ඔවුන්ගේ ආචාර ධර්ම වැඩි දියුණු කරන්නට වෙහෙසෙන ගුරුවරුන් අද දුලභ ය.

රත්න ශ්‍රී සල් ගස යට කාව්‍යය සංග්‍රහයේ " අන්තිම පාඩම " යන නිර්මාණය ගුරුවරුන් ගේත් වත්මන් ශිෂ්‍ය පරපුරේත් යථා තතු හෙළි කරයි. "නික්ම යයි ගුරුවරයා යළි ආපසු නො එන්නට මැරි යන සල් ගස යට ගල් පඩි පෙළින් බැස මහලූ පාසල් මවුන් දෙස පසු හැරී බලමින

බිම ඇති හෝඩි පොත් වල
අකුරක් පවා නොපෙනෙණ
බොහෝ උස ගිය ළමයි
ගුරුතුමා පසු කර ගෙන යත්
නොතකා ඔවුන් ගැන කිසිත්

පාසල් මිදුල කෙළවර
නතරව හෙතෙම මඳකට
ඉරුණු පාඩම් පොත් පිටු ද
පරව ගිය සල් මල් පෙති ද
අසුලා ගෙන අතට ගලක් උඩ
තැන්පත් කරන්නෙ ය.

බැරි වෙලාවත්, තොපට දරුවනි
පෑගුණොත්
ඉතින් පව් පින් කියා දෙන්නත්
කිසිවෙකුට දැන් වෙලාවක් -
ඉඩක් නැතියෙන්

දරුවන්ගේ පිරිහීම නිසා ගුරුවරයා ද ඔහුගේ පිරිහීම නිසා දරුවන්ද පිරිහේ. සුවඳ සුන්දරත්වය කැටි කළ විසල් සල් ගසේ මිය යාම යනු පරමාදර්ශී ගුරුවරයා නම් චරිතය මිය යාම කි. මෙය මුළු සමාජයේම උගත්කම බුද්ධිමත්කම හා හැදියාව සපිරුණු මිනිසුන්ගේ මිය යාමත් එවන් මිනිසුන් නොතකා හරින සමාජයක බිහිවීමත් පිළිබිඹු කරයි.

ගුරු තරුව සෙමෙන් බැස යයි යන ගීතය ද සවිමත් අරටුවක් සහිත පොළවේ මුල් හොඳින් ඇදුණු ලොවටම ගුණ සුවඳ පතුරවා ලු සල් ගසක මිය යාම පිළිබිඹු කරයි.

දරු පරපුරු රැසකගේ සිහින යාත්‍රාවන් නියමිත තොටුපළ වලට හරවා යවා ඔහු සතුටු කඳුලු වගුරයි. මෙවන් ගුරුවරුන්ගේ නික්ම යාම යනු පරමාදර්ශී ගුරුවරුන් ගේ අවසානය සනිටුහන් කිරීමකි.

ගුරු තරුව බැස ගියද එහි එළිය නොනැසී පවතියි. ගුරු තරුවේ බැස යාම නිසා දුක් වෙන හඬා වැටෙන දරුවන්ගේ දුක සමාන කර ඇත්තේ අහසෙන් කඩා වැටෙන වැහි බිඳු වලටය. එනම් එය කිසිවෙකුට දරා ගත නොහැකි වේදනාවකි.

පිතෘ ස්නේහයෙන් ලෝකයේ සැබෑ තතු කියා දුන්න, නරකින් හොඳ වෙන් කරගෙන ආලෝකය වෙත යන්නට කියා දුන් නියම ගුරුවරුන්ගේ නික්ම යාම සැබවින්ම ඛේදයකි. එවන් ගුරුවරුන්ට මුළු ලොවම ගරු කරයි සිරස නමයි.

ගීතයෙන් කියැවෙන්නේ ගුරුවරයාගේ සදාකාලික නික්මයාම ද නැත්නම් විශ්‍රාම යාම හෝ ඔහු වෙනත් පාසලකට මාරු වී යාම විය හැකිය. මෙයින් කුමක් වුවද සැබෑ ගුරුවරයෙකුගේ නික්ම යාම සැබවින්ම වේදනා සහගතය. රත්න ශ්‍රී ද සැබෑ ගුරුවරයෙකු නිසා ඔහුට ගුරුවරයා පිළිබඳව වඩාත් සංවේදී ඇසකින් බලන්නට හැකි ය.

මෙම සංවේදී පබැඳුම අප අපගේ සොඳුරු ළමා වියටත් ගුරු සෙවනටත් රැගෙන යයි.

චාමිකා ජනානිද සිල්වා

# යහගුණයෙන් පිරි අවුරුදු සමයට ඔබට පුංචි ඔවදනක්



මිහිපුර ධම්මප්‍රදීපා භික්ෂුණිය

එරබදු ගස දෙවන ගමනට සූදානම් වූ මනාලිය ලෙස සැරසී සිටින්නීය. සියළු තුරුලතාවෝ පැරණි කොළ නැමති රළු ඇඳුම ඉවත ලා සුසිනිදු ලා කොළ සළුව පොරවා සුවඳ සුම්හිරි මල් එලින් ලොවට සිනාසෙති. පන්සලේ බෝධිරාජයාණන් වහන්සෙද රන්වන්, නිල්වන් පත්වලින් පවන් සලමින් සෙත සදති. මනහර කොවුල් නාදයෙන්, විහඟ ගීතයෙන් ප්‍රබෝධමත් වන අපට සිංහල අලුත් අවුරුද්ද ලඟ ලඟ එන බව පැහැදිළිය.

වස්සානය නිමාවී වසන්තය උදාව ඇත. අපද සුන්දර බක්මහේ අලුත් අවුරුද්දට සැරසෙන්නෙමු. ගේ දොර පිරිසිදු කර අලුත් කරන්නෙමු. නවීන විලාසිතාවෙන් යුත් බඩු භාණ්ඩ ඇඳුම් පැලදුම් මිළදී ගන්නෙමු. සුවිශේෂී ආහාර පාන සකස් වන බව දසතින් එන සුගන්ධයෝ අපට පවසති. මේ අයුරින් පරිසරයද, සතා සිව්පාවද, අපද බාහිර වශයෙන් අලුත්ව ඇත. එහෙත් සියළු දෙනාටම අත්‍යාවශ්‍යම දේ අලුත් කර ගැනීමට අමතකව ඇත. ඒ අපේ හිතයි. මොහොතක් ඔබ මේ ගැන සිතන්න. අපි අපේ සිත් සතන් අලුත් කර නොගෙන බාහිර සියළු දේ අළුත් කළත් එයින් එලක් ඇති නොවේ. ඔබ උපන් දා සිට මේ දක්වා අලුත් අවුරුදු කීයක් සමරන්නට ඇද්ද? එහෙත් ඒ කිසිම අවුරුද්දක ඔබ ඔබේ සිත අළුත් කරගන්නට උත්සහා නොකරන්න ඇත. පරණ අවුරුද්දේ ඔබ ලඟ තිබුණ කිළිටු සිතම අලුත් අවුරුද්දටත් ඔබ රැගෙන යති. ඒ කෙළෙස් මළින් යුතු කිලිටි සිත දිගින් දිගටම ගමන් කරවති. එයට එක් හේතුවක් ඇත. එනම් ඔබේ ගත මෙන්, වත මෙන් සිතෙහි පවතින කුණු කිළිටු ඔබට හෝ ඔබ දෙස බලන්නට එනහෙලා නොපෙනෙන බැවිනි. ඔබටත් අන්‍යයන්ටත් පියවි ඇසට පෙනෙන ඔබේ ඇඳුම් පැලදුම් ගෙවල් දොරවල් පිරිසිදු කර අළුත්කර ගෙන ඇත. පරිසරයද, කුරුල්ලන් කොබෙයියන්ද, සතා සිව්පාවද අලුත් ජීවිත අරඹා ඇත. මේ සියල්ල අපට අලුත්ව පෙනෙන බැවින් සියල්ල අලුත් යැයි අපට හැඟේ. එහෙත් සිත පිරිසිදු කොට නැති බැවින් එය එසේ නොවේ.

එසේ නම් අපේ පියවි ඇසට නොපෙනෙන එහෙත් පිරිසිදු කර ගතහොත් මෙලොව පරලොව දෙලොවම සැනසීම ඇතිවෙන සිත පිරිසිදු කරගන්නට උත්සහ කරමු. එසේ කරන්නට ඔබට හැකිනම් ඔබ සැබෑ ලෙසින්ම අලුත් අවුරුද්ද උදාකරගත් අයෙකු වේවි.

සම්බුදු රාජාණෝ මේ සමාජයේ ජීවත්වන පුද්ගලයන් හතර ආකාරයකට බෙදා වෙන්කර ඇත.

1. තමො තම පරායනො
2. තමො ජොති පරායනො
3. ජොති තම පරායනො
4. ජොති ජොති පරායනො

මෙහි පළමු පුද්ගලයා වන්නේ අඳුරෙන් අඳුරට යන්නාය. එනම් කුඩා කාලයේ පටන්ම වැරදි ක්‍රියාවන්ගේ නිරත වන මේ පුද්ගලයා වැරදි සහිත පුද්ගලයින්ම ඇසුරු කරමින් අතිශයින් දුක්ඛිත ජීවිතයක් ගත කරමින් ඇලෙමින් ගැලෙමින් එයින් තොර ජීවිතයක් පිළිබඳව නොසිතමින්, එම දුකින් මිදෙන ආකාරය වටහා ගැනීමට නොහැකිව මෝහය තව තවත් වැඩිකරගනිමින් පස්පව් දස අකුසල්ම කරමින් මෙලොවද දුකින් දුකට පත්වෙමින් පරලොව අපාගාමී වන පුද්ගලයාය.

දෙවන පුද්ගලයා අදුරෙන් ආලෝකයට යන්නාය.

එනම් සසර කළ අකුසල්, පව් හේතුවෙන් ලැබුණු දුක්ඛිත ජීවිතයේ පසුවෙමින් එම ජීවිතය තේරුම් ගෙන පිං, කුසල්, කරමින් යහපත් ගති පැවතුම් ඇති කරගෙන ලැබූ මනුෂ්‍ය ජීවිතය මතුවටත් ලබා ගැනීමට හැකි ආකාරයෙන් කටයුතු කරන පුද්ගලයාය.

තුන්වන පුද්ගලයා ආලෝකයෙන් අදුරට යන පුද්ගලයාය. එනම් පෙර කරන ලද පුණ්‍ය කර්ම හේතුවෙන් යහපත් මව්පියන් ලැබී ධන ධාන්‍ය ලැබ හොඳ මනුෂ්‍යයෙක් හැටියට උපත ලබා පසුව පාපමිත්‍ර සේවනයට වැටී පව්කාර ජීවිතයක් පවත්වමින් ලද මනුෂ්‍ය ජීවිතයක් අහිමිකර ගනිමින් සතර අපායට තිරිසන් ප්‍රේත තත්වයට ඇද වැටෙන පුද්ගලයාය.

වත්මන් සමාජය තුළ මේ සිව් පිරිසම වාසය කරති. විශේෂයෙන් අලුත් අවුරුදු සමයේ ජොතිතම පරායන පුද්ගලයන් සමාජයේ කැපී පෙනෙති. ඒ එසේ වන්නේ ඔවුන් සිත අලුත් කරනොගෙන ඇති බැවිණි. ජීවිතයේ ජොති -ජොති පරායනව සිටින පුද්ගලයෝ පවා අවුරුදු කාලයට ජොති-තම තත්වයට පත්වේ. මුළු අවුරුද්ද පුරාවට ධාර්මිකව උපයපු ධනය මත්ද්‍රව්‍ය සඳහා වියදම් කරමින් මස් මාංශ සඳහා වියදම් කරමින් තම යහළු මිත්‍රාදීන් මේවායෙන් සන්තර්පනය කරවමින් සතුටක් යැයි සිතා කාලයද, ධනයද, සමඟියද, සාමයද, නිරෝගී බවද, යහපත් මනුෂ්‍ය ගුණාංගද, අඹුදරුවන්ගේ ආරක්ෂාවද, ගෞරවයද යන සියල්ල විනාශ කරගනිති.

වෙනත් කිසිම අවස්ථාවක සූදුවෙහි නොයෙදෙන පුද්ගලයෝ සිංහල-දෙමළ අවුරුද්ද වෙනුවෙන් දූකෙළියෙහි යෙදෙති. අසභ්‍ය වචන, අනවශ්‍ය සිංදු කියමින් අසල්වැසියන් පවා අපහසුවට පත් කරති.

මේ ආලෝකයෙන් අදුරට යන පුද්ගලයාගේ ස්වරූපයයි. ඔබද මෙවන් පුද්ගලයෙකු විය හැකිය. එසේ නම් ඔබ වහාම සිත අලුත් කරගන්න. එවිට භාහිර වශයෙන් ඔබ ඇතිකරගත්, සොබා දහමින් ලද අසිරියත් මැද ඔබට සැබවින්ම නැවුම් වූ අවුරුද්දක් ලබාගත හැකිය.

මෙලෙස ඇතමෙක් ආලෝකයෙන් අඳුරට ගමන් කරද්දී අඳුරේ සිටින සමහර අය ආලෝකයටද පියමං කරති. එනම් මුළු අවුරුද්ද පුරාවටම මව්පියන් දකින්නට, උපස්ථාන කරන්නට උවමනායැයි නොසිතා තම තමන්ගේ කාර්යයන්ම කරන මේ පුද්ගලයෝ අවුරුදු උදාවත් සමඟම අලුත් ඇඳුම් පැළඳුම් අහාර පාන ගෙන මව්පියන් කරා එළඹෙති. වදිති පුදති. ගරු සත්කාර කරති. එමෙන්ම යම් යම් හේතූන් නිසා අමනාපව සිටි පුද්ගලයන් කරා ගොස් සුහද වෙති. ගමේ වැඩිහිටියන් කරා එළඹ වන්දනා මාන කරති. අශිර්වාද ලබති. නොනගතයේ පන්සල් ගොස් තෙරුවන් වන්දනා කොට මහා සංඝරත්නයේ ආශිර්වාදය ලබති. එහෙත් සිංහල අවුරුද්ද නිමාවීමෙන් මේ අඳුරෙන් ආලෝකයට පැමිණි පුද්ගලයෝ නැවත අඳුරටම වැටෙති. මව්පියන්ට සැළකිම, ආගමානුකූල ජීවිතය වැනි සත්පුරුෂ ධර්මයෝ අත්හරිති. ක්‍රෝධ, වෛර, ඊර්ෂ්‍යා සිතුවිලි හා ක්‍රියාදාමයන් නැවත ඇති කර ගනිති. මෙසේ සිදුවන්නේ ඔබ අවුරුද්ද වෙනුවෙන් සිත පිරිසිදු කරගෙන නැති බැවිනි. ඒ නිසා මොහොතකට හෝ ඔබට ඇතිවන ඒ යහපත් සිතුවිලි නැමති අළුත් බව දිගටම පවත්වා ගන්න. ඒ අළුත් සිතුවිලි පවත්වා ගැනීම තුළ ඔබට පිරිසිදු සිතක් ලැබේවි. ඒ පිරිසිදු පවිත්‍ර සිත ඔබේ මෙලොව ජීවිතය මෙන්ම පරලොව ජීවිතයද යහපත් කරාවි.

තවත් සමහර පුද්ගල පිරිසක් අවුරුදු කාලයේ අඳුරෙන් අඳුරටම වැටෙති. එනනම් මත්ද්‍රව්‍ය භාවිතය දුම්වැටි භාවිතය ඇතුළු නීති විරෝධී වූ තමන්ගේ මෙලොව පරලොව විනාශ වන දේට පුරුදු වූ පුද්ගලයෝ අවුරුදු දිනය වෙනුවෙන් මේවා සඳහා වැඩිපුර මුදල් භාවිතා කරති. වැඩි වැඩියෙන් මස් මාංශ අනුභව කරති. සතුන් මස් පිණිස විකුණන අය අවුරුදු සමයට වැඩිපුර සතුන් මරා විකුණති. පරිසරය විනාශවන, සතා සිව්පාවා බිය ගන්වන රතිඤ්ඤා ආදිය භාවිතයට වැඩිපුර නැඹුරු වෙති. මේ සියල්ල නිසා අසල්වාසීන් සමඟද අඩදබර කර ගනිමින් සමාජය මැද මහා පිළිලයක් වෙති. ඒ නිසා ඔබ අඳුරෙන් අඳුරට යන පුද්ගලයෙක් නම් ඔබේ මෙලොවත් පිඩාවට පත්වෙන පරලොවත් විනාශ වෙන මේ අඳුරු වූ පරණ සිත අළුත් කර ගන්න. අඳුරෙන් ආලෝකය කරා පියනගන්න. ඒ තුළින් ඔබට දෙලොව සැනසීම ලැබේවි.

මෙවන් වූ සමාජයක් තුළ ආලෝකයෙන් ආලෝකය කරා ගමන් කරන්නෝද වෙසෙති. ඔවුන් අලුත් අවුරුද්ද පිවිසියා යැයි තමන් පවත්වා ගෙන ආ පංචශීලයට හානි පැමිණෙන කිසිවක් කරන්නේ නැත. උත්සව සැනකෙළි නිසා මව්පිය පෝෂණය, වැඩිහිටියන්ට ගරු කිරීම, අසල්වාසීන්ට උදව් කරන්න අමතක කරන්නේ නැත. තමන්ගේ ජීවිතයේ සුපුරුදු ලෙස පවත්වාගෙන ආ පංචශිලයට හානි පැමිණෙන කිසිවක් කරන්නේ නැත. උත්සව සැනකෙළි නිසා මව්පිය පෝෂණය, වැඩිහිටියන්ට ගරු කිරීම, අසල්වැසියන්ට උදව් කරන්න අමතක කරන්නේ නැත. තමන්ගේ ජීවිතයේ සුපුරුදු ලෙස පවත්වාගෙන ආ එම ගුණ ධර්මයෝ එලෙසින්ම පවත්වාගෙන යන අතර මව්පිය උපස්ථානය වැනි දෑ පිළිබඳව වෙනදාටත් වඩා සිතමින් ශ්‍රේෂ්ඨ ලෙසම කරති. පන්සලට යෑම දන්දීම ආදි ක්‍රියා ද උත්සව සමයේ අමතක නොකරති. මෙසේ කටයුතු කරන පුද්ගලයා ආලෝකයෙන් ආලෝකයටම ගමන්කොට භයානක සසර කතරින් එතෙර වීමට කටයුතු යොදා ගනිති.

මේ සසර ආකාර පුද්ගලයන් අතර ඔබ සිටින්නේ කුමන පුද්ගල කොටසේ දැයි ඔබම සිතා බලන්න.

" මනො පුබබංගමා ධමමා-මනො සෙට්ඨා මනොමයා"

සියල්ලටම පෙරටු වන්නේ, ශ්‍රේෂ්ඨ වන්නේ සිතය. එසේ නම් අප ළඟ ඇති සියළුම සත්පුරුෂ, අසත්පුරුෂ ක්‍රියාවන්ටත් මුල් වන්නේ අපේ සිතමය. අප විසින් අපේ සිත හඳුනාගත යුතුය. එය ඉතා අපහසුය. සිහි නුවණින්ම කළ යුතුය. තමා කරන,කියන,සිතන දෑ පිළිබඳව නිතර සෙවිල්ලෙන්ම සිටීමෙන් සිත හඳුනාගත හැකිය. පංච ඉන්ද්‍රියයන් මුල් කරගෙන සිතුවිලි පහළ වේ. ඒ සිතුවිලි වලට අනුව ලෝභ, ද්වේශ, මෝහ, ඇති වේ. මේ අකුසල මූල නිසා යහපත් අයහපත් දේ, හොඳ නරක වටහා ගැනීමට අපහසු වේ. ඒ නිසා අනුවණින් යුතුව කෙසේ හෝ පසිඳුරන් පිනවීමට සිතති. එම සිතුවිලි ඇති විට අප නොදැනීම මිනිසත් බව ගිලිහී තිරිසන් තත්වයට පත් වේ.

" මනං උසසන්නත්ථාය මනුස්සා "

උසස්වූ මනසක් ඇති සත්වයාට මිනිසා යැයි කියනු ලැබේ. ඒ උසස් මනස නැතිව රැකියාවක් කොට ආහාර පාන සපයා ගැනිම, නිදා ගැනීම, බියවිම, මෛවුන් දම් සේවනය හෙවත් අඹුදරුවන් සමඟ වාසය කිරීම කියන කාර්යයන් හි පමණක් නියලී දන්, සිල්, භාවනාවෙන් තොරව යුතුකම් ඉටුනොකරමින් යමෙකු ජීවත්වේ නම් ඒ පුද්ගලයා තිරිසනෙකුට සමාන බව බුදුරජාණන් වහන්සේ දේශනා කොට ඇත.

ඒ නිසා අපි එළඹෙන බක්මස වන විට තිරිසන් ගති ඉක්මවූ උසස් මානුෂීය ගුණ දහමින් පරිපූර්ණව ආලෝකයෙන් ආලෝකය කරා පිය නගමු.

# ජීවිතයක වටිනාකම

සමාජය යනු පුද්ගලයන් සමූහයක අන්‍යෝන්‍ය ලෙස බැඳී පවත්නා සන්ධිස්ථානයකි. වර්තමාන සමාජය වූ කලී ඉතා සංකීර්ණ එකකි. එයට ප්‍රධාන ලෙස තාක්ෂණික දියුණුව බලපා ඇත. මිනිසාගේ ජීවිතය සංකීර්ණ වූ ප්‍රශ්න රාශියකින් වෙලී පවතී. බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද ශ්‍රී සද්ධර්මය වනාහී පරලොව ප්‍රීතිය නොව මෙලොව ධර්මානුකූලව තම ජීවිතය සකසාගෙන තමන්ගේ නවගාමී ජීවිතය සඳහා මහෝපකාරී වන සොබාදහමට පවා අනුගතව පවත්නා පොදු ධර්මතාවයකි. ලොව පැතිරී ඇති අනෙක් ආගම් හා දර්ශනයන් යම් තර්කයක් හෝ නිගමනයක් මත පිහිටි ධර්මයන් අතරේ ඒ සියළු ආගම් හා දර්ශනයන් පසෙකලා ලෝකයේ සැබෑ තතු එලෙසින්ම දක එහි නොඇලී නොගැටී එයට හේතු ප්‍රත්‍ය සොයාගෙන මේ භයංකර වූ දුක් සහිත වූ සසර කතරින් එතෙරවීම සඳහා අවබෝධ කරගත යුතු ධර්මතාවයකි. අනවබෝධය හේතු කොටගෙන අපමණ වූ දුක් කම්කටොළු වලට ලෝක සත්වයා මුහුණු දෙයි. සසර ගමන තව තවත් දීර්ඝ වන්නේ යහපත අයහපත මුහුණ පිළිබඳ අනවබෝධයෙන් යුතුව ජීවත්වීම නිසාවෙනි. අනේක වූ සත්වයින්ගේ යුක්ත වූ ලෝකයෙහි මිනිසා නැමැති සත්වයාට විශේෂත්වයක් හිමිවේ. මනසින් උසස් වූ නිසා මිනිසා යනුවෙන් සළකයි. එනම් දියුණු ඥාණ ශක්තියක් හෙවත් සිහි කල්පනාවෙන් යුක්තව කටයුතු කිරීමට හැකි පිරිසක් වශයෙනි. දෙවි බඹුන්ගේ චිත්ත සන්තානයේ සර්වඥතා ඥාණය පහල වන්නේ නැත. එය පහළ වන්නේ මිනිස් සිත තුල පමණි. ඒ අනුව මිනිසත් බව කොයිතරම් වටිනවාදැයි තේරුම් ගැනීමට මෙය හොඳ උදාහරණයකි.

කරුණාව, දයාව, ඉවසීම, මුදිතාව, මෛත්‍රිය වැනි මානුෂීය ගුණාංගයන් වඩ වඩාත් දියුණු කරගැනීම නිසා පුද්ගලයා වඩ වඩාත් සමාජය තුළ බබලයි. බොහෝ දෙනාගේ ප්‍රසාදයට පත්වෙයි. නමුත් වර්තමාන සමාජය දෙස විමසිල්ලෙන් බලන විට පෙනී යන්නේ මානුෂීය ගුණාංගයන් පසෙකලා පවට බරක් වී සමාජයට අසම්මත ක්‍රියා සිදුකරමින් තමන් ලැබූ දුනුම් මිනිසත් බවට නිගා කරන පිරිස් බහුලව ජීවත් වන බවයි. ධර්මය පිළිබඳ අවබෝධයක් නැතිකම එයට ප්‍රධාන හේතුවයි. හොඳ නරක,යහපත් අයහපත් කටයුතු හඳුනා නොගෙන ජීවත්වන්නේ ඒ නිසාවෙනි.

සෑම ක්‍රියාවකටම ප්‍රතික්‍රියාවක් තිබේ. පවු කරන්නී මෙලොව පරලොව අනේක වූ දුක් විඳ දුගතිගාමී වෙයි. පින් කරන්නා මෙලො පරලොව අනේක වූ දිව්‍ය මානුෂීය සැප විඳ නිර්වාණාවබෝධය ලබා ගනී. සෑම විටෙකම සල් හෝ අකුසල් සිදු කරනු ලබන්නේ සිත, කය, වචනය, යන තිදොරින්ය. මෙම සිත, කය, වචනය යන තිදොරින් සිදුවන අකුසල් සිදු කිරීමට මේ තුන්දොර හික්මවා ගත යුතුය.

ඒ තුළින් සීලය ආරක්ෂා වේ. බෞද්ධයාගේ නිත්‍ය ශීලය පංච ශීලයයි. එය ආරක්ෂා කිරීම තුලින් සිත කය වචනය තුන්දොර සංවර කරගැනීමට හැකිය. පරපණ නැසීම, අන්සතු දේ ගැනීම, කාමය වරදවා හැසිරීම, බොරු කීම, මත්පැන් භාවිතය යන පස් පව්වලින් වැළකී මාපියන් හට ඇප උපස්ථාන කරන වැඩිහිටියන්ට ගරු කරන පිදිය යුත්තන් පුදන සියළු සත්වයන් කෙරෙහි මෙත් සිත පතුරන කාරුණාව දයාව ඉවසීම සමානාත්මතාව මුදිතාව වැනි ගුණාංගයන් පූර්ණය කරන පුද්ගලයින් තම විමුක්තිය උට්ඨාන වීර්යෙන් යුක්තව සලසා ගනී. සදාතනික සුවය විඳියි. සසර ගමන කෙටිකර ගනී.

**"යාදිසං වපතෙ බීජං - තාදිසං හරතෙ ඵලං ,**

ඔබ යමක් වපුරනවාද එහි අස්වැන්න ඔබට ලැබේ. එසේම කරන කියන සිතන පින් පව්වල විපාකයන්ද එලෙසින්ම විඳීමට සිදුවෙයි. මනාව සිහියෙන් යුක්තව කටයුතු කර ඉතා දුර්ලභ වූ මේ ජීවිතයේ නිසි ප්‍රයෝජන සලසා ගැනීමට අනලස්ව කටයුතු කරන්න.

ලෞකික සැප සම්පත් සිතට සුවයක් ලඟා කරගත නොහැක. එම සැපය තාවකාලිකය. ආධ්‍යාත්මික ගුණ වර්ධනය කොටගෙන ලෝකෝත්තර සුවය විඳින්න.



බුදුරජාණන් වහන්සේ පමණක් නොව සාරිපුත්ත මහරහතන් වහන්සේ වැනි මහා ශ්‍රාවකයන් වහන්සේලා නොයෙක් අවස්ථාවල කරන ලද දේශනාවල සමතිස් බෝධිපාක්ෂික ධර්ම අත්කරගත වී තිබේ. බුදුරජාණන් වහන්සේ ශාක්‍ය ජනපදයේ සාම ග්‍රාමයේ වැඩවසන සමයේ ආනන්ද

තෙරුන් හා චුන්ද සාමණේරයන් අමතා තමන් අවබෝධ කොට ගෙන ඇති ධර්ම ලෙසින් මෙම බෝධිපාක්ෂික ධර්ම හඳුන්වා දී ඇත. ඒ බව මජ්ඣිම නිකායේ සාමග්‍රාම සූත්‍රයේ දක්වේ. මේ කරුණම නැවත බුදුරජාණන් වහන්සේ විසින් කුසිනාරා නුවර බලිහරණ වනපෙදෙසේදී වදාල බව මජ්ඣිම නිකායේ කිත්ති සූත්‍රයෙන් පෙනේ.

දීඝ නිකායේ සංගීත සූත්‍රයේ බුදුරජාණන් වහන්සේගේ අනුදැනුම පරිදි සැරියුත් තෙරුන් ධර්මය සංඝායනාවක් ලෙසට භික්ෂූන් අමතා දේශනා කළ ධර්ම කොටස් රාශියක් දක්වේ. නමුත් මෙහි පංච බලය නොදක්වේ. සද්ධා බලය හැරුණු කොට අනෙක් බල සතර සඳහන් වේ. ප්‍රභේද වශයෙන් තිස්හතක් වන මෙම බෝධි පාක්ෂික ධර්ම සමූහය පරමාර්ථ ධර්ම වශයෙන් සඝ, විරිය, ඡන්ද, චිත්ත, පඤ්ඤා, සද්ධා, ඒකග්ගතා, පීති, පස්සද්ධි, තත්‍රමජ්ඣත්තතා, විතක්ක සම්මවාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව යනුවෙන් 14ක් වෙයි. සංයුක්ත නිකායේ අසංඛත සංයුතියෙහි අසංඛත වර්ගයෙහි සූත්‍ර හතළිස් පහක් දක්නට ලැබේ.

ඒ අතර වැඩි ප්‍රමාණයක් සූත්‍රවල අන්තර්ගත වන්නේ බෝධි පාක්ෂික ධර්මයයි.

ඒ හැමතැනකම සඳහන් වන්නේ ඒ ධර්ම සමූහය නිවන් මඟ බවත් නිවන් මඟ පිළිබඳ තමන් වහන්සේගේ අනුශාසනාව බවත් බුදුරජාණන් වහන්සේ අවධාරණය කොට ඇත.

යමෙක් මෙලොව යහපත් තැනක උපත ලබා ගෙවල් යාන වාහන ආදී නොයෙක් සැප සම්පතිස් පිරි ජීවිත ගත කරන්නේ පෙර කරන ලද කුසල් නිසාවෙනි. ඒ වුවත් ඒ කුසල් විපාක දී කෙදිනක හෝ නැතිවී යයි. යම් දෙයක් හටගනී නම් එය යම් කාලයක් පැවත කුමන මොහොතක හෝ නැතිවී යයි. ඒ නිසා වඩ වඩාත් කුසල් දහම වඩා මේ දුක් සහිත වූ සසර කතරින් එතෙර වීමට නොපමාව උත්සාහ කළ යුතුය. මිනිස් බව ලැබීම ඉතා දුර්ලභ වූ කරුණකි. අකුසලයට බරව කටයුතු කිරීම නිසා කල්ප ගණන් සසර දුක් විඳීමට සිදු වන බව දක්වා තිබේ. මිනිසාට මෙතෙක් යැයි නිගමනය කළ හැකි පමණ කාලයක් දුක් විඳීමට සිදුවේ. බුද්ධ දේශනාවේ සඳහන් ඉතා දුර්ලභ කරුණු සතරක් අප ලබාගෙන ඇත.

එහි වටිනාකම නියමාකාරයෙන් තේරුම් ගෙන අයහපතින් මිදී ලැබෙන සෑම අවස්ථාවකදීම කුසල් සිත් පෙරටු කොටගෙන ගුණ ධර්ම වැඩිදියුණු කරගෙන බුදු පසේ බුදු, මහරහත් යන උතුමන් වහන්සේලා සැප යැයි නිවී සැනහී වදාළ උතුම් වූ නිර්වාණය සාක්ෂාත් කරගැනීමට අප්‍රමාදීව වීර්යෙන් යුතුව කටයුතු කරත්වා..! මොහොතකුදු සඟමොක් සුවය ලබා ගැනීමට පමා නොකල යුතුය.

රාජගුරු සරණ හිමි

# සියල්ල ඔබ අතහැර යයි

ඔබේ ජීවිතයේ සෑහෙන කාලයක් දැනටමත් අවසන් කර ඇත. ඔබේ දෙනෙතට සිත්කලු නයනානන්දනීය දර්ශන කෙතෙකුත් හමුවී ඇත. සමහර විට දේශදේශාන්තරයන්හි මහා ධනස්කන්ධයක් වැය කර සංචාරය කරනුයේ මනඃකාන්ත දර්ශන සොයාගෙනය. ඒ සියලු දර්ශන නෙත ගැටෙන මොහොතකට පමණි. ඊට වඩා යමක් එහි නොවේ. හුදෙක් දැන් මතකයක් පමණි.

හැඟුම් දනවන මිහිරි හඬින් කණ පිනවන තැන් හොයාගෙන කොතරම් නම් ඔබ වෙහෙසෙන්න ඇද්ද? සංගීත සංඛ්‍යාවන්ට ප්‍රිය සම්භාෂණ වලට සියගණනින් සහභාගීවන්න ඇත. ගුවන්විදුලි විද්‍යුත් මාධ්‍ය මඟින් නිකුත් වූ මනහර හඬට ඔබ වශීකෘත වෙලා අමන්දානන්දයට පත්වෙලා කොතෙකුත් ඉන්න ඇති ඒ මිහිර ඒ වෙලාවට පමණි. ඊට එහා ගිය යමක් තවත් ඉතිරි වී ඇද්ද? බොඳවී යන මතක සටහනක් පමණි.

දිව පිනවන ප්‍රණීත ආහාර කෙතෙක් නම් අනුභව කර ඇද්ද? රස මසවුලෙන් යුත් දිව බොජුන් බඳු අහර දිව ගා රස බලා ඇත. තළු මරා ඇත. ඒ ප්‍රණීත බව මිහිර දිවට සම්බන්ධ වෙලා තිබෙන සුළු මොහොතට පමණි. කෝ දැන් ඒ රසය. මිහිර. ඒ මොහොතකට පමණක් සීමාවූ මතකයක් ඇත් වූ යටගියාවක් පමණි. ඊට වඩා යමක් එහි ඇද්ද?

මෙසේ සියලුම ආයතන හෙවත් ඇස, කණ, නාසය, දිව, කය, යන ඉන්ද්‍රිය සම්බන්ධව මිහිර සතුට වින්දනය හොයා ගතකල ජීවිත කාලයම සිහිනයක් පමණි. ඒ ඒ අවස්ථාවලදී ලබාගත් මිහිර, සතුට, සැපත, වින්දනය, සදාකාලිකව පවත්වාගෙන යාමට කිසියම් හෝ ක්‍රමවේදයක් ලෝකය තුල නැත. ඒ සියල්ල ස්වභාව ධර්මයට අයත්ය. අප අපේ යයි පරිහරණය කරන භෞතික වූ ගේ දොර, ඉඩ කඩම්, මිල මුදල්, හරක බාන, යාන වාහන, ඇඳුම් පැළඳුම්, කෑම් බීම් ආදී සියලු දෑ ස්වභාව ධර්මයට අයිති බව මිසක් ඔබට මට අයිති නැත. "ඔබට අයත්ය - මට අයිතිය" යනු හැඟීම් මාත්‍රයක් පමණි. දැනටමත් ඒවා අප අතහැර ගොස්ය. ඒ හැර ගිය අයිතිය ආයේ කවදාවත් නැවත නොඑනු ඇත. ඔබට අයිති නැත්නම් ඔබගේ කැමැත්ත පරිදි පරිහරණය කරන්න බැරිනම් නැවත පැමිණීමක් කිසිසේත් බලාපොරොත්තු විය නොහැකිනම් සන්තකයේ තබාගන්න බැරිනම් ගතින් සිතින් සියලුම ලෝක ධර්මයක් අත්හරින්න. ඔබට අයිතියි කියා ඔබ බලහත්කාරයෙන් මෙතෙක් කල් ලංකරගෙන සිටීමක් ඔබට ගැලපෙන්නේ නැති නොහොබිනා ක්‍රියාවකි.

ඒ මංකොල්ල කෑමකි. "මම" කියා කෙනෙක් පනවාගෙන අයිති නැති දෙයක් බලහත්කාරයෙන් දැඩිව ගැනීම හෙවත් "කොල්ල" කෑමකි. "මම" පනවා ගන්නා තාක්කල් ඔබ "දුක" උරුමකර ගනී.

ජීවිතය ගඟක් හා සාමානය. ගඟ පහලට ගලා බසී. ගඟේ ස්වභාවය නොදන්නා කෙනෙක් ගඟ ඉහලට හැරවීමට උත්සාහ කරයි. නමුත් ස්වභාවයෙන්ම පහලට ගලා යන ගඟ කවදාවත් ඉහලට හෙවත් උඩුගම් බලා හැරවීමට ඔහුට නොහැකිය. ඒ නිසා නොසතුටට පත්වී කලකිරෙයි. වරද ගඟේ නොවේ. ස්වභාව ධර්මයේ වරදක්ද නොවේ. ඔහුගෙයි වරදයි. වැරදි සිතුවිල්ලක් සංකල්පයක් නිසා නොමඟ ගිය ඔහුට සැනසිල්ලක් නැත. ඒ නිසාම පසුතැවෙයි. ස්වභාවයෙන්ම උපතින්ම දඟර ගැසී වකුටුවී ඇති "බලු නගුට" උණ පුරුකේ දමා කෙලින් කිරීමට ගන්නා උත්සාහය හා සමානයි.

තුන්ලෝක ධාතුවේ සියලුම සත්වයන්ට මේ ස්වභාව ධර්මයේ යථාර්ථය තමයි ශාන්ති නායක බුදු පියාණන් වහන්සේ වදාළේ. ස්වභාවධර්මයේ යථාර්ථය හරිහැටි නිවැරදිව තේරුම් ගතහොත් ලෝක ධර්මයන් නිසා ලැබෙන දුක නැතිකර ගත හැකිවා මෙන්ම ලෝකයෙන් එතෙරවීමේ හැකියාවද ඇතිකර ගතහැක.

ඔබේශරීරය දිහා විමසිල්ලෙන් බලන්න. ඔබේ තරුණ සිරුර කෙමෙන් ජරාවට යනවා. ජරාවටයාම ස්වභාව ධර්මයේ ස්වභාවයයි. එහි කිසිම වැරුද්දක් නැත. ජරාවට පත්වීම ගැන ඔබ කනස්සල්ලට පත්වන්නේ ස්වභාව ධර්මය ගැන හරිහැටි දැනුවත් වී නොමැති නිසාය. හරි හැටි දැනගත්තොත් කිසිසේත් පසුතැවිලි නොවනු ඇත. ජරාවට පත් නොවුයේ නම් ඔබ පුදුම විය යුතුය. කුමක් නිසාද? තවම ජරාවට දිරීමට පත් නොවීම ගැන.



පාදාන්තයේ සිට කේෂාන්තය දක්වා මෙනෙහි කරන්න. හිස මුදුනේ ඇති කෙසේ ඔබගේද? නැත. කෙස් දන්නේ නැහැ තමන් හිසක් මුදුනේ ඉන්නවා කියලා. හිස දන්නේ නැහැ තම හිස මත කෙස් ඉන්නවා කියලා. කෙස් නැමැති රූපය ස්වභාව ධර්මයට අයිති දෙයක්. එය ඔබ අතහැර දමා යනවා. කෙස් දුර්වර්ණවීම, සුදුවීම, තඹ පැහැගැන්වීම, කැඩී බිඳීයාම ඉදිරීයාම ස්වභාවයයි. ඒ එයාගේ හැටි. එයට තහංචි දාන්න ඔබට මට බැහැ. එය එතැනට අයිති නැත. එයාගේ නියම තැන එතැන නොවේ. ඒ නිසා එතැන අතහැර දමා යනවා. ඔබට අවනත නැත. අවනත නැත්නම් ඔබ වසඟයේ පවතින්නේ නැත්නම් ඔබගේ කැමැත්ත පරිදි ඉන්නේ නැත්නම් යන්න දෙන්න. ශෝක නොකරන්න. මායිම් නොකරන්න. තාවකාලිකව අටවාගත්තා පමණි. මේ ගැන නොදන්න කමට මෝඩකමට අඩනවා, දොඩනවා, පසුතැවිලි වෙනවා. යථාර්තයට මුහුණ දෙන්න. ස්වභාව ධර්මයට අනුගත වන්න.

දත්ටික ගැලවී යනවා. දතට සදාකාලිකව වැජඹෙන්න කය ස්ථිරසාර තැනක් නොවේ. එයා ඇනිත් තියෙන්නේ තාවකාලිකවයි. ඔයා එයාට එන්න කිව්වේත් නැහැ. එන්න එපා. කිව්වට අවනත වන්නේත් නැහැ. මේ නිසා ඇඩීම දෙඩීම මොනතරම් මෝඩ ක්‍රියාවක්ද? සියලුම ඉන්ද්‍රියන්ගේ ආයුකාලය ඉවර උනාම ඔබ හැර පලායනවා. ඒ අය තාවකාලිකව අටවාගෙන සිටි අය නිසයි එහෙම යන්නේ. ඔබ මෝඩ උනාට මෙනවා කරන්නද? මෙසේ දත කට නාසය දිය කෙස් ලොම් නියපොතු හම ඇතුලු සියලුම අවයව ඒවාට මෙහි නිවහන නොවන නිසා වෙලාව ආවාම කෙමෙන් කෙමෙන් ඔබ අඩ අඩා සිටියදී යන්න යනවා. ඔබට ස්වභාව ධර්මයේ පාඩම උගන්වමින්.

ඔබේ යයි කියාගෙන උදේ සවස මැද සුද්ධකර තිබෙන දත් වඩා ශක්තිමත් කරන්න මොනතරම් නම් පෝෂදායී ආහාර විටමින්, කැල්සියම් ගන්න ඇද්ද? ඔබේ රැකවරණයෙන් ඔබේ උදව්වෙන් පිහිටෙන් ආරක්ෂාවෙන් සිටිය දත් ඔබට මොනතරම් දුක්දී ඇද්ද? දවස් ගණන් නිදිමරාගෙන දත් කැක්කුම නිසා අඩ අඩා කෙදිරි ගගා ඉන්න ඇද්ද? දන්ත ආරෝග්‍ය ශාලාවල මොනතරම් කාලයක් පෝලිම්වල සිටගෙන බෙහෙත් ගන්න ඇද්ද? දත් දොස්තර මහත්ම මහත්මීන්ට මොනතරම් මුදල් ප්‍රමාණයක් වියදම් කරන්න ඇද්ද? ඒ මදිවට කුණුවෙලා, දිරලා, නරක් වෙලා අවසානයේදී ගලවා දානවා. මගේ...මගේ යයි ආරක්ෂා කරගත් දත් දුන් දුක ඔබ් මිත්‍රයෙක්වත් ඥාතියෙක්වත් දරුවෙක්වත් හතරෙක්වත් දෙන්න නැතුව ඇති. එසේම කණේ ලෙඩ, කටේ ලෙඩ, නාසයේ ලෙඩ, ඇසේ ලෙඩ, බඩේ ලෙඩ, හදවතේ ලෙඩ මුලු ජීවිත කාලයම ශරීරයේ එක එක ඉන්ද්‍රිය නිසා මහ දුක් ගොඩක් විඳවා ඇත. ඉදිරියේදී එය තව තවත් වැඩිවෙනවා හැර අඩුවීමක් බලාපොරොත්තු විය නොහැක.

තාවකාලිකව අටවාගත් කය ඔබ ඔබේ කරගන්න වෙර දරනවා. ඔබේ දෙනෙත් දැන් පේන්නෙ නැහැ. ඒ පෙනීම ඔබහැර පලාගොස්. දත් නැහැ. හපන්න බැහැ. දත් ඔබ හැර පලාගොස්. කණ ඇහෙන්නේ නැහැ. ඇසීමේ ශක්තිය ඔබ අතහැර ගොස්. දිවට රස දැනෙන්නේ නැහැ. රස දැනීමේ ශක්තිය ඔබහැර පලාගොස්. ඔබ රෝගියෙක්. නීරෝගී බව ඔබ හැර පලාගොස්. ආයේ කවදාවත් ඒවී කියා බලාපොරොත්තු වෙන්න එපා. නොලැබෙන දේකට ශෝක කිරීම මහ මෝඩකමක්. ඒ මදිවට තවත් මෝඩකමට උපත ප්‍රාර්ථනා කරනවා. භවය පතනවා. දුකට ලැබේවායි පතනවා.

**"අසසකො ලොකො සබ්බං පහාය ගමනීයං"**
**මගේ යයි ලංකරගත් සියල්ල අතහැර දමා යායුතුය.**

**"උපනීයති ලොකෝ අද්ධුවෝ"**
**නිරන්තරයෙන් ජරාමරණාදී කරා කැඳවයි. කිසිඳු දෙයක ස්ථිර බවක් නැත.**

**"අත්තාණො ලොකෝ අනභිස්සරෝ"**
**රෝග පීඩාදී දුක් වලින් බේරා ගැනීමට ආරක්ෂා කිරීමට පිහිටක් නැත. අසරණයි.**

ඔබ අම්බලමක තාවකාලිකව නවාතැන්ගෙන සිටින මගියෙකු හා සමානයි. කුලි පදනම මත ගෙයක සිටින කුලීකාරයෙක් හා සමානයි. ඔබට ස්ථිර නිවහනක් නැත. මේ කොතන හිටියත් ඔබේ සිතේ යම් පසුබෑමක් ලොකු අඩුවක් ලොකු හිඩසක් අතෘප්තිකර බවක්

15 පිටුවට...

පූජ්‍ය සිරි සීවලී හිමි

04 පිටුවෙන්...

වරදක් සිදුවූවා නම් ඒ සියල්ල සමාකරගෙන නව වර්ෂයේ වාදභේදවලින් තොර සාමකාමී බවක් ඇතිකර ගැනීම සුවයක් ගෙන දෙන්නකි.

නානු හෙවත් හිසතෙල් ගෑම, අවුරුදු නැකැත් වල එන තවත් සුවිශේෂී චාරිත්‍රයකි. විහාරස්ථානයක හෝ ආගමික ස්ථානයක් කේන්ද්‍ර කරගනිමින් පනත්වන මෙම කාර්යය මුලින් සඳහන් කළ සිරිත් විරිත් වලට දෙවැනි නොවන තරමිය.

සුවදායී ජීවිතයක් ගත කිරීමට අත්‍යාවශ්‍ය වන්නේ නිරෝගී බවයි. (ආරෝග්‍යා පරමාලාභා) යනුවෙන් බුදුන් වහන්සේ පරම, උතුම්ම ලාභය නම් නිරෝගී බව ලැබීම යනුවෙන් දේශනා කොට ඇත. හිසතෙල් ගෑමෙන් දීර්ඝායුෂත් නීරෝගී බවත් ඇතිකර ගැනීමට හැකිවේ. එනිසා අවුරුදු උදාවත් සමඟම හිස පිරිසිදු කර නෑම සෞභාග්‍ය කරා යොමු කරයි.

ඊළඟට එන ස්නානද සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගතකිරීමට තුඩුදෙන්නාවූ ප්‍රබල සාධකයකි.

iv පිටුවෙන්...

# සියල්ල ඔබ අතහැර යයි

ලොකු අඩුවක් ලොකු හිඩසක් අතෘප්තිකර බවක් හොල්මන් කරනවා.

ඔබට මේ කරදරකාරි ලෝකයෙන් ඉවත්වන අයුරු ලෝකයට පහළ වූ සැබෑ විමුක්ති දායකයාණන් වහන්සේ ඉතා හොඳින් පැහැදිලි කර දෙනු ඇත. සියලුම සත්ත්ව ප්‍රජාවම සොයන්නේ සැනසිල්ලයි. නැත්තේත් එකයි. හේතුව ලෝකය තුළ සැනසිල්ල කියා දෙයක් නැත. ඇත්තේ වැනසිල්ලයි. දුප්පතාට සැනසිල්ල නැතුවා මෙන්ම පොහොසතාටද නැත.

උගතාට සැනසිල්ල නැතුවා මෙන්ම නූගතාටද නැත. වැඩිහිටියාට සැනසිල්ල නැතුවා මෙන්ම බාලයාටද නැත. සැනසිල්ල තරුණයාට නැතුවා මෙන්ම මහල්ලාටද නැත. ලෝකයේ ස්වභාවය එයයි. තත්වය මෙසේ නම් ස්ථිරසාර විසඳුමක් ලෝකය තුල සෙවීම සිහිනයක් පමණි. ලෝක ධර්මයන් අත්හැරීම තුළින්මයි සැනසිල්ල උදා වන්නේ.

පළමුව "මම" අත්හරින්න. ලෝකයේ කිසිම දෙයක් තමාගේ නොවන නිසා නොසලකා හරින්න. මායිම් නොකරන්න. දූ දරුවෝ, ස්වාමිභාර්යා, දෙමාපියෝ, ඥාතී මිත්‍රාදීන් තාවකාලිකව අම්බලමේදී හමුවූ මගියන් පමණි.

සමහර මගියන් ඔබට කලින් අම්බලමෙන් නොකියාම පිටවී යයි. ඊට කමක් නැත. ඒ අය ඔබගේ නොවන නිසා එන්න කියා ආවේත් නැතිනම් එපා කිව්වට ඉන්නේත් නැතිනම් අත්හරින්න. එසේම මේ ස්වභාව ධර්මයේ නීතියට තමාටත් එකයි.

සවිඥානක, අවිඥානක සතා පුද්ගලයා භෞතික සියලුම දේ යාම සඳහා ගමන් අරඹා ඇත. ඔබ තවමත් පැලපදියම්වීමට උත්සාහ ගන්නවා. සූදානම් වෙනවා. අද වැඩ කරන්නේ හෙට ඊටත් වඩා හොඳට ජීවත්වීමේ අදහසින්. එහෙත් ස්ථිර විශ්වාසයක් තැබිය හැකි තැනක් නොවේ. මෙහි යථාර්ථය අවබෝධ වෙන්න වෙන්න ආශා විරහිත බවට පත්වී අත්හැරීමට නිතැනින්ම නැඹුරුවේ. ලෝකය සකස්වී තියෙන්නේ අපිලිවෙලටය.

ඔබ පිලිවෙලක් කරන්න පිළියම් යෙදුවට උත්සාහ කලත් මහන්සි ගත්තත් නිරපරාදේ කිසිම වැඩක් වෙන්නේ නැහැ. ලෝකයේ යථාර්ථය දකිනවා යනු කලකිරෙනවා නොවේ. ඇත්ත ඇති සැටියෙන් දැකීමයි.

යථාර්ථය අවබෝධයයි. ඔබට බොහෝ දේවල් ඇත්නම් බොහෝ කාලයක් යවා අත්හරින්න. ස්වල්පයක් ඇත්නම් නිමේෂයකින් අතහැරිය හැක. ඒ සඳහා සූදානම් වන්න. දැන්ම හිතෙන් අත්හරින්න. විවේකීව ඉන්න. සැනසිල්ල එතනයි, නිවන එතනයි.



**ධම්ම පද ගීතය**
**(යමක වග්ග 27, 28 ඇසුරිනි)**

**මිණි ටැඹ මත**

**නැකත් පසුපස දුවන්නෝ**
**කෙදින සැනසුම ලබයිදෝ**
**අඹර ඇවිදින තාරකා**
**සැනසුමේ මඟ කියයිදෝ....**

**පසිඳුරන් හා වෙලි වෙලි**
**කාම සැපතේ රහ විඳී**
**දහම් මාවත නොයන මිනිහා**
**සදා අඳුරට වී හිඳී...**

**පමාවේ බැම් සිඳ දමා**
**පියෙන් පියවර පිය නඟා**
**මහා නැණ ටැඹ මතට**
**පිවිසී**
**බලයි වැළපෙන දන දිහා...**

13 පිටුවෙන්...

# පන්සල හා එහි කාර්යභාරය

පන්සලෙහි නායක හිමිපාණන් වෙත ය. උන්වහන්සේ සිංහල වෛද්‍ය ශාස්ත්‍රය පිළිබඳ මනා අවබෝධයක් ඇත්තෙක් වූහ. බොහෝ විට ඖෂධ පැළෑටි පන්සල් භූමිය තුළ වගා කරන්නට විය. වස් කාලයේ දී බොහෝ බෙහෙත් ද්‍රව්‍ය ගැමියන් පන්සලට පූජා කළ අතර වෙද හාමුරුවෝ ඒවා නැවත ජනතා සුභසිද්ධිය සඳහාම භාවිත කළහ.

වෛද්‍ය කටයුතු පමණක් නොව ජෝතිෂ්‍ය කටයුතු ද නායක හාමුදුරුන් විසින් සිදු වූ අතර ගැමි ජීවිතය හා බැඳුණු මඟුල් තුලා, දරුවන් ඉපදීම, නම් තැබීම, කෙස් කැපීම, අකුරු කියවීම, ගොයම් වැපිරීම, අස්වනු කැපීම, අස්වනු ගෙන ඒම, විවාහය, රෝගී අවස්ථාව, ජීව දානය, ගෙවල් ඉදි කිරීම, නැකතට පදිංචි වීම.

ගෙට ගෙවදීම, මරණය , පාංශුකූලය සහ මරණයෙන් පසුව කෙරෙන චාරිත්‍ර යනාදි සකලවිද අංගයන් හා පන්සල අනිවාර්යෙන්ම සම්බන්ධ වූ අතර ගැමියාට පන්සලෙන් තොරව සමාජ පැවැත්මක් පිළිබඳව සිතීමටවක් නොහැකි විය. පන්සල අතර පවතින අන්‍යෝන්‍ය සබඳතාද සන්නිවේදනයත් අතර දැඩි සමීප බවක් දක්නට ලැබුණි.

සංස්කෘතික කේන්ද්‍රස්ථානය පන්සල වේ. නායකත්වයේ කේන්ද්‍රස්ථානයද විය. ගමෙහි අභිවෘද්ධිය පිළිබඳව සියලු තීරණ ගනු ලැබුවේ පන්සල විසින් ය.

ගමේ පන්සලේ නායක හාමුදුරුවන්ගේ තීරණය ගම්වාසීන්ගේ ද අවසාන තීරණය විය.

පන්සල ගමේ ප්‍රධාන සන්නිවේදනකේන්ද්‍රස්ථානය විය. පන්සලේ විවිධ කටයුතු හා සම්බන්ධව බෙර වාදන, හේවිසිවාදන,හොරණෑ වාදන පැවතුණ අතර මෙමගින් ඇතැම්විට ගැමියෝ වේලාව පිළිබඳව තීරණයකට අවතීරණය වූහ. එපමණක් නොව උදයේ ආහාර පූජාව, දහවල් ආහාර පූජාව. දහවල් දානය, සවස ගිලන්පස හා මල් පූජාව, බෝධි පූජාව, රාත්‍රී ධර්මදේශනය යනාදිය පිළිබඳව ද දැනුවත් වූහ. ලංකාවේ පිහිටි සෑම පන්සලකම නියමිත වේලාවට

1. අලුයම් ධූරය
2. දහවල් ධූරය
3. සැන්දෑ ධූරය

යන වාදන තුන එකම මොහොතක වාදනය විය. මහනුවර ශ්‍රී දළදා මාළිගාව ප්‍රධාන කරගත් සිද්ධස්ථානවලින් පටන්ගෙන ලංකාවේ සියලුම පන්සල් තුළ මෙම සන්නිවේදන ජාලය ක්‍රියාත්මත විය. හේවිසි ශබ්ද හා සණ්ටාර ශබ්ද වර්තමානයේත් පන්සල්වල ක්‍රියාත්මක වන අතර මෙය ආරම්භ වුයේ කවදාදැයි නිශ්චිතව කිව නොහැකිය.සණ්ටාරය එක්තරා රිද්මයකට නාද කිරීම, නිශ්චිත වාරයක් නාද කිරීම, යනාදිය තුළින් යම් යම් අදහස් ගම්වැසියන්ට සම්ප්‍රේෂණය කෙරිණි.. විශේෂයෙන්ම කිසියම් ගැටලුකාරී අවස්ථාවක් එසේ නැතිනම් ක්ෂණික තීරණයක් ගැනීමට අවශ්‍ය අවස්ථාවක් ,ඇතැම්විට ගමෙහි සිදු වූ මරණයක් පිළිබඳව ගම්වාසීන් දැනුවත් කිරීම සඳහා සණ්ටාරය එක්තරා රිද්මයකට නාද කරනු ලබයි. ගම්වැසියෝ මේ පිළිබඳව මනා අවබෝධයකින් සිටියහ.

දිවා කාලයේ ගොවිතැන් ආදී විවිධ කාර්යයන් හි නියැලුණ ගැමියෝ රාත්‍රී කාලයේ දී විහාරස්ථාන කරා ඒකාරාශී වූහ. බුද්ධ පූජා, බෝධිපූජා යනාදියෙහි සමගිසම්පන්නව යෙදුණ ගැමියෝ එමගින් ධාර්මික ප්‍රීති සුවයක් අත් වින්දහ. සතර පෝයටම සිල් සමාදන් වූහ. මුල් කාලයේ දී රජවරුන් පවා එකම ධර්මශාලාවේ ජනතාව සමඟ අසුන්ගෙන පසළොස්වක පොහොය දින සිල් සමාදන් වී ඇති බවට මහාවංශය සාක්ෂි දරයි. පන්සලේ නායක හිමිපාණන් තම නිවසට වැඩමවා ධර්ම දේශනා පැවැත්වීම සුලබ සිද්ධියක් විය. බොහෝ විට ගමෙහි ලියකියවිය හැකි ජනයා පන්සිය පනස් ජාතක පොත,පූජාවලිය,සද්ධර්මරත්නාවලිය,යනාදි සම්භාව්‍ය ග්‍රන්ථ පරිශීලනය කළේ පන්සලේ පොත් ගුලෙනි. එම ග්‍රන්ථ තුළ වූ සුවිශේෂී චරිත ග්‍රාමීය ව්‍යවහාරයට ප්‍රවිෂ්ට වුයේ පන්සල කේන්ද්‍රකරගෙන ය.

'අනේ අනිච්චං'
'මහාමූසිලයෙක්'
'දේවදත්තයෙක්'
'බුදුවෙන්න ගියත් මාරයෙක්' 'අදින්න පුබ්බකයෙක්'
'මසුරු සිටාණ කෙනෙක්' '
කාලකණ්ණියෙක්'

ආදී යෙදුම් ගැමි භාෂා ව්‍යවහාරයට එක් විය. එමගින් අපේක්ෂා කළේ අකුසලයෙහි වෙළුණු ජනයා ඉන් මුදවාගෙන කුසලයෙහි යෙදවීමයි.

වෙසක් පොහොය, ඇසල උත්සවය, අලුත් අවුරුදු චාරිත්‍ර , කඨින උත්සවය, ගිරිහණ්ඩ පූජා , පැවිදි උත්සව, උපසම්පදා උත්සව, දාන ව්‍යාපාර, ශීල ව්‍යාපර, ශ්‍රමදාන ව්‍යාපාර, පන්සල කේන්ද්‍රකර ගනිමින් සංවිධානය විය. ගම් වැසියා මේ සියල්ල වටා ඒකරාශී වෙමින් තම කාලය ශ්‍රමය, ධනය කැප කළේ මහත් වූ රුචිකත්වයෙනි. ධාර්මික ප්‍රීති සුවයක් අත් විඳිමිනි.

''රජ්ජ සුඛස්ස වායාමො
නායං මම කුදාචන
සම්බුද්ධ සාසනස්සේව
ථපනාය අයං මම''

මාගේ මේ ප්‍රයත්නය හුදෙක් රජ සැප විඳීමට නොව සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය හා චිර ජීවනය සඳහා බව එදා දුටුගැමුණු රජතුමා ප්‍රකාශ කළේ පන්සලෙන් ලත් පන්නරය කොට ගෙනයි. රටේ රජතුමා පමණක් නොව ගමේ ජනතාව ද බුදු දහම රැක ගැනීම සිය ඒකායන ප්‍රාර්ථනය කරගෙන කටයුතු කළහ. සිංහල රට බෞද්ධ රටක් විය. රටපුරා බෞද්ධ සංස්කෘතියක් ඇති විය. පන්සල කේන්ද්‍රකර ගෙන ලංකාද්විපය ථෙරවාදී බෞද්ධ මධ්‍යස්ථානයක් බවට පත්වන්නට විය.



# සුපසන් සමාජයක් උදෙසා එකමුතු වෙමු

දෙදෙනෙක් ඔවුනොවුන්ගේ අදහස් තේරුම් ගෙන කලකෝලාහල වලින් තොරව කටයුතු කිරීමද ගමක් තවත් ගමක් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමද රටක් තවත් රටක් සමග සහයෝගයෙන් කටයුතු කිරීමද සමාජයක් තවත් සමාජයක් සමග එකමුතුව  කටයුතු කිරීම ද සමගිය ලෙස සරලව හඳුන්වාදිය හැකිය.

එමෙන්ම මෙම සෑම අංශයකම විවාද සහිත බව සහ සහයෝගයෙන් තොර ස්වභාවය අසමගිය ලෙසද හඳුන්වා දිය හැකිය.
සමගිය නැති තැන පිරිහීමද සමගිය ඇති තැන සැපත සතුට දියුණුව නිරන්තරයෙන් පවතී.

රටක විවිධ ආගම් විවිධ දේශපාලන පක්ෂ විවිධ ආර්ථික න්‍යායයන් මෙන්ම විවිධ අධ්‍යාපනික ක්‍රම වේදයන් පැවති නමුත් එම විවිධත්වය මතින් සැකය අවිශ්වාසය හරහා ආගම් අතර දේශපාලන පක්ෂ අතර හා ආර්ථික අධ්‍යාපන යන අංශයන්හීද අසමගිය ඇති වුවහොත් එම රටේ සමාජයේ බිඳ වැටීම පිරිහීම සිදුවේ.

මක් නිසාද යත් එම අසමගිය හරහා තම තමන්ගේ අයිතීන් වෙනුවෙන් සටන් කරන විට ජීවිත හානි දේපල හානි සිදු වන්නට බොහෝ ඉඩකඩ පවතිනා නිසා ශාක්‍ය කෝලීය දෙපිරිස රෝහිනී නදියේ ජලය වෙනුවෙන් තම අයිතීන් දිනා ගැනීම සඳහා යුද වදින්නට සැරසෙන විට බුදුරජාණන් වහන්සේ එතනට වැඩම කොට ඔවුන්ව සමගි කළේ සියල්ලටම වඩා ජීවිත වල තියන වටිනාකම පෙන්වා දෙමින් සහ සමගි සම්පන්න බවේ පවතින මහ වටිනා කම පෙන්වා දෙමින්ය.

ශ්‍රී ලාංකික සමාජය දෙස බැලීමේදී ලංකාවේ ප්‍රධාන ආගම බුද්ධාගමයි. බුදු දහමට අනුව ලංකා සමාජය  හැඩගැසී ඇත. අතීතය දෙස නැවත හැරී බැලීමේදී රටට සමාජයට යම් විපත්තියක් සමාජය දෙකඩ වීමක් සිදුවන හැම මොහොතකම බාහිර සහ අභ්‍යන්තර වශයෙන් රට ජාතිය පිරිහීමට පත්වන විට එයින් මුදවා ගැනීම සඳහා පෙරමුණ ගත්තේ බෞද්ධ භික්ෂුවයි.

රටේ පාලකයන්ට අනුශාසනා කරමින් ඔවුන් අතර පවතින අසමගිකම් දුරුකර නිවැරදි මග පෙන්වා දුන්නේ ආගමික නායකත්වය නිවැරදිව ක්‍රියාත්මක කරමින්ය. අද ද එය අඩු වැඩි වශයෙන් සිදු වුවද එම අනුශාසනාවන් පිළිගන්නා නායකයෝද අතීතයේ මෙන් වර්තමානයේ නොමැති තරම්ය. ඊට හේතුව වශයෙන් අප දකින්නේ වර්තමාන භික්ෂුව කෙරෙහි පෙර පැවති ගෞරවය හා විශ්වාසය සමාජයෙන් තරමක් දුරට ගිලිහී යෑමයි.

එයටද හේතුවක් ඇත. එනම් අද වර්තමාන භික්ෂූන් වහන්සේලාද විවිධ කණ්ඩායම් ලෙස බෙදී සිටියි. එම නිසා අසමගිව සිටින සමාජයක් සමගි කිරීමට නම් අනුශාසකයන් වන භික්ෂූන් වහන්සේලා සමගිව කටයුතු කිරීම ඉතා ප්‍රයෝජනවත්ය. භික්ෂූන් වහන්සේලාද මෙලෙස බෙදී ඇත්තේ තම පුද්ගලික පරමාර්ථ ඉටුකර ගැනීමට නොවන බවද අවධාරණය කළ යුතුය. උන්වහන්සේලා ඒ තත්වයට පත්ව ඇත්තේ රට ජාතිය ශාසනය හමුවේ පවතින ගැටළු අභියෝග පාලකයන්ට පෙන්වා දීමට හා එයට විසඳුම් ලබාගෙන රට ජාතිය ආගම සුරක්ෂිත කිරීමටය. පාලකයන් ඒවාට ඇහුම්කන් නොදෙන නිසා විවිධ ස්වරූපයෙන් තම මතය ඉදිරිපත් කිරීමට භික්ෂූන් වහන්සේලා ඉදිරිපත්ව ඇත.

මෙම භික්ෂූන් වහන්සේලාට නිවැරදි නායකත්වයක් ලැබුනහොත් සෑම භික්ෂුවක්ම සමගි කොට බුදුරජාණන් වහන්සේගේ ධර්ම විනය පමණක් අනුගමනය කරමින් රට ජාතියද ආගමද සමගි කළ හැකිය.

"සුඛා සංඝස්ස සාමග්ගිං"

යන දේශනාව පරිදි සංඝ සමගිය සංඝයාට පමණක් නොව සමස්ත සමාජයටම සුව ගෙන දෙන්නකි. රටක සමාජයක දියුණුවට බලපාන ප්‍රධානතම අංශයක් වන්නේ දේශපාලනයයි. ඕනම රටක පක්ෂ වශයෙන් බෙදී තම තමන්ගේ දේශපාලන මතය සමග පක්ෂ දේශපාලනය කිරීම සාමාන්‍ය දෙයකි. එය අප ප්‍රජාතන්ත්‍රවාදය ලෙස හඳුන්වන්නෙමු. නමුත් එම මති මතාන්තර සමග එකම රටක එකම මිනිසුන් අසමගිව ජීවත් වන්නේ නම් මොන තරම් අභාග්‍යයක්ද? එය සමාජයේ පිරිහීමයි.

අද වර්තමානයේ අපට දක්නට ලැබෙන්නේ දේශපාලන මති මතාන්තර ඔස්සේ දේශපාලකයෝ එකිනෙකාට බැන වදිමින් චෝදනා කරමින් සිටින බවක්ය. ජය ගත්තෝ සතුටකින් මෙන්ම පරාජිතයෝ වෛරය මුසුවූ දුකකින් බලය ඇති අයට අකුල් හෙලන ස්වභාවයක්ද දක්නට ලැබේ. මෙම අසමගිය එකම රටක එකම මිනිසුන් අතර නම් එම රට එම සමාජය දියුණුව කරා නොයයි. කරත්තේ බැඳි ගොනුන් දෙපැත්තට යන තාක් කරත්තය නිසි මග නොයන්නා සේ රටක් දියුණු කරන්න නම් එම රටේ පාලකයෝ ජය පරාජය සාමාන්‍ය දෙයක් සේ සලකා වෛරය පසෙකලා සහයෝගයෙන් සමගියෙන් කටයුතු කළ යුතුය.

සමාජයක් පැවැත්මට හේතුවන අධ්‍යාපන ආර්ථික ආදි අංශයන්ද මෙහෙයවනු ලබන්නේ දේශපාලඥයාය. එම නිසා එම හැම දියුණුවකටම පාලකයන් සමගිව කටයුතු කළ යුතුය.

බුදුරජාණන් වහන්සේගේ දේශනය පරිදි මිනිසුන්ගේ ජීවිත වලට කරදර ගැටුම් අඩ දබර අසමගිකම් ඇති වීමට බලපාන කාරණා වන්නේ ඡන්දා, දෝසා, භයා, මෝහා යන සතර අගතීන්ය. මෙම සතර අගතියට නොවැටී සෑම කෙනෙක්ම කටයුතු කරන්නේ නම් හැම විටම සමාජයේ සිටින මිනිසුන්ට සමගිව සමාදානයෙන් වාසය කිරීමට ඉඩකට සැලසේ.

රටක සමාජයක දියුණුව භෞතික මට්ටමින් පමණක් සිදුවීම ප්‍රමාණවත් නැත. බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම පරිදි පුද්ගලයෙක් බාහිර දියුණුව මෙන්ම අධ්‍යාත්මික දියුණුවද සලසා ගත යුතුය. අධ්‍යාත්මික සමගිය නම් රාගය, ද්වේශය, මෝහය, වෛරය, ඊර්ෂ්‍යාව වැනි අකුසල සිතුවිලි වලින් තොර මනසක් ඇති කමයි.

එම අකුසල සිතුවිලි බැහැර කර කරුණාව මෛත්‍රිය හා උපේක්ෂා සහගත චේතනාවලින් යුතුව කටයුතු කිරීමට යමෙක් හුරු වන්නේ නම් ඔහුගේ අධ්‍යාත්මීය දියුණුව ඇතිවන්නා සේම එම දියුණුව සහිත පුද්ගලයාගෙන් සිදුවන ක්‍රියාවන්ද සමාජයට අහිතකර නොවේ.

එබැවින් පළමුව තමා තුළ පවතින අධ්‍යාත්මික හා බාහිර අසමගිය පිරිහීම සකස් කර ගත යුතුය. එවිට නිරායාසයෙන්ම මුළු සමාජයම සමගි සම්පන්න සුවපත් සමාජයක් බවට පත්වේ.

ශාස්ත්‍රවේදි පූජ්‍ය කෝන්ගහවෙල සුමන හිමි